

# The SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2024



මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 ජනවාරි මස 04 වන දින සුබ මොහොතින් 17 වන සංඥා බළකාධිපති වශයෙන් රාජකාරී ආරම්භ කරන ලදී



# *The* SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2024

## කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බළකායට වසර 81 ක් සපිරෙන මේ අවස්ථාවේ වාර්ෂිකව පලකරනු ලබන "ද සිග්නලර්" **"The Signaller"** සඟරාවේ ප්‍රධාන සංස්කාරක වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි.

1998 වර්ෂයේ ආරම්භ වී වසර විසිපහක කාලයක් පුරාවට මෙම සඟරාව ක්‍රමිකව විකාශනය වෙමින් පැමිණ වර්තමානය වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු සන්නිවේදනයේ පෙරගමන්කරු වන ශ්‍රී ලංකා සංඥා බළකායේ සෑම වසරක් පුරා සිදුවුවා වු කාලීන සිදුවීම්, ලද ජයග්‍රහනයන් සහ විශේෂ පුවත් පිළිබද සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමට ලක්කෙරෙන ප්‍රධානතම මෙවලම බවටද මෙම සඟරාව පත්ව ඇත්තේ තාක්ෂණික හා නිර්මාණශීලි හැකියාවන් විදහා දක්වනු පිණිස සැමට අවස්ථාවක්ද ලබා දෙමිනි.

මෙම සඟරාව හරවත් අයුරින් සහ නිර්මාණශීලීව සිත්ගන්නාසුළු අයුරින් සකස් කර මුද්‍රණය කිරීම සඳහා මග පෙන්වූ සංඥා බළකාධිපති, සංඥා මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මෙම සඟරාව සංස්කරණය කිරීම සඳහා මා සමග දායක වු සංස්කාරක මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ටත් කාලෝචිත, නිර්මාණශීලී අදහස් හා නිර්මාණයන්ගෙන් දායක වු සැමටත් ප්‍රධාන සංස්කාරක වශයෙන් මාගේ කෘතඥතාපූර්වක ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.



**කර්නල් එම්ජ්කේ ජයවර්ධන පීඑස්සී**
ප්‍රධාන සංස්කාරක

## පෙලගැස්ම


| | |
|---|---|
| ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපතිගේ පණිවුඩය | 01 |
| සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය | 02 |
| මතක පොතින් | 03 |
| විශ්‍රාම ගැනීම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් | 59 |
| සංඥා බළකායේ විශේෂ අවස්ථාවන් | 62 |
| සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට | 64 |
| උසස්වීම් | 66 |
| පාඨමාලා | 67 |
| කෙළිබිම ජයගත්තෝ | 71 |
| උපන්දින සුබපැතුම් | 79 |
| මංගල සීනු | 81 |
| මන්දාකිණි | 83 |
| කැටපත් පවුර | 89 |
| ගෞරවණීය උපහාර | 91 |
| සංවේගයෙන් සිහිපත් කරමි | 98 |






මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත 2024 ජනවාරි මස 04 වන දින 17 වන සංඥා බළකාධිපති වශයෙන් පිරිනමන ලද සම්මාන පෙළපාලිය



සංඥා බළකාධිපති වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය

# මේජර් ජෙනරාල්
# අයිඑච්එම්ආර්කේ හේරත් යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල්

## ප්‍රධාන සංඥා නිලධාරී සහ
## සංඥා බළකාධිපතිගේ පණිවුඩය



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල, සන්නිවේදනයේ පෙරගමන්කරු ලෙස වසර 81 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ 17 වන බළකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් "The Signaller" සඟරාවේ 26 වන කලාපය වෙනුවෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යයක් ලෙස සලකමි.

නූතන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය යුද්ධ හමුදාව තුල ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරමින් පවතින කාල වකවානුවක එම ක්‍රමවේදයන්ට අනුගත වෙමින් නිවැරදිව, වේගවත්ව හා ආරක්ෂිතව කටයුතු කිරීම අප බළකායේ ප්‍රධානතම කාර්යභාරය බැව් පෙන්වා දෙමි. නවීන තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් යුද්ධ හමුදාවේ කාලීන අවශ්‍යතාවයන්ට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතයන්, සයිබර් ආරක්ෂාව සහ කෘතිම බුද්ධිය වැනි තාක්ෂණික ක්‍රමවේදයන් තුලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හා අප මාතෘභූමියට අද්විතීය මෙහෙවරක් ඉටු කරලීම අප බළකායේ ඒකායන අරමුණ වේ.

එමෙන්ම සංඥා බළකාය වෙත පවරනු ලබන රාජකාරීන් නොපිරිහෙළා ඉටු කිරීම සඳහා බළකායේ සියලුම සාමාජිකයින් දැනුමෙන් සන්නද්ධ කරමින් නවීන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණය, සයිබර් ආරක්ෂණය හා විද්‍යුත් සංග්‍රාම පිළිබඳ දැනුම පුළුල් කරීමටත්, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාව ලබාදීමටත් ඇවැසි ක්‍රියාමාර්ගයන්ද මේ වන විට ආරම්භ කර ඇති අතර එම රාජකාරීන් වඩාත් විධිමත්ව සිදුකිරීම සඳහා අප බළකාය තුල විද්‍යුත් සංග්‍රාම හා සයිබර් අරක්ෂාව වෙනුවෙන් නවතමයෙන් 2 වන සංඥා බළසේනා මූලස්ථානය ස්ථාපිත කිරීම සහ 9 ශ්‍රීලංසංබ ඒකකය විද්‍යුත් සංග්‍රාමික ඒකකයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීම සිදුකර ඇත.

මීට අමතරව සංඥා බළකායෙහි ක්‍රීඩක ක්‍රීඩිකාවන් විදහාපාන ලද දක්ෂතාවයන් හේතුවෙන් බළකායෙහි අභිමානය ඉහළ තලයකට ගෙන ඒමට හැකිවී ඇත, සංඥා බළකා සෙබල සෙබලියන්ගේ සුභසාධන කටයුතු නගා සිටුවීම සඳහා ව්‍යාපෘති කිහිපයක්ද මේවනවිට ආරම්භ කර ඇති අතර, එම සුභසාධන කාර්යයන් ඉදිරියේදී තවදුරටත් පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

තිස් වසරක යුධමය කාල වකවානුව තුල සංඥා සම්බන්ධතා සැපයීමේ කාර්යයන්හි සහ ආධාරක බළඇණියක් ලෙස අප බළකායේ අරමුණු ඉටුකරදීම සඳහා ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ප්‍රාණ දානය කැපකල සහ සටනේ දී රණක්ෂිතයට පත් සියලුම නිලධාරීන් සහ සෙසුනිලයන්ටත්, සංඥා බළකායට අවේණික රාජකාරී පමණක් නොව ක්‍රීඩාව තුලින් දෙස්/විදෙස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අභිබවා යමින් ජයග්‍රහණ රැසක් අත්කරදුන්, අප බළකායට මෙන්ම සමස්ථ යුද්ධ හමුදාවට හා මාතෘභූමියට ඉමහත් කීර්තියක් ලබාදුන් සංඥා බළකා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටද මාගේ ගෞරවය හා ආචාරය මෙහිදී පුදකර සිටිමි.

අවසාන වශයෙන් අප බළකායේ පසුගිය වසරක ගමන් මග පිළිබඳව ආපසු හැරී බැලීමට මෙන්ම අප සාමාජිකයන් දැනුවත් කිරීම හා නිර්මාණශීලී හැකියාවන් ඇති අයවලුන්ගේ කුසලතාවයන් වැඩිදියුණු කිරීමේ තෝතැන්නක් බඳු වූ මෙම "The Signaller" සඟරාව උසස් හා ආකර්ශණීය ලෙස නිර්මාණය කල සංස්කාරක මණ්ඩලයට මාගේ හද පිරි කෘතඥතාවය පලකර සිටින අතර, සංඥා බළකායේ සියලුම නිලධාරීන්, සෙසුනිලයන්, සිවිල් සේවක කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් අනාගතයක් උදා වේවායි ප්‍රාර්ථනා කරමි.

**අයිඑච්එම්ආර්කේ හේරත් යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල්**
මේජර් ජෙනරාල්
ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති



# බ්‍රිගේඩියර්
# ටී එස් ලියනගුණවර්ධන

## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය



81 වසරක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ අභිමානය පිළිබිඹු කරමින් නව තාක්ෂණික, යෙදවුම් සහ වත්මන් තොරතුරු පිළිබඳ සංඥා රෙජිමේන්තු සාමාජිකයන් දැනුවත් කිරීම මෙන්ම නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ නිර්මාණශීලි හැකියාවන් වැඩි දියුණු කිරීමේ කාර්යයට උරදෙමින්, ගෝලීය සන්නිවේදන ක්‍රමෝපායන් හා සමගාමීව සමස්ථ යුද්ධ හමුදාවේ සංනිවේදන අවශ්‍යතාවයන් පරිපූර්ණ කරීම උදෙසා කැපවීමෙන් කටයුතු කරන සංඥා බළකායේ නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් “The Signaller” සඟරාවේ 26 වන කලාපය එළිදක්වන මේ අවස්ථාවේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

2024 වර්ෂයේදී සංඥා බළකා සෙනීන්ගේ වෘතීය නිපුණත්වය ඉහල නැංවීම සඳහා දැනුමින් සන්නද්ධ කිරීම වෙනුවෙන් වන සැලසුම් රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් අනාගත සන්නිවේදන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ හැකියාව වර්ධනය කරගනු ඇතැයි මා විශ්වාස කරමි. තවද බලකායේ සියලු නිලයන්ගේ ක්‍රීඩා දක්ෂතාවයන් වර්ධනය කිරීමට සහ යටිතල පහසුකම් වඩාත් උසස් අයුරින් ලබා දීම සඳහා සංවර්ධන ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇති බව ප්‍රකාශ කරනුයේ හද පිරි සතුටිනි.

“The Signaller” සඟරාව තුලින්, සංඥා බළකාය තුල 30 වසරක යුධ සමයේ ලද වෘතීය අත්දැකීම් සමුදාය අනාගත සන්නිවේදන තාක්ෂණික දැනුම සමඟ යාවත්කාලීනවීමත්, සංඥා සෙබල සෙබලියන්ගේ දැනුම හා නිර්මාණකරණයේ හැකියාව මෙන්ම කියවීමේ පුරුද්ද හා සාහිත්‍යමය හැකියාවන්ද වර්ධනය වන බව නොරහසකි. බළකාය තුල විෂයානුබද්ධ දැනුම බෙදාහදා ගැනීම, වෘත්තීය නිපුනත්වය සහ ක්‍රීඩා කෞශල්‍ය තුලින් අත්පත් කර ගන්නා ලද ජයග්‍රහණ එළි දැක්වීමට වඩාත්ම උචිත ප්‍රකාශණය වන “The Signaller” සඟරාව අඛණ්ඩව 26 වන වරටත් ඉදිරිපත් කිරීමට හැකිවීම සමස්ථ සංඥා බළකායේ සියලු සාමාජිකයින් විසින් ලද විශිෂ්ඨ ජයග්‍රහණයක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

සඟරාව නිර්මාණය කිරීම වෙනුවෙන් ලිපි, ඡායාරූප සහ තොරතුරු සැපයූ සංඥා බළකායේ සියලු සාමාජික සාමාජිකාවන්ට සහ සංඥා බළකාය තුල වසරක ගමන් මග නිර්මාණශීලීව ගුණාත්මක භාවයෙන් යුක්තව එළි දැක්වීම සඳහා ඇප කැපවී කටයුතු කල මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩලයට මාගේ කෘතඥතාවය පුදකරන අතර, සංඥා බළකා සියලු සාමාජිකයින්ටත්, ඔවුන්ගේ පවුල්වල සියලු දෙනාටත් සුභ අනාගතයක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**ටීඑස් ලියනගුණවර්ධන**
බ්‍රිගේඩියර්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක

# මතක පොතින්

# ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය

මේජර් ජෙනරාල්
අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල්



## ප්‍රධාන සංඥා නිලධාරී

යුද්ධ හමුදාවේ සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒ සබැඳි සමස්ත වගකීම් ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරිව 2007 මාර්තු මස 12 වන දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය ලෙස මෙම කාර්යාලය පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුළ ස්ථාපනය කරන ලදී. අනතුරුව නව යුද්ධ හමුදා මූලස්ථාන සංකීර්ණය තුළ ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය 2019 නොවැම්බර් මස 29 වන දින ස්ථාන ගතවිය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විකාශනය හා අනාගත වෙනස්කම්වලට උචිත වන පරිදි 2020 ජූලි මස 20 දින සිට ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය, "ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය" වශයෙන් ප්‍රතිස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ අණ, පාලනය සහ පරිපාලනය සඳහා අවශ්‍ය වන සියලුම සන්නිවේදන, පරිගණක තොරතුරු තාක්ෂණ, විද්‍යුත් සංග්‍රාමික සහ සයිබර් ආරක්ෂණ යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරීම, ඒ සඳහා කටයුතු සම්පාදනය කිරීම සහ ආරක්ෂක අමාත්‍යාංශය හා යුද්ධ හමුදාධිපති විසින් ලබාදෙනු ලබන උපදෙස් අනුව සියලුම සන්නිවේදන, පරිගණක තොරතුරු තාක්ෂණ, විද්‍යුත් සංග්‍රාමික සහ සයිබර් ආරක්ෂණ යන ක්ෂේත්‍රයන් හි වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම් සිදුකිරීම ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ ප්‍රධාන වගකීම් වේ. ඒ අනුව යුද්ධ හමුදාවේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණය, විද්‍යුත් සංග්‍රාමික හා සයිබර් ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් වූ සමස්ත වගකීම ප්‍රධාන සංඥා නිලධාරී විසින් දරණු ලබන අතර, එම සමස්ත ක්‍රියාවලීන් සබැඳි උපදෙස් යුද්ධ හමුදාධිපති තුමන් වෙත ලබාදීමේ කාර්යභාරයද ප්‍රධාන සංඥා නිලධාරී විසින් ඉටු කරනු ලබයි.

ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය ආරම්භයේ සිට මේ දක්වා ප්‍රධාන සංඥා නිලධාරී තනතුරෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එකොලොස් දෙනෙකු රාජකාරී ඉටුකර ඇති අතර, සමස්ත යුද්ධ හමුදාවට මෙන්ම අනෙකුත් සන්නද්ධ සේවා හා සන්නිවේදන ක්ෂේත්‍රයේ රාජ්‍යය ආයතනයන්හි සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් ඔවුන් විසින් මහගු හා අද්විතීය සේවාවක් ඉටු කර ඇත. 2023 මාර්තු මස 01 දින සිට 2023 දෙසැම්බර් මස 29 දින දක්වා ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩියු ජ්‍යෙෂ්ඨ නිලධාරී රාජකාරී ඉටු කළ අතර, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම යාමෙන් අනතුරුව මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් යන ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රධාන සංඥා නිලධාරී වශයෙන් 2023 දෙසැම්බර් මස 29 දින සිට එම ධුරයේ රාජකාරී ආරම්භ කරන ලදී.

යුද්ධ හමුදාව යථායෝග්‍ය ප්‍රමාණකරණය යටතේ යුද්ධ හමුදාධිපති තුමාගේ අනුමැතිය මත 2 වන සංඥා බළසේනා මූලස්ථානය ස්ථාපිත කිරීම මෙන්ම 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විද්‍යුත් සංග්‍රාමික ඒකකයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කිරීමද මෙම කාර්යාලයේ උපදෙස් හා මග පෙන්වීම මත ශ්‍රී ලංකා සංඥා බළකායේ ඉදිරි ප්‍රගමනය හා අභිවෘද්ධිය වෙනුවෙන් ඉටුකරන ලද මාහැඟි කාර්යභාරයන් බව සඳහන් කළ යුතුය. ඒ අනුව 2 සංඥා බළසේනා මූලස්ථානය ස්ථාපනය කරීම යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ප්‍රධානත්වයෙන් 2023 දෙසැම්බර් මස 29 දින සංඥාරෙම පරිශ්‍රයේදී අභිනවයෙන් ස්ථාපනය කිරීම මෙම කාර්යාලයේ මූලිකත්වයෙන් ඉටු කරන ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සයිබර් ආරක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ ඉල්ලීම මත ඉන්දියානු යුද්ධ හමුදාව හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අතර, පැවති 9 වන මාණ්ඩලික සාකච්ඡාවේදී ගන්නා ලද තීරණයකට අනුව ඉන්දීය යුද්ධ හමුදාවේ උපදේශක කණ්ඩායමක් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අධීක්ෂණය යටතේ ත්‍රිවිධ හමුදා නිලධාරීන්/සෙසු නිලයින් හට සයිබර් ආරක්ෂණ පුහුණු වැඩමුළුවක් 2023 ඔක්තෝබර් මස 16 වන දින සිට 2023 නොවැම්බර් මස 12 වන දින දක්වා මෙම කාර්යාල මූලිකත්වය යටතේ රෙම ශ්‍රීලංසංබ හි දී පැවැත්වීමට කටයුතු කරන ලද අතර, එම වැඩමුළුවේ ප්‍රායෝගික පුහුණුවීම් රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය පනාගොඩ හි දී පවත්වන ලදී.

දැනට සක්‍රීය සේවයේ නියුතු/විශ්‍රාමික රණවිරුවන්ගේ මෙන්ම යුද්ධයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ පවුල්වල දූ දරුවන් සහ සිවිල් දූ දරුවන්ගේ පරිගණක තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ අභිලාෂයෙන් පිහිටුවා ඇති රණවිරු තොරතුරු තාක්ෂණ ආයතනයන් ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාල අධීක්ෂණය යටතේ සාර්ථකව පවත්වාගෙන යනු ලබන අතර, රණවිරුවන්ගේ මෙන්ම ඔවුන්ගේ දූ දරුවන්ගේ සුභසාධනය මූලිකත්වය කර ගනිමින් සහනදායී ගාස්තු යටතේ පරිගණක පාඨමාලාවන් පැවැත්වීම සිදුකරනු ලබයි. ආරක්ෂක සේනා මූලස්ථාන ආවරණය කරමින් ආරම්භ කරන ලද රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතන 07 ක් දැනට ක්‍රියාත්මක වන අතර, 2023 වර්ෂයේ ඔක්තෝබර් මස සිට මේ දක්වා රණවිරුවන් 396 දෙනෙකුට සහ සිවිල් අයවළුන් 313 දෙනෙකුට තොරතුරු තාක්ෂණ පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසා දී ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යථායෝග්‍ය ප්‍රමාණකරණ ක්‍රියාවලියට සමගාමීව සිදුකරනු ලබන Land Force Defence Review 2030 සැලසුම් සකස් කිරීම සඳහා ලබාදී ඇති මාර්ගෝපදේශනයන්ට අනුකූලව ශ්‍රී ලංකා සංඥා බළකායේ අනාගත ව්‍යුහය සැලසුම් හා නව්‍යකරණ අවශ්‍යතා සකස් කිරීමේ ක්‍රියාවලිය උදෙසා මෙම කාර්යාල මූලිකත්වයෙන් යෝජනා සකස් කොට ඉදිරිපත් කිරීම ද ගතවූ වර්ෂය තුළ සිදුකරන ලද අතර, එම සැලසුම්වලට අනුගතව සන්නිවේදන, තොරතුරු තාක්ෂණ, විද්‍යුත් සංග්‍රාමික හා සයිබර් ආරක්ෂණ අවකාශයන් තුළ ශ්‍රී ලංකා සංඥා බළකාය නව මානයන් කරා රැගෙන යාමේ ඒකායන අභිප්‍රායෙන් දැනුමින් හා කුසලතාවයෙන් සන්නද්ධව කටයුතු කළ යුතු බැව් මේ මොහොතේ සිහිපත් කළ යුතුය.













මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 ජනවාරි මස 03 දින ප්‍රධාන සංඥා නිලධාරී තනතුරේ රාජකාරි නිල වශයෙන් භාරගත් අවස්ථාව



මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රධාන සංඥා නිලධාරී කාර්යය මණ්ඩලය සමග





2 සංඥා බළසේනා මුලස්ථානය 2023 දෙසැම්බර් මස 29 දින යුද්ධ හමුදාධිපති තුමන් අතින් සංඥාරෙම පරිශ්‍රයේදී උත්සවාකාරයෙන් විවෘත කිරීම





2024 මැයි මස 16 වන දින රෙම ශ්‍රීලංසංබගි ප්‍රසංනි ප්‍රධානත්වයෙන් පැවති අණදෙන නිලධාරීන්ගේ සාකච්ඡාව





කර්නල් ඊඑන්පී ගුණවර්ධන යුඑස්පී ජ්‍යෂ්ඨ නිලධාරී 2023 නොවැම්බර් මස 23 වන දින කර්නල් සම්බන්ධීකරණ තනතුරේ රාජකාරී භාර ගැනීම





ලුතිතන් කර්නල් යූඑල්සීඩී පෙරේරා පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ප්‍රමානි 1 (සයිබර් හා විද්‍යුත් සංග්‍රාමික) ලෙස 2024 මැයි මස 09 වන දින වැඩ භාර ගැනීම



ලුතිතන් කර්නල් එච්එම්බීඑම්බී හේරත් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී කා:නි කර්නල් (සැලසුම්) ලෙස 2024 අගෝස්තු මස 21 වන දින වැඩ භාර ගැනීම




බලලත් නිලධාරී 1 ජේඑම්එන්ජේ ජයලත් යූඑස්පී විසින් ප්‍රධාන ලිපිකරු ලෙස 2024 අගෝස්තු මස 12 වන දින වැඩ භාර ගැනීම



2023 ඔක්තෝබර් මස 16 දින සිට 2023 නොවැම්බර් 12 දින දක්වා පැවැත්වූ සයිබර් ආරක්ෂණ පුහුණු වැඩමුළුවේ ආරම්භක දේශනය



සයිබර් ආරක්ෂණ පුහුණු වැඩමුළුවේදී ඉන්දියානු උපදේශකයින් විසින් ප්‍රායෝගික පුහුණුව ලබාදීම






සයිබර් ආරක්ෂණ පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන්/සෙසු නිලයන්

ඉන්දියානු උපදේශකයින් වෙත ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේදී සමරු තිළිණ ප්‍රදානය කිරීම





රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය (පනාගොඩ) හි දී පරිගණක නිපුණතා බලපත්‍ර පාඨමාලා අංක 53 පරිගණක පාඨමාලාව සඳහා සහභාගි වූ සිවිල් සිසු සිසුවියන්





රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය (පනාගොඩ) හි දී පරිගණක නිපුණතා බලපත්‍ර පාඨමාලා අංක 54 පරිගණක පාඨමාලාව සඳහා සහභාගි වූ සිවිල් සිසු සිසුවියන්

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

බ්‍රිගේඩියර්
එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී



## අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ අංශයෙහි අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබන අතර, වර්ෂ 2010 මාර්තු මස 01 වන දින ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ ආරම්භ කරන ලද තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල මෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ජාතික අවශ්‍යතා සඳහාද අවශ්‍යතාවය පරිදි මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි නිර්මාණය සහ පරිගණක ජාල විසඳුම් සැලසුම් කිරීම, නිපදවීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සිදුකරනු ලබයි. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෘදුකාංග සංවර්ධන හා ඉංජිනේරු මධ්‍යස්ථානය, දත්ත මධ්‍යස්ථාන (යුහමු), දත්ත මධ්‍යස්ථානය (පනාගොඩ), වෙබ් අඩවි සංවර්ධන මධ්‍යස්ථානය සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යන අංශයන්ගෙන් වර්තමාන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඒකකය වශයෙන් ස්ථාපනය කරන ලද 11 ශ්‍රීලංසංබ ඒකකය යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රමුඛ ආරක්ෂක සේනා මූලස්ථාන, පාබල සේනාංක මූලස්ථාන, පාබල සේනාංක, බළසේනා මූලස්ථාන, ඒකක, පුහුණු පාසල් හා අනෙකුත් ස්වාධීන මූලස්ථාන/ආයතන ආවරණය කරමින් මේ වන විට සමස්ථ යුද්ධ හමුදාවේම ජාලකරණ කටයුතු ද සීසීටීවී සවි කිරීම සහ විශේෂ අවස්ථාවන් සඳහා Live Screen ලබාදීම ද සිදු කරයි.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට අනියුක්තව රාජකාරී ඉටුකරනු ලබන මෘදුකාංග ඉංජිනේරුවරුන්, ජාලකරණ ඉංජිනේරුවරුන්, මෘදුකාංග තත්ව පරීක්ෂක ඉංජිනේරුවරුන්, දෘඩාංග ඉංජිනේරුවරුන්, හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් මෙන්ම පරිගණක ක්‍රියාකරුවන් සහ පරිගණක කාර්මිකයින් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහිම තොරතුරු තාක්ෂණ අංශයේ අභිවෘද්ධිය සඳහා වු විවිධ ව්‍යාපෘති සහ එම විෂය සම්බන්ධව විවිධ වු තොරතුරු තාක්ෂණ රාජකාරීන්වල නිරතව සිටින අතර, එම සියලුම ව්‍යාපෘතීන් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සෘජු අධීක්ෂණය යටතේ ඉටුකරනු ලබයි.

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් 2023/2024 වර්ෂය වෙනුවෙන් සමස්ථ යුද්ධ හමුදා ආයතනයන්හි ප්‍රයෝජනය පිණිස විශේෂිත මෘදුකාංග පද්ධති 37 ක් නිර්මාණය කර ඔවුන් වෙත ලබාදී ඇත.

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ භාරගැනීම

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 10 වන තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මාර්තු මස 27 වන දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කරන ලදී.





තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කල අවස්ථාව

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සිය නවතම යෙදවුම 'Finger Swift 2023'

ශීඝ්‍රයෙන් දියුණු වන සයිබර් තාක්ෂණය සහ විවිධ යෙදවුම් පිළිබඳ තොරතුරු දැනගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සිය නවතම යෙදවුම 'Finger Swift 2023' වැඩසටහන මගින් යුද්ධ හමුදා මූලස්ථානයේදී 2023 දෙසැම්බර් මස 22 දින එළිදක්වන ලදී. මේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු සහභාගී විය. මේ උත්සව අවස්ථාවේදී ආරාධිත දේශකයා වශයෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනයේ **(FITIS)** සභාපති ඉන්දික ද සොයිසා මහතා විසින් 'Digiecon 2030' ට අනුරූප වන රටේ තොරතුරු තාක්ෂණ මාර්ග සිතියම හඳුන්වාදෙන ලදී.





'Finger Swift 2023' වැඩසටහන මගින් යුද්ධ හමුදා මූලස්ථානයේදී 2023 දෙසැම්බර් මස 22 දින එළිදක්වන උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සපැමිණි ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු



ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනයේ **(FITIS)** සභාපති ඉන්දික ද සොයිසා මහතා



යුද්ධ හමුදාධිපතිතුමන් සමග ගත් සමූහ ඡායාරූපය

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය නවතමයෙන් නිර්මාණය කරන ලද මෘදුකාංගයක් 'My Reservation'

යුද්ධ හමුදාවේ සේවයේ නියුතු සියලු නිලයන් සඳහා යුද්ධ හමුදා නිවාඩු බංගලා වෙන්කරවා ගැනීම සඳහා 'e-Portal' යෙදුම හරහා ප්‍රවේශ විය හැකි නවතමයෙන් නිර්මාණය කරන ලද මෘදුකාංගයක් My Reservation තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද අතර, 2024 අප්‍රේල් මස 20 වන දින අදාල යෙදුම යුද්ධ හමුදාධිපති තුමාගේ සුරතින් විවෘත කරන ලදී.





නවතමයෙන් නිර්මාණය කරන ලද මෘදුකාංගය 'My Reservation' යෙදුම යුද්ධ හමුදාධිපති තුමාගේ සුරතින් විවෘත වූ අවස්ථාව

## අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලිකගේ නිරීක්ෂණ සංචාරය

අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික වශයෙන් රාජකාරී භාරගන්නා ලද මේජර් ජෙනරාල් එස්එන්ඩී එදිරිසිංහ ආර්ඩබ්පී ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මැයි මස13 දින තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා දත්ත මධ්‍යස්ථානය (යුහමු) හි නිරීක්ෂණ සංචාරයක නිරතවිය.




අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්එන්ඩී එදිරිසිංහ ආර්ඩබ්පී ආර්එස්පී එච්ඩීඑම්සී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ නිරීක්ෂණ සංචාරයේ අවස්ථා

## තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 14 වන සංවත්සරය සැමරීම

තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ 14 වන සංවත්සරයට සමගාමීව එවකට අධ්‍යක්ෂ ලෙස කටයුතුකල බ්‍රිගේඩියර් එච්ඩීජේපී වීරතුංග ඇතුළු සියලුම තොරතුරු තාක්ෂණ නිළධාරීන්ගේ සහ සෙසුනිළයින්ගේ සහභාගීත්වයෙන් කුකුළේගඟ ලයා ලෙෂර් හි සියලු නිළ සුහද හමුවක් පවත්වන ලදී.




තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සහ සෙසුනිළයින් 14 වන සංවත්සරය සමරමින්

## සමස්ථ යුද්ධ හමුදාවේම ප්‍රයෝජනය සඳහා මෙන්ම ජාතික අවශ්‍යතා සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නවතමයෙන් සංවර්ධනය කරන ලද මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ පද්ධති

| අ.අ | මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ පද්ධති |
|---|---|
| 01 | Weapon & Ammunition Information Management System |
| 02 | Residence Reservation System |
| 03 | Fuel Management System / Mobile App |
| 04 | AHQ Entrance Authority Management System |
| 05 | Army Digital Corresponding Platform |
| 06 | Veterans Job Bank |
| 07 | Ration Stores Management System |
| 08 | Army Health Information System |
| 09 | Human Resource Management System - Civil Servants |
| 10 | Weapons and Troops Transport Authority Management System |

# 1 සංඥා බළසේනා මුලස්ථානය



බ්‍රිගේඩියර්
පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී

1 සංඥා බළසේනාධිපති

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඇවැසි සංනිවේදන අවශ්‍යතා නව තාක්ෂණයෙන් යුතුව ඉතා උසස් මට්ටමින් ඉටු කිරීමේ භාරදූර වගකීම 1 සංඥා බළසේනා මුලස්ථානය වෙත පැවරී ඇත.

සංඥා සම්බන්ධතාවය ඉතා උසස් මට්ටමින් පවත්වා ගැනීම සඳහා ආරක්ෂක සේනා මූලස්ථාන හා සියලුම පාබල සේනාංක මූලස්ථාන ආවරණය වන පරිදි උසස් තාක්ෂණික ක්‍රමවේදයකට අනුව යුද්ධ හමුදාවේ ඉදිරි ප්‍රගමනය උදෙසා IP තාක්ෂණයෙන් යුත් දුරකථන හුවමාරු පද්ධති ඇතුළු නව දුරකථන හුවමාරු පද්ධති ස්ථාපනය කර ඇත. එමෙන්ම චීන සමූහාණ්ඩුවෙන් ප්‍රධානයක් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට නවතමයෙන් ලබාදුන් "හයිටෙරා" ගුවන් විදුලි යන්ත්‍ර හා සංඥා උපකරණ සංඥා බළකාය වෙත ලැබීමෙන් අනතුරුව එම ගුවන් විදුලි යන්ත්‍ර හා සංඥා උපකරණ යොදා ගනිමින් 1 බළකාය, ආසේමු(යා), ආසේමු(වන්නි), ආසේමු(නැ), ආසේමු(බටහිර) හා ආසේමු(මධ්‍යම) යන බළප්‍රදේශයන් ආවරණය වන පරිදි යුද්ධ හමුදාධිපති අණ ගුවන් විදුලි ජාලය, පාබල සේනාංක හා පාබල බළසේනා මූලස්ථාන දක්වා ස්ථාපිත කර ව්‍යාප්ත කරන ලදී.

සංඥා බළකායේ සංස්ථාවන් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ 2 සංඥා බළසේනාව ආරම්භ වීමත් සමග, ප්‍රධාන සංඥා නිළධාරීගේ මග පෙන්වීම යටතේ මෙම බළසේනාව 1 සංඥා බළසේනාව වශයෙන් තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය (ICT) රාජකාරීන් ද ඇතුලත්ව කොස්ගම යුද්ධ හමුදා කඳවුරු භූමියෙහි නවතමයෙන් ස්ථාපිතව සංඥා ඒකකයන්හි සංඥා සම්බන්ධතාවයන් මෙහෙයවනු ලබයි. මිත්‍රශක්ති යුධ අභ්‍යාසය සඳහා ගුවන් විදුලි යන්ත්‍ර/සංඥා උපකරණ හා ක්‍රියාකරුවන්ගේ සේවාව සැපයීම, අණ හා මාණ්ඩලික විද්‍යාලය සහ සාමේපුපා- කුකුලේගඟ වෙතින් දේශිය හා විදේශිය සෙබළුන් හට පවත්වනු ලබන විශේෂ යුධ අභ්‍යාසයන් සඳහා සංඥා බළකාය වෙතින් ගුවන් විදුලි යන්ත්‍ර/සංඥා උපකරණ, ජන ඇමතුම් උපකරණ සහ ක්‍රියාකරුවන්ගේ සේවාව සැපයීම මෙන්ම ස්වාභාවික විපත් වලදී යුද්ධ හමුදාව වෙතින් දක්වන දායකත්වය යටතේ ඊට අදාලව සංඥා සම්බන්ධතාවය අඛණ්ඩව පවත්වාගෙන යාම මෙම බළසේනාවේ අධීක්ෂණය යටතේ සිදුකරණ ලදී.

යුද්ධ හමුදාවේ සංනිවේදනයේ පෙර ගමන්කරු වන සංඥා බළකාය වෙත පැවරෙන රාජකාරීන් යුධ සමයෙහි ලෙසම වර්තමානයේ බහුල වී ඇත. මුළු දිවයිනම ආවරණය වන පරිදි දෙස් විදෙස් ප්‍රභූ වරුන් සහභාගි වන ජාතික සහ යුද්ධ හමුදා විශේෂ උත්සව අවස්ථාවන් වෙනුවෙන් ජන ඇමතුම් හා **LED** තිර පද්ධති සේවාව ලබාදීම, දිවයිනම ආවරණය වන පරිදි නව දුරකථන හුවමාරු සවි කිරීම හා සන්නිවේදන හා දත්ත ජාල පුළුල් කිරීම මෙන්ම ගුවන් විදුලි/දුරකථන හුවමාරු ආදි සංඥා උපකරණ අලුත් වැඩියා කටයුතු සිදු කරමින් සංඥා සම්බන්ධතාවයන් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම හා විදේශිය සංඥා උපකරණ පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම වැනි කාර්යන් 1 සංඥා බළසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

76 වන නිදහස් දින පෙළපාලිය වෙනුවෙන් සංඥා සම්බන්ධතාවය ලබාදීම සඳහා ඇවැසි සංඥා උපකරණ/උපාංග ලබාදෙමින් මෙම බසේමු අධීක්ෂණය යටතේ සංඥා ඒකකයන් සමග එක්ව සාර්ථකව නිදහස් දින පෙළපාලිය සඳහා සංඥා සම්බන්ධතාවයන් ලබා දීමට හැකියාව ලැබී ඇත.

මෙම බළසේනාවේ 36 වන සංවත්සර දිනය 2024 ජුනි මස 01 වන දිනට යෙදී තිබු අතර, එය යුද්ධ හමුදා සම්ප්‍රදායානුකූලව අභිමානවත් අයුරින් පැවැත්වු අතර, නිළධාරීන්/සෙසුනිලයින්ගේ සුභදත්වය වර්ධනය කිරීම වෙනුවෙන් වැඩසටහන් මාලාවක් සාර්ථකව පවත්වන ලදී.

එලෙස ගෙවී ගිය කාලය තුල සංඥා සම්බන්ධතාවය ලබාදීමේ කාර්ය වැඩි දියුණු කිරීමටත් රාජ්‍ය හා හමුදා විශේෂ උත්සව කටයුතු සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදිමට 1 සංඥා බළසේනාවට හැකියාව ලැබී ඇත.





1 සංඥා බළසේනාවේ 26 වන බළසේනාධිපති හට පිරිනමන ලද කඳවුරු මුරය හා තනතුරෙහි වැඩ භාරගැනීමට ප්‍රථම ආගමික වතාවත් සිදුකිරීම



26 වන බළසේනාධිපති වශයෙන් කර්නල් පීඩබ්එම්එම්ඩී විජේරත්න ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරි 1 සංඥා බළසේනාධිපති තනතුරෙහි වැඩ භාරගැනීමැනීම



1 සංඥා බළසේනාවේ 14 වන බළසේනා මේජර් වශයෙන් මේජර් එල්ඩීජේඩී ජයසේකර ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිළධාරි සුභ මොහොතින් රාජකාරි ආරම්භ කල අවස්ථාව






1 සංඥා බළසේනාවේ 36 වන සංවත්සරය සමගාමීව බළසේනාධිපති විසින් බළසේනාවේ නාමපුවරුව විවෘත කිරීම, ජාතික ධජය හා බළසේනාවේ ධජය ඉහල ඔසවන අවස්ථාව





1 සංඥා බළසේනාවේ 36 වන සංවත්සරයට සමගාමීව බළසේනාධිපති විසින් පැලයක් රෝපණය කිරීම සහ පවත්වන ලද සියලු නිළ තේපැන් සංග්‍රහය



1 සංඥා බළසේනාවේ 36 වන සංවත්සරයට සමගාමීව සුහද හමුවේදී ලබා ගන්නා ලද සමුහ ජායාරූපය

# 2 සංඥා බළසේනා මුලස්ථානය

**(බල ප්‍රවර්ධන හා ප්‍රක්ෂේපණ නියාමන)**

බ්‍රිගේඩියර්
වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී



## 2 සංඥා බළසේනාධිපති

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ආකාරයේ සංග්‍රාමික හා සංග්‍රාමික නොවන ක්‍රියාන්විත සඳහා අවශ්‍ය විද්‍යුත් සංග්‍රාමික හා සයිබර් ආරක්ෂණ අරමුණු කර ගනිමින් 2023 ඔක්තෝබර් මස 30 වන දින 2 සංඥා බළසේනා මුලස්ථානය (බල ප්‍රවර්ධන හා ප්‍රක්ෂේපණ නියාමන) 2 SIGNAL BRIGADE (FORCE MULTIPLICATION AND PROJECTION) සංඥා බළකා පවුලේ මෙන්ම යුද්ධ හමුදාවේ නවතම බළසේනාවක් ලෙස නගා සිටුවන ලදී.

ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ පාලනය වන 2 සංඥා බළසේනා මුලස්ථානය පනාගොඩ, ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී 2023 දෙසැම්බර් මස 04 වන දින ප්‍රථම බළසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් ඒකේඩී අධිකාරී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී යටතේ ස්ථාපනය කරන ලදී. 2024 මාර්තු මස 13 වන දින මෙම බළසේනාවේ නව බළසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී පත්වීම් ලැබූ අතර, එම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ මෙම බළසේනා මුලස්ථානය වෙත පැවරී ඇති සයිබර් ආරක්ෂණ හා විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන් මනා ලෙස ඉටු කරනු ලබයි.



නව බළසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මාර්තු මස 13 වන දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කිරීම



2 සංඥා බළසේනාවේ ප්‍රථම බළසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් ඒකේඩී අධිකාරී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කිරීම



2 සංඥා බළසේනා මුලස්ථානයේ ආරම්භක කාර්යය මණ්ඩලය





ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපතිතුමා විසින් චීන සමුහාණ්ඩුව වෙතින් පරිත්‍යාග කල අධි තාක්ෂණික සන්නිවේදන රථ නිරීක්ෂණය කිරීම





විද්‍යුත් සංග්‍රාමික කටයුතු සඳහා ලැබුණු අධි තාක්ෂණ සන්නිවේදන රථ පිළිබඳව චීන තාක්ෂණික නියෝජිතයින් පැවැත්වූ පුහුණු වැඩමුලුව හා සංඥා බළකාධිපති හමුවූ අවස්ථාව



HUAWEI සමාගම් නියෝජිතයින් විසින් eLTE තාක්ෂණික පද්ධතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳව දැනුවත් කිරීමේ අවස්ථාව



ප්‍රථම ප්‍රමානි 1 (ක්‍රියා/සම්) වශයෙන් ලුතිතන් කර්නල් එල්එන්පී ලියනගේ ජ්‍යෙෂ්ඨ නිලධාරී සුබ මොහොතින් රාජකාරී ආරම්භ කිරීම



2 සංඥා බළසේනා මූලස්ථානය 5 ශ්‍රීලංසංබ කඳවුරු භූමියේ 2024 අප්‍රේල් මස 26 දින ස්ථාපනය කිරීම



2 සංඥා බළසේනාධිපතිගේ සංකල්පයකට අනුව පැවැති සුහද හමුවේ විශේෂ අවස්ථා

# සංඥා බළකායට නවතමයෙන් එක්වූ 2 සංඥා බළසේනාවේ (බල ප්‍රවර්ධන සහ ප්‍රක්ෂේපණ නියාමන) ආරම්භය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ආකාරයේ සංග්‍රාමික සහ සංග්‍රාමික නොවන ක්‍රියාන්විතයන් සඳහා අවශ්‍ය විද්‍යුත් සංග්‍රාමික, සයිබර් ආරක්ෂණ සහ කෘතිම බුද්ධි ක්‍රියාන්විතයන් හි ඵලදායි දායකත්වය සැළසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ වෙනුවෙන් සිදුකරනු ලබන ක්‍රියාන්විත වෙනුවෙන් තොරතුරු තාක්ෂණ ක්‍රියාන්විත සිදුකිරීම සහ දායකත්වය ලබා දීම යන කාර්ය්‍ය භාරයන් ඉටුකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බිහිවූ නවතම බළසේනාව වනුයේ 2 සංඥා බළසේනාව (බල ප්‍රවර්ධන සහ ප්‍රක්ෂේපණ නියාමන) යි.

හමුදා චර්යා නියෝග 93/2023 යටතේ 2023 ඔක්තෝබර් මස 30 වන දින නගා සිටුවන ලද මෙම බළසේනාව ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී 2023 දෙසැම්බර් මස 04 වන දින ප්‍රථම බළසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් එකේඩී අධිකාරි යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී යටතේ මූලිකව ස්ථාපනය කල අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති විසින් 2023 දෙසැම්බර් මස 29 වන දින ශ්‍රී ලංකා සංඥා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී මෙම බළසේනා මූලස්ථානයේ සමාරම්භය නිල වශයෙන් සනිටුහන් කරන ලදී. 2024 මාර්තු මස 13 දින සිට වත්මන් බළසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීතුමන් කටයුතු සිදුකරනු ලබයි. 2 සංඥා බසේමු හි මෙම සියලු ක්‍රියාකාරකම් 2 සංඥා බළසේනාධිපති ගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, 2024 අප්‍රේල් මස 26 වන දින මෙම බළසේනා මූළස්ථානය 5 ශ්‍රීලංසංබ කඳවුරු පරිශ්‍රය පිහිටා ඇති මෙනේරිගම, පාදුක්ක භූමිය තුල ප්‍රතිස්ථාපනය කර ඇත. මෙම බළසේනාව යටතේ 9 ශ්‍රීලංසංබ (විද්‍යුත් සංග්‍රාමික) සහ 12 ශ්‍රීලංසංබ (සයිබර් ආරක්ෂණ) යන ඒකකයන් පාලනය සිදු කරනු ලබන අතර, මෙම 2 සංඥා බළසේනාව ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය යටතේ පාලනය වේ.



ප්‍රථම 2 සංඥා බළසේනාධිපති වශයෙන් බ්‍රිගේඩියර් ඒකේඩී අධිකාරි යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් බළසේනාවේ ආරම්භය 2023 දෙසැම්බර් මස 04 දින සනිටුහන් කිරීම


ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති තුමන් විසින් 2 සංඥා බළසේනා මූලස්ථානය වෙත 2023 දෙසැම්බර් මස 29 දින පැමිණීම සනිටුහන් කිරීමේ අවස්ථාව




විද්‍යුත් සංග්‍රාමික රාජකාරීන් සඳහා භාවිතා කරන 2 සංඥා බළසේනාව සතු අධි තාක්ෂණික සන්නිවේදන රථ

## 2 සංඥා බළසේනාවට පැවරී ඇති කාර්යයන්

- ශක්තිමත් ස්ථාවර සහ විශ්වාසනීය සයිබර් ආරක්ෂණ පද්ධතියක් මගින් යුද්ධ හමුදා ඩිජිටල් කරණය බල ගැන්වීම සහ සයිබර් පරාසය තුලින් ඇතිවිය හැකි සයිබර් තර්ජනයන් තුලින් ඇතිවිය හැකි හානි අවම කිරීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල තොරතුරු ආරක්ෂණය, දත්ත ආරක්ෂණය, තොරතුරු හුවමාරු කිරීම සහ සයිබර් ආරක්ෂණ ක්‍රමෝපායන්, ප්‍රමිතීන් සහ නිර්ණායක සම්පාදනය කිරීම සහ පිහිටුවීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ක්‍රියාත්මක කරනු ලබන සියලුම ආකාරයේ සංග්‍රාමික සහ සංග්‍රාමික නොවන ක්‍රියාන්විත වෙනුවෙන් අවශ්‍ය සයිබර් සහ විද්‍යුත් චුම්බක පරාසය භාවිතයන් ඵලදායී ලෙස යෙදවීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ක්ෂේත්‍ර මූලස්ථානයන් මගින් සිදුකරනු ලබන සංග්‍රාමික සහ සංග්‍රාමික නොවන ක්‍රියාන්විතයන් වෙනුවෙන් අවශ්‍ය විද්‍යුත් සංග්‍රාමික කාර්යභාරයන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ස්ථාපිත විද්‍යුත් පද්ධතින්, ජාල සහ තොරතුරු පද්ධතීන් වෙත බාහිරින් සහ අභ්‍යන්තරව ඇතිවිය හැකි තර්ජන වලින් ආරක්ෂාව ලබාදීම.

- සයිබර් සහ විද්‍යුත් සංග්‍රාමික තර්ජනයන් මැඩ පවත්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම.

- ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් ක්‍රියාත්මක කරනු ලබන සංග්‍රාමික සහ සංග්‍රාමික නොවන ක්‍රියාන්විතයන් සඳහා අවශ්‍ය විද්‍යුත් ප්‍රතිපිළිවෙත් (විද්‍යුත් ප්‍රහාර), සීමිත සයිබර් ආරක්ෂණ ක්‍රියාකාරකම්/ක්‍රියාන්විත සහ කෘතිම බුද්ධි ක්‍රියාකාරකම් සැළසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- සංග්‍රාමික සහ සංග්‍රාමික නොවන ක්‍රියාන්විත සඳහා අවශ්‍ය විද්‍යුත් සංග්‍රාමික, සයිබර් ආරක්ෂණ සහ කෘතිම බුද්ධි යෙදවීම් පිළිබඳ ක්ෂේත්‍ර අණ දෙන්නන් වෙත උපදෙස් ලබාදීම.

- ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ අනුමැතිය මත පවත්වනු ලබන විද්‍යුත් සංග්‍රාමික සහ සයිබර් ආරක්ෂණ ක්‍රියාන්විතයන් සම්බන්ධයෙන් නාවික හමුදා, ගුවන් හමුදා, පොලිස්, රාජ්‍ය සයිබර් ආරක්ෂණ අධිකාරිය සහ විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය සිදුකිරීම.

- ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය, බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය සහ මනෝ විද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්බන්ධතාවයෙන් යුතුව තොරතුරු ක්‍රියාන්විත ක්‍රියාත්මක කිරීම.

- යුද්ධ හමුදාධිපති විසින් රාජ්‍ය අංශයේ අවශ්‍යතාවය මත පවරනු ලබන ඕනෑම සයිබර් ආරක්ෂණය සහ කෘතිම බුද්ධි ක්‍රියාකාරකම් වෙනුවෙන් ක්‍රියාත්මක වීම සහ සහයෝගය ලබා දීම.

- යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රමුඛ සියලුම යුද්ධ හමුදා ආයතනයන් හි සයිබර් විගණන සිදු කිරීම, යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය මත විශේෂිත සයිබර් විගණනයන් සිදුකිරීම

නූතන ලෝකයේ දිනෙන් දින දියුණු වන නවීන තාක්ෂණයත් සමග ලොව සෑම රටක්ම සාම්ප්‍රදායික යුධ උපක්‍රම අතික්‍රමණය කරමින් රටක ජාතික ආරක්ෂාවට, ආර්ථිකයට තර්ජනයන් එල්ලවිය හැකි සයිබර් අවකාශය, විද්‍යුත් සන්නිවේදන අවකාශය හරහා සිදුවිය හැකි අපරාධ වළක්වාලීමට පියවර ගෙන ඇත. ඒ අනුව ඉහත සඳහන් කාර්යයන් සඵල කර ගැනීම  සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල ස්ථාපනය කල 2 සංඥා බළසේනා මූලස්ථානය වෙත විද්‍යුත් සංග්‍රාමික කාර්යයන් ඉටුකරලීමේදී 9 ශ්‍රීලංසංබ (විද්‍යුත් සංග්‍රාමික) වෙතින් විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබන අතර, සයිබර් ආරක්ෂණ කටයුතු උදෙසා 12 ශ්‍රීලංසංබ (සයිබර් ආරක්ෂණ) ඒකකය දායක වේ.

# සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය

බ්‍රිගේඩියර්
ටීඑස් ලියනගුණවර්ධන



**රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක**

## ශ්‍රී ලංකා සංඥා බළකායේ 17 වන බළකාධිපති වැඩ භාරගැනීම

ශ්‍රී ලංකා සංඥා බළකායේ 17 වන බළකාධිපති ලෙස මේජර් ජෙනරාල් ඒඩීඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 ජනවාරි 04 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී වැඩ භාර ගන්නා ලදී. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී වැඩ භාර ගැනීම වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනට අනුව කඳවුර වෙත පිවිසීමෙන් අනතුරුව මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් පිළිගැනීමෙන් පසු කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. පසුව රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී මියගිය රණවිරුවන්ට පුෂ්පෝපහාර දැක්වූ අතර, ඉන් අනතුරුව යුද්ධ හමුදා සාම්ප්‍රදායන්ට අනුකූලව මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් අලංකාරවත් සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී. සම්මාන පෙළපාලිය නිමාවෙන් පසු සමූහ ඡායාරූපයක් සඳහා පෙනී සිටීමෙන් අනතුරුව තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී රෙජිමේන්තු මධ්‍යස්ථාන බළකාධිපති කාර්යාලයේ දී ආගමික වතාවත් මධ්‍යයේ සිය ධුරයේ වැඩ ආරම්භ කරන ලදී. පසුව, රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයෙහි දී සියලු නිලධාරී/සෙසුනිලයින් අමතමින් තම තනතුරේ රාජකාරී ස්වභාවය සඳහන් කරමින්, කැපවීමෙන් සහ උසස් විනයකින් යුතුව තම රාජකාරීන් ඉටු කිරීමට සියලු දෙනා කටයුතු කරන ලෙස අවධාරණය කරන ලදි. ඉන් පසුව, බළකාධිපති තනතුර භාරගැනීම සනිටුහන් කරමින් පැළයක් ද රෝපණය කිරීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන කොනොනි සමාජ ශාලාවේදී පවත්වන ලද තේ පැන් සංග්‍රහය සඳහා සහභාගිවී රැස්ව සිටි පිරිස සමග සුහද කථාබහක නිරත විය. එදින තත් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ නිලධාරීන් විසින් පවත්වනු ලැබූ සාම්ප්‍රදායික දිවා භෝජන සංග්‍රහය සඳහා සහභාගිවන ලදී. වැඩසටහනේ සමාප්තිය සනිටුහන් කරමින් එකක අණදෙන නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පැවැත්විය. තවද, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ජන්ම දිනය ද එදිනට යෙදී තිබීම සුවිශේෂී කරුණක් විය.









## රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරෙහි රාජකාරි භාරගැනීම

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ හිදී 23 වන රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් බ්‍රිගේඩියර් ටීඑස් ලියනගුණවර්ධන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2024 ජුලි මස 25 වන දින වැඩ භාරගන්නා ලදී. එදින එම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් කඳවුරු මුරයක් පිරිනමන ලද අතර, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් රෙම ශ්‍රීලංසංබ රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දක්වන ලදි. පසුව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය සමඟ සමූහ ඡායාරූපක් සඳහා පෙනී සිටින ලදි. ඉන් අනතුරුව යෙදුන සුභ මොහොතට අනුව රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි සේනාවිධායක කාර්යාලයේහි දී ආගමික වතාවත් සිදුකිරීමෙන් අනතුරව එම තනතුරෙහි වැඩ භාරග න්නා ලදී. පසුව මධ්‍යස්ථාන සේනාවිධායක තුමන් විසින් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයෙහි රාජකාරි නියුතු ජ්‍යෙෂ්ඨ නිලධාරි, නිලධාරී/නිලධාරිණියන් සහ සෙසුනිලයින් ඇමතීමෙන් අනතුරුව සම්ප්‍රදානුකුලව පවත්වන ලද සියලු නිල තේ පැන් සංග්‍රහයට සහභාගි වන ලදී.





## ශ්‍රී ලංකා සංඥා බළකා 80 වන සංවත්සරය සැමරීම

ශ්‍රී ලංකා සංඥා බළකා 80 වන සංවත්සර දිනයට සමගාමීව මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන රණවිරු ස්මාරකය අභියසදී 2023 ඔක්තෝබර් මස 15 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණි. මෙම රණවිරු සැමරුම් උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජේනරල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී සහභාගි වන ලදී. තවද එම රණවිරු සැමරුම් උත්සවය සඳහා විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරින්, නිලධාරීන්, විශ්‍රාමික රෙජිමේන්තු සැරයන් මේජර් වරුන් හා මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් සහභාගිවන ලදී. එදිනම 80 වන සංවත්සර උත්සවයට සමගාමීව ආශිර්වාද පතා සංවිධානය කරනු ලබු සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් ගරුතර මහා සංඝරත්නය සංඥා රෙජිමේන්තුව වෙත වැඩම කරවීමෙන් පැවැත්විණි. එමෙන්ම පසු දින එනම් 2023 ඔක්තොබර් 16 දින උදෑසන මහා සංඝරත්නය උදෙසා හීල් දානය පිරිනැමීමෙන් අනතුරුව බෞද්ධ ආගමික උත්සවය සමාප්තියට පත්විය. එම හීල් දානය පූජා කිරීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජේනරල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් සහභාගී විය.





80 වන සංවත්සරය වෙනුවෙන් පවත් වන ලද රණවිරු සැමරුම් උත්සවය සඳහා එවක යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජේනරල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් සහභාගී විය





80 වන සංවත්සරය වෙනුවෙන් සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය සහ හීල් දානය පූජා කිරීමේ අවස්ථාව සඳහා එවක යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපති මේජර් ජෙනරල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, සෙසුනිලයන් සහ මියගිය රණවිරුවන්ගේ ලගම ඥාතීන් සහභාගී විය





80 වන සංවත්සරය වෙනුවෙන් ශ්‍රී ලංකා සංඥා බළකාධිපති මේජර් ජෙනරල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත පිරිනමන ලද සම්මාන මුරය





80 වන සංවත්සරය වෙනුවෙන් පවත්වන ලද සියලු නිල භෝජන සංග්‍රහය

## මේජර් ජෙනරාල් නිලයට උසස් වූ සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට උත්තමාචාරය

සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන බ්‍රිගේඩියර් සීපී අරංගල්ල පීඑස්සී 2024 පෙබරවාරි මස 22 වන දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙලපාලියක් පවත්වන ලදී. මෙහිදී සංඥා බළකා එවක මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා වන මේජර් ජෙනරාල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත් හරසරින් පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. අනතුරුව, මේජර් ජෙනරාල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් රණවිරු ස්මාරකය අභියසදී පුෂ්පෝපහාර දැක්වීය. පසුව චාරිත්‍රානුකූලව ගෞරව සම්මාන මුරයක් පිරිනමන ලදී. අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති නිල වශයෙන් හමුවීම සිදුකරන ලදී. අනතුරුව කඳවුරු පරිශ්‍රයෙහි පැළයක් රෝපණය කිරීමෙන් පසු සංඥා රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමෙන් පසු උත්සවයෙහි වැඩකටයුතු අවසන් විය.





## මේජර් ජෙනරාල් නිලයට උසස් වූ බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී පීටීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට උත්තමාචාරය

සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන බ්‍රිගේඩියර් බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී පීටීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 පෙබරවාරි මස 22 වන දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙලපාලියක් පවත්වන ලදී. මෙහිදී සංඥා බළකා එවක මධ්‍යස්ථාන සේනාවිධායක විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා වන මේජර් ජෙනරාල් බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී පීටීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත් හරසරින් පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. අනතුරුව, ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් රණවිරු ස්මාරකය අභියසදී පුෂ්පෝපහාර දැක්වීය. පසුව චාරිත්‍රානුකූලව ගෞරව සම්මාන මුරයක් පිරිනමන ලදී. අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති නිල වශයෙන් හමුවීම සිදුකරන ලදී. අනතුරුව කඳවුරු පරිශ්‍රයෙහි පැළයක් රෝපණය කිරීමෙන් පසු සංඥා රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදි නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමෙන් පසු උත්සවයෙහි වැඩකටයුතු අවසන් විය.





## මේජර් ජෙනරාල් නිලයට උසස් වූ පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට උත්තමාචාරය

සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන බ්‍රිගේඩියර් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 ජුලි මස 12 වන දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙලපාලියක් පවත්වන ලදී. මෙහිදී සංඥා බළකා නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා වන මේජර් ජෙනරාල් පීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත් හරසරින් පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. අනතුරුව, ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් රණවිරු ස්මාරකය අභියසදී පුෂ්පෝපහාර දැක්වීය. පසුව චාරිත්‍රානුකූලව ගෞරව සම්මාන මුරයක් පිරිනමන ලදී. අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති නිල වශයෙන් හමුවීම සිදුකරන ලදී. අනතුරුව කඳවුරු පරිශ්‍රයෙහි පැළයක් රෝපණය කිරීමෙන් පසු සංඥා රෙජිමේන්ත නිලධාරී නිවස්නයේදි නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.





## මේජර් ජෙනරාල් නිලයට උසස් වූ ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී හට උත්තමාචාරය

සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු වන බ්‍රිගේඩියර් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 ජුලි මස 17 වන දින මේජර් ජෙනරාල් නිලයට උසස්වීම වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සම්මාන පෙළපාලියක් පවත්වන ලදී. මෙහිදී සංඥා බළකා නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක විසින් ප්‍රධාන ආරාධිත අමුත්තා වන මේජර් ජෙනරාල් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී මහත් හරසරින් පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. අනතුරුව, ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් රණවිරු ස්මාරකය අභියසදී පුෂ්පෝපහාර දැක්වීය. පසුව චාරිත්‍රානුකූලව ගෞරව සම්මාන මුරයක් පිරිනමන ලදී. අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති නිල වශයෙන් හමුවීම සිදුකරන ලදී. අනතුරුව කඳවුරු පරිශ්‍රයෙහි පැළයක් රෝපණය කිරීමෙන් පසු සංඥා රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී නිල දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදී.





## නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරෙහි රාජකාරි භාරගැනීම



කර්නල් පීඑච්එන් චන්ද්‍රසේකර ජ්‍යෙෂ්ඨ නිළධාරී සංඥා බළකායෙහි නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් 2024 මාර්තු මස 24 වන දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩහීදී නව තනතුරෙහි වැඩ භාරගන්නා ලදී

## ශ්‍රී ලංකා සංඥා බළකායෙහි විශ්‍රාමික නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සමග පැවති සුහද හමුව

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් විශ්‍රාමික නිලධාරීන්, සෙසුනිලයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා සුහද හමුවක් 2023 නොවැම්බර් 25 වන දින පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයූ සංඥා රෙජිමේන්තු නිලධාරීගේ සංකල්පයක් මත මෙම සුහද හමුව සිදුවිය. සංඥා සංගමයේ සභාපති සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් සහ සෙසු නිලයන් මෙන්ම ඔවුන්ගේ ආදරණීය පවුල්වල සාමාජිකයන් ඇතුළු 238 දෙනෙක් මෙම අවස්ථාව සඳහා සහභාගිවිය. මෙහිදී සංඥා බළකා සරඹ බණ්ඩය සහ සංඥා බළකා තූර්ය වාදක කණ්ඩායමේ සංදර්ශණයකින් අවස්ථාව වර්ණවත් කල අතර, සංඥා බළකායේ විකාශණය පිළිබඳ දැනුවත් කිරීමේ වීඩියෝ පටයක් ඔවුන් හමුවේ ප්‍රදර්ශණය කිරීමෙන් පසුව, පේදුරුතුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා පා ගමනින් ගමන් කරමින් සෙරන්ඩිප් ලෝක වාර්තාව තැබූ 3 වන සංඥා බළකායට අයත් බලලත් නිලධාරී II කීර්තිරත්න කේඅයිඑස් හට ඔහුගේ මෙම විශිෂ්ඨ දක්ෂතාවය අගයමින් සංඥා සංගමය විසින් රුපියල් ලක්ෂයක ත්‍යාග මුදලක් පිරිනමන ලදී. පසුව, පැමිණි සිටි අයවළුන් හට ලුතිනන් කර්නල් ඩීවී බ්‍රෝහියර් අභිප්‍රේරණ මධ්‍යස්ථානය නැරඹීමට අවස්ථාව ලබාදුන් අතර, අවසාන වශයෙන්, සංඥා බළකා 'වේව්ස්' අධිරිද්ම සංගීත කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද සංගීත ප්‍රසංගය සමග එක්වීමෙන් පසු සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේ සූදානම් කර තිබූ දිවා ආහාරයෙන් අනතුරුව වැඩසටහන අවසන් විය.





## සංඥා රෙජිමේන්තු සැරයන් මේජර් තනතුරෙහි රාජකාරි භාර ගැනීම

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ 25 වන රෙජිමේන්තු සැරයන් මේජර් වශයෙන් බලලත් නිළධාරී 1 කේඑන්ඩී කරුණාරත්න යුඑස්පී බලලත් නිලධාරී 2023 ජුලි මස 24 දින සුභ මොහොතින් සිය රාජකාරි භාර ගන්නා ලදී.





# සංඥා පුහුණු පාසල

කර්නල්
එම්එකේ ජයවර්ධන පීඑස්සී



## සේනාවිධායක

යුද්ධ හමුදාවේ සංඥා රෙජිමේන්තුවට අයත් පුහුණු පාසල වශයෙන් මුල්තැන දෙමින් නවීන තාක්ෂණයට අනුගතවෙමින් සංඥා බළකායේ නිලධාරී/සෙසුනිල මෙන්ම යුද්ධ හමුදාවේ අනෙකුත් රෙජිමේන්තු නිලධාරී/ සෙසුනිලයින්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික පුහුණු සැලැස්මට අනුකූලව ඉතාම උසස් තත්වයෙන් යුතුව පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව, 2024 වර්ෂයේ සංඥා බළකායට අයත් නිලධාරී 49 දෙනෙකු හා සෙසුනිලයින් 1893 දෙනෙකු සඳහා පාඨමාලා 15 ක්ද වෙනත් ඒකක නිලධාරීන් 12 දෙනෙකු සහ සෙසුනිලයින් 232 දෙනෙකු පාඨමාලා 08 ක් පවත්වා ඇත. තවද, යුද්ධ හමුදා සාමාජිකයින්ට අමතරව යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දූ දරුවන් සඳහා ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ අධීක්ෂණය යටතේ මෙම පුහුණු පාසල මගින් පවත්වාගෙන යනු ලබන රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන තොරතුරු තාක්ෂණ දැනුම ලබාදීම සිදුකරනු ලබයි.

සේනාවිධායකගේ හා ප්‍රධාන උපදේශකගේ මග පෙන්වීම යටතේ මෙම පුහුණු පාසල වෙතින් පවත්වනු ලබන පාඨමාලාවන්හි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා ගෙවුන වසරක කාලය තුල ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. ඒවානම්,

- විෂය නිර්දේශ සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.

- පාඨමාලා සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ඇතුලත් කිරීමට කටයුතු කිරීම තුලින් පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණුවේ.

- පාඨමාලා සිසුන් ඒකාකාරීත්වයෙන් මුදවා සෑම පාඨමාලාවක් සඳහාම විෂය බාහිර ක්‍රියාකාරකම් ඇතුලත් කරීම (ක්‍රීඩා තරග, හන්තාන ගුවන් විදුලි සම්ප්‍රේෂණ කුළුණ නැරඹීම සහ දළදා මාලිගාව වෙත ගොස් ආශීර්වාද ගැනීමට කටයුතු කිරීම)

- පාඨමාලා හදාරනු ලබන සිසුන් හට ආහාර ලබාගැනීම සඳහා බුෆේ ක්‍රමය යටතේ ආහාර ලබාදීමට කටයුතු කිරීම සහ නවාතැන් පහසුකම්/සනීපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

- උපදේශකයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා උපදේශක සංස්කරණ පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට කටයුතු කිරීම සහ ඔවුන්ගේ රාජකාරී සහ පෞද්ගලික ගැටළු කඩිනමින් විසඳීමට කටයුතු කර උසස් මානසික මට්ටමකින් යුතු උපදේශක මඩුල්ලක් පවත්වා ගෙනයාමට කටයුතු කිරීම තුලින් බාධාවකින් තොරව උපදේශක රාජකාරී ඉටුකිරීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

- පුහුණු අංශ කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලක සියලු පහසුකම් සහිතව ස්ථාපනය කිරීමට කටයුතු කිරීම මගින් කාර්යාල කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම.

- රණවිරු තොරතුරු තාක්ෂණ අංශයේ පාඨමාලා විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම සහ දෙමාපිය හමු සංවිධානය කර දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු පිලිබඳ නිරතුරුව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

2024 මාර්තු මස 8 වන දින චීනයේ යුද්ධ හමුදා දූත පිරිසක් මෙම පුහුණු පාසලේ සංචාරය කල අතර, එහිදී ඉන්දීය යුද්ධ හමුදාව වෙතින් මෙම පුහුණු පාසල වෙත ඉදිකර පරිත්‍යාග කරන ලද තාක්ෂණික විද්‍යාගාරය නරඹණ ලදී. එහිදී මෙම පුහුණු පාසල් ප්‍රධාන උපදේශක විසින් එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හට තාක්ෂණික විද්‍යාගාරය හා එම උපකරණ පිලිබඳව දැනුවත් කරන ලදී. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන සංඥා නිලධාරී වන මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී හා එවකට සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ද සහභාගි වූ අතර, ප්‍රධාන සංඥා නිලධාරීගේ ඉල්ලීම අනුව චීන යුද්ධ හමුදාව සතු තාක්ෂණයද නුදුරේදී මෙම පුහුණු පාසල වෙත ලබාදී මෙහි පුහුණු කටයුතු සඳහා සහය දැක්වීමට කටයුතු කරන බවද දැනුම් දෙන ලදී.

පාඨමාලාවන්හි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමට අමතරව කඳවුරෙහි යටිතල පහසුකම් සහ සෙසුනිල සුභසාධනය ඉහළ නංවනු වස් සුවිශාල කාර්තව්‍යයන් බොහෝමයකට ද සේනාවිධායක තුමන්ගේ උපදෙස් ලබා දී ඇත. මෙම කඳවුරෙහි ආරක්ෂිත වැට දිරාපත්ව කඩාවැටී දීර්ඝකාලීනව අනාරක්ෂිතව පැවති අතර, එය

සේනාවිධායක තුමන්ගේ මැදිහත් වීම මත ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් චේන් ලින්ක් 21 ක් සහ කොන්ක්‍රීට් යොදා ආරක්ෂිත වැට අලංකාරවත් ලෙස ඉදිකිරීම සිදු කෙරුනු අතර, යුද්ධ හමුදා සාමාජිකයින්ගේ හා අවට ප්‍රදේශවාසීන්ගේ ප්‍රයෝජනය සඳහා මෙන්ම සුහදත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් සහනදායී මිලගණන් යටතේ බඩුබාහිරාදිය මිලදී ගැනීමට සහ පෝෂපදායී ආහාරපාන ලබාගැනීමට සුභසාධක වෙළඳසැලක් සහ අඹ සෙවන කැෆේ නමින් බොජුන් හලක් නවතමයෙන් ඉදිකරන ලදී. තවද, ප්‍රධාන මුළුතැන්ගෙය දක්වා වාහනයක් ගමන් කිරීමට හැකි මාර්ගයක් නොමැති වීම හේතුවෙන් සෙසුනිලයින්ගේ ආහාර පාන සැකසීම සඳහා අමු/වියලි සලාක හා දර කර මතින් රැගෙන යාමේ අවශ්‍යතාව මග හැරවීම උදෙසා, සේනාවිධායකගේ මග පෙන්වීම මත 6 වන කාඉරෙ වෙතින් පුහුණු පාසලෙහි ගොඩනැගිලි පරිශ්‍රයේ පිහිටි ප්‍රධාන මුළුතැන්ගෙය දක්වා දිවෙන මාර්ගය තාර දමා ඉදිකිරීම/සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරඇත. එමෙන්ම නිලධාරී/සෙසුනිලයින් හට ක්‍රීඩා කුසලතා ඔප් නැන්වීම සඳහා ඉදිකර තිබූ පැසිපන්දු පිටිය මේ වන විට ක්‍රීඩා කිරීමට අපහසු තත්වයේ පැවති අතර, එයද නැවත නවීකරණය කිරීමට  කටයුතු ආරම්භ කර ඇත. මෙම පුහුණු පාසලෙහි රාජකාරී කරනු ලබන සෙසුනිලයින්ගේ මෙන්ම පාඨමාලා/වැඩමුළු සඳහා සහභාගී වන සිසු සිසුවියන්ගේ යටිතල පහසුකම් ඔප් නංවනු වස් සංඥා මධ්‍යස්ථානය අසල අඩුපාඩුවක්ව පැවති වැසිකිළි පද්ධතියක් හා නානකාමරයක් නවතමයෙන් ස්ථාපනය කිරීම සිදු කරන ලද අතර, නිත්‍ය කාර්ය මණ්ඩලයේ සහ පාඨමාලා හදාරනු ලබන සිසු සිසුවියන්ගේ සුභසාධනය උදෙසා නුදුරේ දී රජකහලක් ස්ථාපනය කිරීමට ද පියවර ගෙන ඇත. රටෙහි පැන නැගී ඇති ආර්ථික අර්බුදය හමුවේ ඇති වු ආහාර හිගයට පිළියමක් වශයෙන් මෙම පුහුණු පාසල් භූමියෙහි ආහාර භෝග හා එළවළු වර්ග වගා කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබන අතර, මේ වන විට තේ පැල 2000 ක්. පොල් පැල 250 ක් සහ  ගම්මිරිස් පැල 1000 ක් වශයෙන් දිගුකාලීන භෝග ද කෙටිකාලීන භෝග වශයෙන් විවිධ වර්ගයේ එළවළු වගාවන් ද සිදුකර ඇත. එමගින් ලැබෙන අස්වැන්න සුභසාධක වෙළඳසැල මගින් සියලුම නිලධාරී/සෙසුනිලයින් වෙත සහනදායී මිලගණන් යටතේ අලෙවි කිරීම සිදුකරමින් පවතී. තවද, බැහැරවාසී සහ කඳවුර තුල සිටින සෙනීන් හට ගුණාත්මක භාවයකින් යුතු ආහාර සහනදායි මිලකට ලබාදීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අනුව ඉතා සුළු මුදලකට ආහාරපාන ලබාග ැනීමේ පහසුකම්  සලසා දී ඇත. මෙම පුහුණු පාසලේ කායවර්ධන මධ්‍යස්ථානයේ පහසුකම් වැඩිදියුණු කර ප්‍රතිසංස්කරණය සිදු කල අතර, සේනාවිධායකගේ උපදෙස් අනුව යුද්ධ හමුදා මූලස්ථානයේ අනුමැතිය සහිතව ඉන්දියානු විද්‍යාගාරයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා ඉසේඅම වෙතින් ඇස්තමේන්තු කර ඇති ලක්ෂ 55 ක මුදල අනුමත කරවා ගැනීම සහ එහි ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම වැනි කටයුතු රාශියක් මෙම පුහුණු පාසලේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදුකරමින් පවතී. තවද, සේනාවිධායකගේ මගපෙන්වීම යටතේ වඩාත් ගුණාත්මක වෘත්තීය හමුදාවක් සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම වෙනුවෙන් සක්‍රීය දායකත්වය සංඥා බළකාය වෙත මෙන්ම සමස්ත යුද්ධ හමුදාවටම ලබාදීමට මෙම පුහුණු පාසලට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මාර්තු 22 වන දින සංඥා පුහුණු පාසල වෙත සිදුකරනු ලැබූ සංචාරය





2024 මාර්තු 22 දින පැවති මූලික තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන පාඨමාලාව අංක 131 හි විසිරයාමේ උත්සවය









2024 මාර්තු මස 08 දින චීන නියෝජිතයින් සංඥා පුහුණු පාසල වෙත සිදුකරනු ලබූ අධීක්ෂණ සංචාරය





නිලධාරීන් සඳහා සංඥා පුහුණු පාසල වෙතින් පවත්වාගෙන යන ලද පාඨමාලාවන් තුළදී පැවැත්වූ පුහුණු අභ්‍යාස





සෙසුනිල සඳහා සංඥා පුහුණු පාසල වෙතින් පවත්වාගෙන යන ලද පාඨමාලාවන් තුළදී පැවැත්වූ පුහුණු අභ්‍යාස සහ පාඨමාලාවන් අතරතුර හන්තාන සම්ප්‍රේෂණ කුළුන වෙත සිදුකරනු ලබූ සංචාරය





මෙම පුහුණු පාසල් ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් එම්එම්යූඅයිබී වැවේගෙදර පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී වැඩභාර ගැනීම






එවක යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති විසින් 'KNUCKLES VIEW' නිලධාරී නිවාඩු නිකේතනය ආරම්භ කිරීම










නිළධාරී/සෙසුනිල සහ සිවිල් ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් සුභසාධන වෙළඳ සැලක් සහ අඩු මුදලට අහාරපාන සැපයීම සහ ඇනවුම් බාරගැනීම සඳහා අඹසෙවන කැෆේ ආරම්බ කිරීම





ආරක්ෂිත වැට අලංකාරවත් ලෙස ඉදිකිරීම





මෙම පුහුණු පාසල් භූමියෙහි ආහාර භෝග හා එළවළු වර්ග වගා කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබයි





6 වන කාලරෙ වෙතින් පුහුණු පාසලෙහි ගොඩනැගිලි ජරිශ්‍රයේ පිහිටි ප්‍රධාන මුළුතැන්ගෙය දක්වා දිවෙන මාර්ගය තාර දමා ඉදිකිරීම





බාස්කට් බෝල් පිටිය මේ වන විට නැවත නවීකරණය කිරීමට කටයුතු ආරම්භ කර ඇත

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
පීටීකේ ද සිල්වා ආර්එස්පී යූඑස්පී එල්එස්සී



## අණදෙන නිලධාරී

වර්ෂ 1943 ඔක්තෝබර් මස 19 වන දින ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා සංඥා බළකා නාමයෙහි පෙර ගමන්කරු ලෙස වසර 80 කට අධික පෞඪ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය. 1958 ඔක්තෝබර් 14 වන දින ඒකකයක් ලෙස නගා සිටුවීම සිදුකර ඇත. ආරක්ෂක සේනා මුලස්ථානය (මුලතිව්) විසුරුවා හැරීමෙන් අනතුරුව 2024 අප්‍රේල් මස 01 වන දින සිට ඉරණමඩු, කිලිනොච්චිය ප්‍රදේශයේ ස්ථානගතව ශ්‍රී ලංකා යුද්ධ හමුදා උපාය මාර්ගික අතිරේක ප්‍රහාරක බළකාය වන 1 බළකාය යටතේ පාලනය වන පාබල සේනාංක, පාබල  බළසේනා මුලස්ථාන හා ඒකක වෙත විශේෂ ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා සංඥා සම්බන්ධතාවයන් ලබාදීම මෙන්ම එම මුලස්ථානයන්ට අමතරව බළඇණි පුහුණු පාසල් හා යුද්ධ හමුදා රෝහල (කිලිනොච්චිය) වෙතද සංඥා සම්බන්ධතාවයන් ලබාදීම සහ ස්ථාපනය කරන ලද සංඥා සම්බන්ධතාවයන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම සිදුකරනු ලබයි. එමෙන්ම ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය හා සංඥා බළසේනා මුලස්ථානය විසින් නිකුත් කරනු ලබන උපදෙස් ප්‍රකාරව මෙම බළප්‍රදේශය තුල ගුවන් විදුලි ජාලයන් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සේවාවන් පවත්වාගෙන යාම නොපිරිහෙලා ඉටුකරනු ලබයි.

තවද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අයත් (ICT) සියලුම විෂයයන් පිළිබදව මනා අවබෝධයකින් යුතු සෙබළුන් බිහි කිරීමේ අරමුණ පෙරදැරිව ඒකකය තුල විවිධ පාඨමාලා/දේශන හා වැඩමුළු පවත්වනු ලබයි. එමෙන්ම පරිනතභාවයෙන් යුතු සංඥා සෙබළුන් පිරිසක් නිර්මාණය කිරීම සඳහා සංඥා පුහුණු පාසල/යුද්ධ හමුදා පුහුණු පාසල් හා වෘත්තීය පුහුණු පාසල් මගින් පවත්වනු ලබන කෙටි කාලීන හා දිගු කාලීන වෘත්තීය පාඨමාවන් සඳහා මෙම ඒකක සෙබළුන් යොමුකර ඔවුන්ගේ වෘත්තීමය දැනුම හා කුසලතාවයන් වර්ධනය කර ගැනීමට ඇවැසි ඉදිරි කටයුතු සිදුකරනු ලබයි. තවද බහුවිද නිපුනත්වයෙන් යුතු සෙබළුන් බිහි කිරීම සඳහා වන (Multi Skilled Soldier) පාඨමාලා මගින් සෙබළුන්ගේ සංඥා හා තාක්ෂණික දැනුම ඔප්නැංවීමට ක්‍රියා කරනු ලබයි.

මෙම ඒකකය වෙතින් සංඥා සම්බන්ධතාවය සපයනු ලබන 1 බළකාය යටතේ පාලනය වන ආධාරක බළඇණි, පාබල බළඇණි සහ සේවා බළඇණි වල සංඥා රාජකාරී කරනු ලබන සෙසු නිලයින් හට සංඥා මධ්‍යස්ථාන රාජකාරීන්/කථා පිළිවෙත/සංඥා උපකරණ නිවැරදි භාවිතය, පරිහරණය හා නඩත්තුව පිළිබදව මූලික දැනුමක් ලබාදීම සඳහා කෙටි කාලීන ක්ෂේත්‍ර සන්නිවේදන තාක්ෂණය පිළිබද සහතික පත්‍ර පාඨමාලා (වෙනත් ඒකක සෙනින් සඳහා වු සංඥා පාඨමාලා) ඒකකය වෙතින් සංවිධානය කර පවත්වනු ලබයි.





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත 2024 ජුනි මස 13 වන දින සිදු කරන ලද ඒකක නිල සංචාරයේ විශේෂ අවස්ථා









2024 ඔක්තෝබර් මස 14 දිනට යෙදී තිබූ ඒකක 80 වන සංවත්සරයට සමගාමීව පිරිත් සජ්ජායනාවක්, දානමය පිංකමක්, ඒකක අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පවත්වන ලදී





බහුවිද සහ නිපුනත්වයෙන් යුතු සෙබළුන් බිහි කිරීම සඳහා මෙම ඒකක සෙනින් වෙනුවෙන් පවත්වන ලද MULTI SKILLED SOLDIER පාඨමාලාවෙහි සහ 1 බළකාය යටතේ ඇති සියලුම පාබල, ආධාරක හා සේවා ඒකකයන් හි සෙනින්හට සංඥා මධ්‍යස්ථාන රාජකාරීන්/කථා පිළිවෙත/සංඥා උපකරණ නිවැරදි භාවිතය, පරිහරණය හා නඩත්තුව පිළිබදව මූලික දැනුමක් ලබාදීම සඳහා පවත්වන ලද ක්ෂේත්‍ර සන්නිවේදන තාක්‍ෂණය පිළිබද සහතික පත්‍ර පාඨමාලාවෙහි විශේෂ අවස්ථා



ඒකක දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් ටීඑම්එන්ඩී තෙන්නකෝන් යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මාර්තු මස 27 වන දින වැඩ භාරගන්නා ලද අවස්ථාව

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
කේබීපීයූඑන් කාරියවසම් යූඑස්පී පීඑස්සී



## අණදෙන නිලධාරී

වසර 36 ක ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය එහි ආරම්භය සනිටුහන් කල වර්ෂ 1989 ක් වු මාර්තු මස 09 වන දින පටන් මේ දක්වා වු දීර්ඝ කාලයක් මුළුල්ලේ මව්බිම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් ඉටුකල අභිමානවත් සේවය පිළිබදව නිහතමානීව ආඩම්බරයට පත්වන්නෙමු.

මෙම රෙජිමේන්තුව ආරම්භ කල දින සිට මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය උදෙසා ත්‍රස්තවාදයට එරෙහිව සිදුකල වඩමාරච්චි මෙහෙයුම, රිවිරැස මෙහෙයුම, උතුරු සහ නැගෙනහිර මානුෂීය මෙහෙයුම් ඇතුළු සියලුම මෙහෙයුම් වෙනුවෙන් සක්‍රියව දායක්තවය ලබාදෙමින් නිලධාරී 05 දෙනෙකු සහ සෙසුනිලයින් 34 දෙනෙකු ප්‍රාණදානයෙන්ද තවත් සැලකියයුතු නිලයන් සංඛ්‍යාවක් කායදානයෙන් ද තම වටිනා ජීවිත පුද කරමින් මව්බිමේ සුරක්ෂිතතාවය වෙනුවෙන් දායකත්වය ලබාදෙන ලදී. ඉන් පසු නිදහස් නිවහල් සාමකාමී රටක් තුල තොරතුරු තාක්‍ෂණ හා සන්නිවේදන සම්බන්ධතාවන් අඛන්ඩව ලබා දෙමින් තොරතුරු තාක්‍ෂණ හා සන්නිවේදන රාජකාරී මෙන්ම පාබල රාජකාරීන් හා නව තාක්‍ෂණික ඥාණයෙන් යුත් යුද්ධ හමුදාවක් ගොඩනැගීමේ මහගු ක්‍රියාදාමයට තම සක්‍රිය දායකත්වය ලබාදෙමින් මෙම රෙජිමේන්තුවේ සියලුම නිලයින් විසින් ඉටුකල සේවය ගෞරවනිය වේ.

මේ අතර ඒකකයේ 35 වන සංවත්සරයට සමගාමීව චාම් උත්සව මාලාවක් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සංවිධානය කරන ලද අතර, එහි දී 3 ශ්‍රීලංසංබ ඒකකය ආරම්භයේ සිට මේ දක්වා රාජකාරි කර ක්‍රියාන්විත හේතූන් මත මියගිය සියලු නිලධාරීන් හා සෙසුනිලයින් සිහිපත් කරමින් දඹකොළ පටුන රාජමහාවිහාරයේදී බෝධිපූජාමය පිංකමක් සිදු කරන ලදී. තවද ඒකක අණදෙන නිලධාරී තුමන් හට සම්මාන පෙළපාලියක් සහ කඳවුරු මුරයක් පිරිනමන ලද අතර, ඒකකයේ නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සියලු නිල සුහද හමුවක් හා සියලු නිල භෝජන සංග්‍රහයක් පවත්වන ලදි.

මෙම ඒකකයේ වත්මන් අණදෙන නිලධාරී ලෙස මේජර් කේබීපීයූඑන් කාරියවසම් යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරනු ලබන අතර, අණදෙන නිලධාරීගේ අණදීම හා මගපෙන්වීම යටතේ ඒකකයට අයත් නිලධාරී සහ සෙසුනිලයින්ගේ උන්නතිය හා සුබසාධනය උදෙසා මෙම ඒකකය වෙතින් වෘත්තියට අදාල පුහුණු කටයුතු, ක්‍රීඩා කටයුතු, විෂයානුබද්ධ ප්‍රායෝගික අභ්‍යාසයන් සහ සුභසාධන කටයුතු සිදු කරගෙන යනු ලබයි.

අවසන් වශයෙන් 35 වසරක කඩ ඉම පසුකර 36 වන වසරට පා තබා සිටින මෙම ඒකකය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන් මගෙහි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කල සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන්ද ඉතාමත් ගෞරවයෙන් සිහිපත්කරමින් මෙවන් මෙහෙවරක් ඉටු කල 3 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත්වේවායි එක සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





මෙම ඒකකයට 27 වන අණදෙන නිලධාරී වශයෙන් පත්වූ මේජර් කේබීපීයූඑන් කාරියවසම් යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 අප්‍රේල් මස 26 වන දින සුභ මොහොතින් රාජකාරි භාරගත් අවස්ථාව





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරියේ නියුතු මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් යන ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන් විසින් සිදු කරන ලද මෙම ඒකක සංචාරය






ඒකක 35 වන සංවත්සරයට සමගාමීව එවක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් යූඑල්සීඩී පෙරේරා පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත පිරිනමන ලද කදවුරු මුරයේ සහ සම්මාන පෙලපාලියේ විශේෂ අවස්ථා



සියලු පහසුකම් සහිත සුබසාධක වෙලදසැළ



ඒකකය වෙතින් පවත්වාගෙන යන ආදර්ශ ගොවිපල





මෙම ඒකකයට අයත් සෙනින්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් පැවත්වූ බහුවිධ නිපුනත්ව සංස්කරණ පාඨමාලාවේ 07 වන අදියර 2024 මැයි මස 10 වන දින ඒකකය තුල ආරම්භ කල අවස්ථාව

# 4 වන රෙජිමේන්තුව
## ශ්‍රී ලංකා සංඥා බළකාය

ලුතිනන් කර්නල්
ඩීඑස්එල් කුමාරසිරි පීඑස්සී



### අණදෙන නිලධාරී

වර්ෂ 1991 ජුනි මස 05 දින ආරම්භකර වසර 33 ක අභිමානය සමරනු ලබන 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මේ වන විට ආරක්ෂක සේනා මුලස්ථානය (වන්නි) යටතේ පාබල සේනාංක 05 ක්, පාබල බළසේනා මුලස්ථාන 14 ක් පාබල/ආධාරක/සේවා බළඇණි 31 ක් ඇතුළුව රෙජිමේන්තු මධ්‍යස්ථාන, පුහුණු පාසැල් සහ අනෙකුත් ස්වාධීන ආයතනයන් සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීම තුලින් ලබාදෙන ලද දායකත්වය වෙනුවෙන් මෙම ඒකකය උසස් මුලස්ථානයන්ගේ පැසසුමට නිරන්තරයෙන් ලක්වෙමින් ශ්‍රී ලංකා සංඥා බළකායට ගෞරවයක් සහ කීර්තියක් අත්කර දෙන ලද අතර, දැනට මෙම ඒකකය අනුරාධපුර නගරයට යාබදව ස්ථානගතව ආසේමු (වන්නි) බළප්‍රදේශයේ අණ හා පාලනයට අවැසි සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ සේවාවන් සැපයීමේ රාජකාරී නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

වසර 33 ක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියනු ලබන මෙම ඒකකයෙහි 2024 ජුලි 05 වන දිනට යෙදී තිබුණු ඒකක සංවත්සරය පැවැත්වූ අතර, සාලියපුර ප්‍රදේශයේ ළමා නිවාසයක් වෙනුවෙන් ආහාර වේලක් පිලිගැන්වීමට කටයුතු කරන ලදී.

සංඥා බළකායට අයත් භඨ පිරිස් එක් වෘත්තියකට සීමානොවී සියලු වෘත්තීන්හි නිපුණත්වයක් ප්‍රගුණ කිරීමේ අරමුණින් සංඥා බසේමු උපදෙස් පරිදි මේ වන විට Multi Skilled Soldier පාඨමාලාවෙහි අඩියර 14 ක් සාර්ථකව අවසන් කරන ලද අතර, ඒ තුලින් ඒකකයට අයත් සෙසුනිළයින් සියයකට අධික සංඛ්‍යාවක් පරිගණක භාවිතය, ජන ඇමතුම් රාජකාරීන්, CCTV රාජකාරීන් බහුප්‍රේෂණ යන්ත්‍ර භාවිතය ඇතුළු සියලුම සංඥා වෘත්තීන් සබැඳිව පුහුණු කර සේනාංක සහ බළසේනාවන්හි සංඥා රාජකාරී සඳහා මුදාහැර ඇත.

එවක අණදෙන නිලධාරී තුමන්ගේ සහ වත්මන් අණදෙන නිලධාරී තුමන්ගේ මගපෙන්වීම යටතේ සංඥා වෘත්තීන් සබැඳිව පුහුණු කර ඒකකයේ සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ කැපවීම හා නොපසුබට උත්සාහය හේතුවෙන් මෙන්ම ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති, සංඥා බළසේනාධිපති ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උපදෙස් පරිදි නිසි අයුරින් රාජකාරීන් ඉටුකරනු ලබන 4 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





මෙම ඒකකයේ 23 වන අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඩීඑස්එල් කුමාරසිරි පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 සැප්තැම්බර් මස 09 වන දින සුභ මොහොතින් වැඩ භාරගන්නා ලද අවස්ථාව





යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් සිදු කරන ලද මෙම ඒකක ප්‍රථම නිල කඳවුරු සංචාරය





ප්‍රධාන සංඥා නිලධාරි සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරි කරනු ලැබූ මේජර් ජෙනරාල් කේඒඩබ්එස් රත්නායක එන්ඩීයු යන ජ්‍යෙෂ්ඨ නිලධාරි එම තනතුරෙහි නික්ම යාමට සමගාමීව මෙම ඒකක නිල කඳවුරු සංචාරය තුළදී සිදු කරන ලද සම්මාන මුරය හා සම්මාන පෙළපාළිය









ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් සිදුකළ 33 වන මෙම ඒකක සංවත්සර උත්සවයේ විශේෂ අවස්ථා

# 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
එස්පී ගාල්ලගේ යූඑස්පී



## අණදෙන නිලධාරී

5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 2014 දෙසැම්බර් මස 15 වන දින ආසේමු (බටහිර) බළප්‍රදේශයේ සංඥා රාජකාරීන් ඉටු කිරීම සඳහා ස්ථානගතවන ලදී. ඒකකය මේ වන විට මෙනේරිගම, පාදුක්ක ප්‍රදේශයේ ස්ථානගතව බළප්‍රදේශයේ දිස්ත්‍රික්ක 09 කට අයත් සේමු/බසේමු/ඒකක හා පුහුණු පාසල් ආවරණය කරමින් සාර්ථකව සංඥා සම්බන්ධතාවය ලබාදීම සහ තොරතුරු තාක්ෂණික සහය ලබාදීම මෙන්ම කොට්ඨාස මුලස්ථාන 10 හි ආරක්ෂක හා පාලන රාජකාරී ඉටුකරමින් පවතී.

මෙම ඒකකයේ ප්‍රධානතම වගකීම වනුයේ ආසේමු (බටහිර) බළප්‍රදේශයේ යුද්ධ හමුදා ගුවන් විදුලි සංඥා සම්බන්ධතා පවත්වාගෙන යාම, තොරතුරු තාක්ෂණික සහය ලබාදීම, රාජ්‍ය උත්සව මෙන්ම යුද්ධ හමුදා උත්සවයන් සඳහා ජනඇමතුම් සේවාව සැපයීම, සියලුම ස්ථානයන්හි දුරකථන මාර්ග නඩත්තු සේවාව සැපයීම හා ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ සේවාව සැපයීම වේ. ඒකකය වෙත පැවරී ඇති මූලික රාජකාරීන්ට පරිබාහිරව හදිසි ආරක්ෂක කටයුතු වෙනුවෙන් භට පිරිස් ලබාදීමද සිදුකරනු ලැබේ.

එමෙන්ම 2024 ජනවාරි මස 02 දින මෙම ඒකක 30 වන සංවත්සරය ඉතාමත් අභිමානයෙන් යුතුව සමරන ලද අතර, එහිදී අණදෙන නිලධාරී භට කඳවුරු මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී. තවද ඒකකයේ මියගිය රණවිරුවන් සිහිපත් කරමින් බෝධි පූජා පිංකමක් පැවැත්වීම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් යුතුව සියළු නිල සුහද හමුවක් පැවැත්වීම සහ බළඝන අතර සුහදතාවය වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරගාවලියක්ද පවත්වන ලදී.

මෙම ඒකකයේ සුභසිද්ධිය සහ රාජකාරී කරනු ලබන සියලුම අයවළුන්ගේ සුභසාධනය පිණිස ඒකක භූමියේ වගාකල හැකි සෑම ප්‍රදේශයකම ආහාර බෝග වගා කිරීමට කටයුතු කර ඇත. තවද 2024.02.04 දින පැවැති ජාතික නිදහස් සැමරුම් උත්සවය සඳහා අවැසි සියලුම ගුවන් විදුලි සංඥා සම්බන්ධතාවයන් මෙම ඒකකය වෙතින් ලබාදෙමින් එම කාර්යය සාර්ථකව ඉටුකර ගැනිමට මහගු දායකත්වයක් ලබාදෙන ලදි. එමෙන්ම විශේෂ ප්‍රභූවරුන් සඳහා අවැසි ජනඇමතුම් සේවාවන් වැඩි ප්‍රමාණයක් ඉතාමත් උසස් අන්දමින් ලබාදීමටත් අන්තර් සංඥා ඒකක පිහිණුම්, කබඩි හා වෙරළ කබඩි තරගාවලි සාර්ථකව සංවිධානය කර පැවැත්වීමත් මෙම ඒකකයට හැකිවිය.

ඒකකයේ අණදෙන නිලධාරීගේ පූර්ණ මගපෙන්වීම යටතේ සියලුම නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ නොමද කැපකිරීම සහ නොපසුබට උත්සාහය මත හා සංඥා බළකාධිපති තුමාගේ උපදෙස් පරිදි යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය ඉහල තලයකට ගෙන ඒමට සෘජු දායකත්වයක් ලබාදෙමින් අදාල රාජකාරීන් නිසි අයුරින් ඉටු කරමින් බළප්‍රදේශයේ සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගනිමින් අභ්‍යන්තර ආරක්ෂක කටයුතු සඳහා යොදවන ලද භට පිරිස් වෙත අවශ්‍ය ක්ෂණික සංඥා සම්බන්ධතාවයන් ලබාදීමෙන් ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ හා යුද්ධ හමුදා ඉහල මුලස්ථානයන්හි ඇගයීමට ලක්ව ඇති 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල දීප්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත්වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.





මෙම ඒකකයේ 21 වන අණදෙන නිලධාරී වශයෙන් මේජර් එස්පි ගාල්ලගේ යූඑස්පී ශ්‍රීලංසංබ යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 නොවැම්බර් මස 16 වන දින සුභ මොහොතින් වැඩ භාරගැනීම




ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යුඑස්පී එන්ඩීයු පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 පෙබරවාරි මස 20 වන දින ඒකකයේ නිල සංචාරයේ යෙදීම




එවකට ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේජ්ඩබ්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 දෙසැම්බර් මස 05 වන දින ඒකකයේ නිල සංචාරයේ යෙදීම






2024 ජනවාරි මස 02 දිනට යෙදුනු ඒකක 30 වන සංවත්සර උත්සවයේ විශේෂ අවස්ථා

# 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
එච්එම්පීඅයියුබී හේරත් යූඑස්පී පීඑස්සී



## අණදෙන නිලධාරී

වසර 30 කට අධික කාලසීමාවක් පැවති කුරිරු යුද්ධය නිමා කිරීමට සක්‍රීයව දායකත්වයක් ලබාදුන් මෙම ඒකකය සංඥා බළකායේ දෙවන ආධාරක බළඇණිය ලෙස 1997 ජනවාරි මස 10 වන දින මන්නාරම ප්‍රදේශයේදී ආරම්භ කරන ලදී. ඉන් පසු වැලිඔය, චාවකච්චේරිය, පල්ලෙපායි, මන්තිකායි, මිරිසුවිල්, කිලාලි, මුහමාලේ, අලිමංකඩ, සෙට්ටිකාඩු, යාපනය යන ප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරී සිදුකරමින් සාඩම්බර අතීතයකට උරුමකම් කියන මෙම ඒකකය ආධාරක බළඇණි රාජකාරී වලින් මිදී තොරතුරු තාක්ෂණ ඒකකයක් ලෙස 2014 ජුනි මස 16 වන දින ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, ඉන්පසු තොරතුරු තාක්ෂණ ඒකකයක් වශයෙන් යාපනය ප්‍රදේශයේ ස්ථානගතව 1 බළකාය, ආසේමු (යා), ආසේමු (වන්නි) හා ආසේමු (මු) යන ආරක්ෂක සේනා බළප්‍රදේශයන් තුළ තොරතුරු තාක්ෂණ රාජකාරී ආවරණය කරමින් රාජකාරී ඉටුකරන ලදි.

ඉන්පසු මෙම ඒකකය 2023 මැයි මස 9 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයේ සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ පද්ධතීන්හි රාජකාරී ආවරණය සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථානගතවූ අතර, වසර 27 කට අධික ඉතිහාසයක උරුමකමක් ඇතිව මේ වන විට ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ අධීක්ෂණය මත මේජර් එච්එම්පීඅයියුබී හේරත් යූඑස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ අණදීම යටතේ 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (යුහමු) වශයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී ආවරණය කරමින් සිටියි.

යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපනය කර ඇති දොරටු ආරක්ෂක පද්ධතිය, සීසීටීවී කැමරා පද්ධතිය, IP TV පද්ධතිය, PABX පද්ධතිය, පරිගණක ජාල පද්ධතිය, ඩිජිටල් ඔරලෝසු පද්ධතිය වැනි පද්ධතීන් නිරීක්ෂණය, පාලනය සහ අලුත්වැඩියාවන්ද, ඩ්‍රෝන කැමරා සහය ලබාදීම, පරිගණක අලුත්වැඩියාව, අන්තර්ජාල/දුරකථන රැහැන් ඇදීම සහ අලුත්වැඩියාව, උත්සව සහ සම්මන්ත්‍රණ සඳහා පුළුල් තිර පද්ධති හා ශබ්ද විකාශන යන්ත්‍ර/රූපවාහිනී යන්ත්‍ර සැපයීම, Zoom තාක්ෂණය ඔස්සේ පැවැත්වෙන සාකච්ඡා සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම වැනි රාජකාරීන් මෙම ඒකකය වෙතින් සිදුකරමින් යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරීන් සඳහා විශාල සහයෝගයක් ලබාදෙමින් සිටියි.

ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු මෙම වර්ෂයේදී එනම් 2024 ජුනි මස 16 වන දින 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය සිය 10 වන සංවත්සරය සමරන ලද අතර, එයට සමගාමීව 2024 ජූලි මස 13 වන දින ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් ලේ දන්දීමේ වැඩසටහනක්ද, 2024 ජුනි මස 14 වන දින ක්‍රියාන්විතයේදී තම ජීවිත පුදකල රණවිරුවන් සිහිකිරීම සඳහාත්, තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටින රණවිරුවන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සහ දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්/සිවිල් සේවක මහතුන් හට සෙත් පැතීම සඳහා අණදෙන නිළධාරී තුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ කොළඹ ගංගාරාම විහාරස්ථානයේදී බෝධි පූජාමය පිංකමක් පවත්වන ලදී. තවද 2024 ජූලි මස 16 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අණදෙන නිළධාරී උදෙසා සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පවත්වන ලද අතර, එදිනම සන්ධ්‍යාවේ 5 ශ්‍රීලංසංබ ඒකකයේදී සියලු නිළයින් උදෙසා සුහද හමුවක් පවත්වන ලදී. එසේම සංවත්සර දිනයට සමගාමීව ඒකක බළලත් නිලධාරී සහ සැරයන් නිවසන සාමාජිකයින් විසින් 2024 ජූලි මස 20 වන දින 5 ශ්‍රීලංසංබ ඒකක නිවාඩු නිකේතනයේදී සාදයක් පවත්වන ලදී.

අවසන් වශයෙන් මෙම ඒකකය ආරම්භ කර මේ දක්වා පැමිණි වසර 26 ක ගමන් මගෙහි සිදුවූ වෙනස්කම්හි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරී කල සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාම පූර්වකව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටුකල 6 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල කීර්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත් වේවායි ඉත සිතින් යුතුව ප්‍රාර්ථනා එක්කරමින් පසුගිය වසරේ අතීතාවර්ජනය මෙසේ සමාප්ත කරන්නෙමු.





ඒකකයේ 08 වන අණදෙන නිලධාරී වශයෙන් 2024 සැප්තැම්බර් මස 10 වන දින පත් වූ මේජර් එච්එම්පීඅයියුබී හේරත් යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් සම්මාන පෙළපාලියක් පැවැත්වීම සහ එම තනතුරේ වැඩ ආරම්භ කිරීම



ඒකක 10 වන සංවත්සරයට සමගාමීව 2024 ජුනි මස 13 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදී



ඒකක 10 වන සංවත්සරයට සමගාමීව 2024 ජුනි මස 14 වන දින එවකට අණදෙන නිලධාරී මේජර් එම්සී ටුක්කාවඩු ප්‍රධානත්වයෙන් ගංගාරාම විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් පවත්වන ලදී





ඒකක 10 වන සංවත්සරයට සමගාමීව 2024 ජුනි මස 16 වන දින පනාගොඩ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී එවක අණදෙන නිළධාරී වෙනුවෙන් සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පවත්වන ලදී





ඒකක 10 වන සංවත්සරයට සමගාමීව 2024 ජුනි මස 16 වන දින 5 ශ්‍රීලංසංබ ඒකකයේදී සියලු නිළ සාදයක් පවත්වන ලදී



2024 වර්ෂයේ විශ්‍රාම යාමට නියමිත සහ ස්ථාන මාරුවීම් ලද නිලධාරීන් වෙනුවෙන් සංඥා රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී සාදයක් පවත්වන ලදී



ඒකක 10 වන සංවත්සරයට සමගාමීව 5 ශ්‍රීලංසංබ නිවාඩු නිකේතනයේදී බනි සහ සැරයන් නිවස්න සාදයක් පවත්වන ලදී

# 7 වන රෙජිමේන්තුව
## ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
එම්ඒඑස්එස් මුතුගොඩ යුඑස්පී පීඑස්සී



## අණදෙන නිලධාරී

යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග දශක 30 ක පමණ කාලයක් මුළුල්ලේ මාතෘ භූමියේ ස්වෛරීභාවය උදෙසා කුරිරු ත්‍රස්තවාදීන් හමුවේ සටන් වැදී සිටින පාබල බළඇණීන්ට ආධාරක බළඇණියක් වශයෙන් 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා ආධාරක බළඇණිය 2008 පෙබරවාරි මස 08 වන දින සංඥා පවුලේ සාමාජිකයෙකු වශයෙන් නවතමයෙන් සංඥා රෙජිමේන්තුවට එක්වන ලදී. මෙම ඒකකය වන්නි මානුෂීය මෙහෙයුම සඳහා සක්‍රිය ලෙසින් දායක වෙමින් නොච්චිකුලම්, පාලමොඩෙයි, කරුපඩ්ඩමුරිප්පු, උදයාර්කට්ටුකුලම්, විශ්වමඩු, ධර්මපුරම් යන ප්‍රදේශයන්හි ක්‍රියාන්විත සඳහා දායකත්වය ලබා දීමේදී රණවිරුවන් 18 ක් තම මාතෘ භූමිය වෙනුවෙන් දිවිපිදු අතර, රණවිරුවන් 63 දෙනෙකු රණක්ෂිතයට පත්වන ලදී.

වන්නි මානුෂික මෙහෙයුම අවසන් වීමෙන් පසු 2013 මාර්තු මස 10 වන දින වෘත්තිය සංඥා රෙජිමේන්තුවක් වශයෙන් ආසේමු (මධ්‍යම) මූලික කොට ගෙන දියතලාව ප්‍රදේශයේ ස්ථාන ගතවීමෙන් ආසේමු (බටහිර) හා ආසේමු (මධ්‍යම) බළප්‍රදේශයන්හි සංඥා රාජකාරී ඉටුකිරීමේ භාරදූර වගකීම භාරගත් අතර. දිස්ත්‍රික්ක 15 ක් ආවරණය කරමින් 11 වසරකට අධික කාලයක් මෙම ආසේමු බළප්‍රදේශයන්හි පැවරෙන සංඥා රාජකාරී සාර්ථකව ඉටු කරන ලදී.

අනතුරුව මෙම ඒකකය 2014 දෙසැම්බර් මස 26 වන දින සියලු නිලයන්ගේ අප්‍රතිහත කැපවීම මත ආසේමු (මධ්‍යම) යටතේ දියතලාව මැණික්කන්ද ප්‍රදේශයේ දර්ශණීය භූමි භාගයක් තුල ස්ථාපිත කර ඇති අතර, වර්ථමානය වන විට ආසේමු (මධ්‍යම) බළප්‍රදේශයේ පිහිටි ආදර්ශමත් කඳවුර වශයෙන් පැසසුමට ලක්ව ඇති අතර, මධ්‍යම කදුකරයේ පිහිටි භූවිෂමතා නිසා සිදුවන අපහසුතාවයන් මගහරවා ගනිමින් දිස්ත්‍රික්ක 6 ක් ආවරණය වන පරිදි සංඥා රෙජිමේන්තුවක් වශයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සපුරාලමින් මනාව රාජකාරී ඉටුකරනු ලබයි.

ගෙවිගිය වසරක කාලසීමාව තුල ඒකක අණදෙන නිලධාරීගේ මග පෙන්වීම යටතේ ඒකකයෙහි 16 වන සංවත්සර උත්සවය 2024 පෙබරවාරි මස 08 වන දින ඉතා උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. එමෙන්ම මෙම ඒකකයට අභිමානයක් එක්කරමින් හිටපු ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති සහ වත්මන් ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති නිළ සංචාරයන් සිදු කල අතර ඒකකයට පැවැරී ඇති තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ රාජකාරී වලට පරිභාහිරව ආගමික වත්පිළිවෙත් වලට මුල්තැන දෙමින් ආසේමු (මධ්‍යම) බළප්‍රදේශයේ ආගමික ස්ථාන සමග සහ සම්බන්ධතාවයෙන් විශාල කාර්යය භාරයක් ඉටුකරනු ලබයි.

එමෙන්ම බහුවිද නිපුණත්වයෙන් යුත් සෙබලුන් බිහිකිරීමේ පාඨමාලාවක් 2024 මාර්තු මස 06 වන දින සිට 2024 මාර්තු මස 22 වන දින දක්වා මෙම ඒකක සෙනින් 20 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව මෙම ඒකකයේදී සාර්ථකව පැවැත්වූ අතර, එහි දෙවන අධියර වශයෙන් සෙනින් 11 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2024 ජුලි මස 11 වන දින ආරම්භ කල අතර, එම පාඨමාලාව 2024 ජුලි මස 27 වන දින අවසන් විය.

තවද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබද මූලික පාඨමාලාව (මූලික සංඥා පාඨමාලාව) අංක - 130 හි අවසන් අභ්‍යාසය සඳහා උපදේශකයින් 05 ක් සහ සිසුන් 30 ක ප්‍රමාණයක් 2023 ජුලි මස 06 වන දින සිට 2023 ජුලි මස 09 වන දින දක්වා මෙම ඒකකය වෙත පැමිණ අදාල පුහුණුවීම් කටයුතු සිදුකරන ලදී.

කොණාවිව් ඉගෙනුම ලබන කෙඩෙට් නිලධාරීන් සහ සිවිල් සිසු සිසුවියන් 1500 ක ගේ සහභාගිත්වයෙන් යුතුව 2024 මැයි මස 17 සහ 18 යන දිනයන්හිදී ශ්‍රී පාදස්ථාන පූජා භූමියේ සිදුකල සමාජ සත්කාර ශ්‍රමදානමය වැඩසටහන සඳහා සංඥා සම්බන්ධතාවය (Community Social Responsibility Project) සහ ඒ සඳහා සහභාගිවූ සිසු සිසුවියන්ගේ ආරක්ෂාව සහ පාලන කටයුතු සම්බන්ධීකරණය මෙම ඒකකය වෙතින් සිදුකරන ලදී.

ඉතා කෙටි කාලයකදී සංඥා රෙජිමේන්තුවේ ඒකක අතුරින් අවස්ථා තුනකදී සංඥා බළකායේ හොඳම ඒකකය කරදීමට සහ මෙම ඒකකය ඉතාමත්ම කීර්තිමත් ඒකකයක් ලෙස ඔසවා තැබීමට අනගිභවනීය ඍජු එඩිතර නායකත්වයක් ලබාදුන් මෙම ඒකකයේ රාජකාරී කරන ලද සියලුම අණදෙන නිලධාරීවරුන් කෘතඥතාවයෙන් යුතුව සිහිපත් කරමි.





7 ශ්‍රීලංසංබ ඒකක 11 වන අණදෙන නිලධාරී වශයෙන් මේජර් එම්ඒඑස්එස් මුතුගොඩ යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සුභ මොහොතින් වැඩ භාරගත් අවස්ථාව






2024 මැයි මස 13 වන දින ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී පීඑස්සී එම්එස්සී එම්ෆිල් යන ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ කදවුරු සංචාරය





2023 දෙසැම්බර් මස 7 වන දින එවක ප්‍රධාන සංඥා නිලධාරී හා සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ කදවුරු සංචාරය



2024 පෙබරවාරි මස 08 වන දිනට යෙදුන 7 ශ්‍රීලංසංබ ඒකක 16 වන සංවත්සරය වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී හට පිරිනැමූ සම්මාන පෙළපාළිය



7 ශ්‍රීලංසංබ ඒකක වාර්ෂික ජීව වෙඩිතැබීම



ආසේමු (මධ්‍යම) බලප්‍රදේශය තුල සංඥා සම්බන්ධතාවය නොමැති ස්ථාන වෙත සංඥා සම්බන්ධතාවය ලබාදීම සඳහා මඩොල්සිම සංඥා කුළුණෙහි රිපීටර් යන්ත්‍ර සවිකිරීම



සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රාහකත්වය යටතේ 7 ශ්‍රීලංසංබ භටපිරිස් වල ශ්‍රම දායකත්වයෙන් මෙම ඒකකයට අයත් සැරයන් අධිකාරී එඑම්ජී හට නව නිවසක් ඉදිකරදීම

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

මේජර්
ආර්එම්කේයුකේ රත්නායක යූඑස්පී



## අණදෙන නිලධාරී

කුරිරු ත්‍රස්තවාදින්ට එරෙහිව සිදුකරන ලද මානුෂීය මෙහෙයුමේ පාබල සේනාංකයන්ට සංඥා සම්බන්ධතාව ලබාදීමේ මූලික අරමුණින් වර්ෂ 2008 ජුලි මස 15 වන දින මෙම ඒකකය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල නගාසිටුවන ලදි. ඒ අනුව මූලික වශයෙන් වෘත්තිමය රාජකාරි ඉටුකිරීම උදෙසා 58 වන සේනාංකය යටතේ වර්ෂ 2008 අගෝස්තු මස 07 වන දින මන්නාරම තල්අඩි ප්‍රදේශයේද, වර්ෂ 2009 පෙබරවාරි මස 05 වන දින පරන්තන් ප්‍රදේශයේ ද ස්ථානගතවිය. තවද, වර්ෂ 2009 අප්‍රේල් මස 25 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය කිලිනොච්චිය යටතේ හා පසුව 1 බළකාය යටතේ පුරා වසර 13 කාලසීමාවක් කිලිනොච්චිය ඉරණමඩු ප්‍රදේශයේ ස්ථානගතව සංඥා සම්බන්ධතාවය ලබා දීම සිදුකරන ලදි.

යුධමය හා යුධමය නොවන සෑම අවස්ථාවකදීම විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතයන්හි අවශ්‍යතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මැනවින් හඳුනාගැනීමෙන් අනතුරුව එතෙක් පැවති විද්‍යුත් සංග්‍රාමික බළඝණය වෙනුවට 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය විද්‍යුත් සංග්‍රාමික ඒකකයක් වශයෙන් ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කල අතර, එහි ප්‍රතිපලයක් වශයෙන් මෙම ඒකකය ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලය, ක්‍රියාන්විත අධ්‍යක්ෂක මණ්ඩලය සහ 2 සංඥා බළසේනා මූලස්ථානය (බල ප්‍රවර්ධන හා ප්‍රක්ශේපන නියාමන) සෘජු අධීක්ෂණය යටතේ වර්ෂ 2024 අප්‍රේල් මස 01 වන දින මුලතිව් ප්‍රදේශයේ ස්ථානගතව වෘත්තිමය වශයෙන් විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විත රාජකාරීන් ඉටුකරනු ලබයි.

ඒ අනුව විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විතයන්ට අදාලව විද්‍යුත් ආරක්ෂණය, විද්‍යුත් සහයෝගිතා මිනුම්, විද්‍යුත් ප්‍රතිකූල මිනුම් හා විද්‍යුත් ප්‍රති ප්‍රතිකූල මිනුම් වලට අදාල රාජකාරි වර්තමානයේදි ඉටු කරනු ලබයි. එහිදි න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමින් සන්නද්ධව ඇසට පෙනෙන හා නොපෙනෙන සතුරා හඳුනාගැනිම හා බුද්ධි තොරතුරු එක්රැස් කිරීම වෙනුවෙන් වු විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාන්විත සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙන්ම ජංගම ක්‍රියාන්විත රථ උපයෝගි කරගනිමින් සජීවී දත්ත එක්රැස් කිරීම් 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ මූලික රාජකාරීන් ලෙස සඳහන් කල හැක.

9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අණදෙන නිලධාරී ලෙස මේජර් ආර්එම්කේයුකේ රත්නායක යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී කටයුතු කරනු ලබන අතර, අණදෙන නිලධාරීගේ අණදීම හා මග පෙන්වීම යටතේ වඩාත් ගුණාත්මක වු වෘත්තිමය හමුදාවක භූමිකාව තහවුරු කර ගැනීම සඳහා විප්ලවීය වු ගමන් මගක තවදුරටත් නියැලී සිටින අතර, පසුගිය කාලය තුළ 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ විශේෂ අවස්ථාවන්ට අදාල ඡායාරූප පහත දක්වා ඇත.





වත්මන් අණදෙන නිලධාරී වශයෙන් මේජර් ආර්එම්කේයුකේ රත්නායක යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 සැප්තැම්බර් මස 10 වන දින එම තනතුර භාරගත් අවස්ථාව





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් 2024 ජුනි මස 14 වන දින සිදු කරන ලද ඒකක සංචාරය





2023 දෙසැම්බර් මස 29 දින 2 සංඥා බසෙමු ආරම්භ කරන ලද අවස්ථාවේ පැවති විශේෂ සංනිවේදන රථ හා ඩ්‍රෝණ යන්ත්‍ර ප්‍රදර්ශණය සිදුකරන අවස්ථාව



2023 වර්ෂයේ සංඥා රෙජිමේන්තු අතරින් විශිෂ්ඨතම ඒකකයට හිමි කුසලානය 9 ශ්‍රීලංසංබ ඒකකය වෙත පිරිනමන ලදී



වත්මන් දෙවන අණදෙන නිලධාරී වශයෙන් මේජර් එච්සී පාගොඩආරච්චි පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 සැප්තැම්බර් මස 03 වන දින එම තනතුර භාරගත් අවස්ථාව





චීන සමුහාණ්ඩුවේ 09 දෙනෙකුගෙනන් සමන්විත දුත පිරිසක් විසින් 2024 ජනවාරි මස 29 දින සිට 2024 පෙබරවාරි මස 15 දින දක්වා කාලය තුල පනාගොඩ ශ්‍රීලංසංබ කඳවුරු භූමියේදී පවත්වනු ලැබු අධිතාක්ෂණික සන්නිවේදන රථ හා ඩ්‍රෝන තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවේ විශේෂ අවස්ථාව



2023 ඔක්තෝබර් මස 31 දින විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාවේ ප්‍රායෝගික ඉදිරිපත් කිරීම සහ අවසන් දේශනය සිදුකරනු ලබන අවස්ථාව



සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ සංකල්පයකට අනුව සැරයන් ජයසිංහ එච්එච්කේ යන ජ්‍යෙෂ්කොනොනි හට නවතමයෙන් නිවසක් ඉදිකරදීම

# 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

## (සන්නිවේදන තාක්ෂණ හා තොරතුරු තාක්ෂණ)

මේජර්
ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී



## අණදෙන නිලධාරී

10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ හත් වන අණදෙන නිළධාරීතුමන් වශයෙන් මේජර් ටීටීඑන් මෙන්ඩිස් යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරී කටයුතු කරන අතර, දෙවන අණදෙන නිළධාරී ලෙස මේජර් එම්සීර් ඩයස් පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරී සිදුකරනු ලබයි.

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය පිහිටුවීමෙන් අනතුරුව යුද්ධ හමුදාව තුල වු ඉලෙක්ට්‍රෝනික හා ගුවන් විදුලි/දුරකථන උපකරණ අළුත්වැඩියා කටයුතු ඉටු කිරීම සඳහා සංඥා මූලික වැඩපොල බණ්ඩය සංඥා බළකායට එක් වු අතර, එය 1 ශ්‍රීලංසංබ, 2 වන බළඝණය යටතේ එම් බණ්ඩය ලෙස ස්ථාපනය කරන ලදී. යුධ හමුදා සංවිධානයෙහි ව්‍යාප්තිය හා සමගාමීව සංඥා බළකායද ව්‍යාප්ත වු අතර, යුද්ධ හමුදාව වෙත ලබා ගන්නා ලද නව තාක්ෂණික ගුවන් විදුලි උපකරණ, දුරකථන හුවමාරු හා දුරකථන උපකරණ, රේඩියෝ රිලේ උපකරණ හා වෙනත් ඉලෙක්ට්‍රෝනික උපකරණ පිළිබද අළුත්වැඩියා/නඩත්තු කටයුතු පහසු කරමින් බණ්ඩයක් වශයෙන් වු සංඥා මූලික වැඩපොල, සංඥා මූලික වැඩපොල බළඝණයක් ලෙස ව්‍යාප්ත විය. 1 වන ශ්‍රීලංසංබ යටතේ සහ පසුකාලීනව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතේ එම් 1 බණ්ඩය සිට එම් 9 බණ්ඩය දක්වා බණ්ඩයන්ගෙන් සමන්විතව නව මුහුණුවරකින් සිය කාර්‍යයන් ඉටු කරන ලදි.

වර්ෂ 1991 අගෝස්තු මස 01 දින සිට වර්ෂ 2000 අගොස්තු 13 දින දක්වා සංඥා මූලික වැඩපොල බළඝණය බළඝණ නිලධාරී අණදෙන්නන් 08 දෙනෙකු යටතේ සිය කාර්මික වගකීම් යුද්ධ හමුදාවට ඉටු කල අතර, මෙම වකවානුව තුල ශ්‍රී ලංකාව තුල පැවති බෙදුම්වාදී ත්‍රස්ථවාදී යුද්ධයේදී තාක්ෂණික හා කාර්මික රාජකාරී අවශ්‍යතා නොපිරිහෙලා ඉටු කරන ලදී. වර්ෂ 2000 අගෝස්තු මස 13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරී 24 ක් හා සෙසුනිලයන් 513 කින් සමන්විත වු ව්‍යුහයකින් යුක්තව 28/2001 හා 2001 අගෝස්තු මස 21 දින දරණ හමුදා චර්යා නියෝග මගින් සංඥා මූලික වැඩපොල ස්වාධීන ඒකකයක් ලෙස සංඥා බළකායට එක්විය.

මූලස්ථානය, බළඝණ 05 කින් හා කේන්ද්‍ර සංඥා වැඩපොල 05 කින් හා මධ්‍යම සංඥා වැඩපොලකින් සමන්විත වන අතර එම සංයුතිය ඇතිව 2015 අප්‍රේල් මස 24 දින සංඥා මූලික වැඩපොල නැවත ප්‍රතිස්ථාපනය වෙමින් 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා රෙජිමේන්තුවේ නව ඒකකයක් වශයෙන් පිහිටුවන ලදී. එමෙන්ම යුද්ධ හමුදාව යථායෝග්‍ය ප්‍රමාණකරණ ව්‍යාපෘතියට අදාලව සංඥා බළකාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ 2023 සැප්තැම්බර් මස 07 දින සිට මෙම ඒකකය වෙත නිළධාරීන් 24 ක් සහ සෙසුනිලයින් 452 ක නව සංස්ථාවක් මගින් නැවත වරක් 10 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බළකාය (සන්නිවේදන තාක්ෂණ හා තොරතුරු තාක්ෂණ) වශයෙන් ප්‍රතිස්ථාපනය වන ලදී.

ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම සංනිවේදන හා තාක්ෂණික අවශ්‍යතාවයන් නොපිරිහෙලා ඉටුකරමින් මහගු සේවයක් සැපයු 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය යුධ හමුදාවේ ගුවන් විදුලි යන්ත්‍ර සහ උපාංග අලුත්වැඩියා කිරීම, දුරකථන හුවමාරු පද්ධතීන් ස්ථාන ගත කරීම හා අළුත්වැඩියා කටයුතු සිදුකිරීම පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා කටයුතු සිදුකිරීම හා ක්ෂුද්‍ර තරංග ජාලය ක්‍රමවත්ව පවත්වාගෙන යමින් යුද්ධ හමුදාවේ සන්නිවේදන කටයුතු සවිමත් කිරීමට සෘජු දායකත්වයක් ලබා දී ඇත.





ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩියු පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 පෙබරවාරි මස 26 වන දින ඒකකයේ නිල සංචාරයේ යෙදීම









මෙම ඒකක 9 වන සංවත්සරයේ විශේෂ අවස්ථා





ශ්‍රී ලංකා පොලිසිය වෙත සන්නිවේදන පුහුණු වැඩසටහන් පැවැත්වීම අධියර 111 - 2024 මාර්තු මස 21 සිට 2024 අප්‍රේල් මස 04 දින දක්වා



කෝප්‍රල් ප්‍රදීප් පීකේඩීඑස් (මියගිය) පවුලේ සාමාජිකයින් වෙනුවෙන් සංඥා බළකාධිපතිගේ උපදෙස් පරිදි අපි වෙනුවෙන් අපි අර්ධ නිවාස වැඩසටහන යටතේ 10 ශ්‍රීලංසංබ ඒකකය වෙතින් නිවස අළුත්වැඩියාකර භාරදීම



2024 ගංගාරාම වෙසක් කලාපය වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය නියෝජනය කරමින් මෙම ඒකකය වෙතින් ඉදිරිපත් කල පහන් කූඩුව



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය නියෝජනය කරමින් 2024 හෝමාගම පොසොන් කලාපය වෙනුවෙන් මෙම ඒකකය වෙතින් ඉදිරිපත් කල පහන් කූඩුව

# 11 වන රෙජිමේන්තුව
## ශ්‍රී ලංකා සංඥා බළකාය
### (තොරතුරු තාක්ෂණ ඉංජිනේරු රෙජිමේන්තුව)



ලුතිනන් කර්නල්
කේඑම්පීපීආර්ටීබී කැකුලන්දර

## අණදෙන නිලධාරී

ශ්‍රී ලංකා සංඥා බළකාය තුල පෞඪ ඉතිහාසයකට හිමිකම් කියාපාන තොරතුරු තාක්ෂණ විෂය පථයට අයත් රාජකාරීන්හි නිරත 11 වන රෙජිමේන්තුව වර්ථමානයේදී නවීන දැනුමෙන් හා තාක්ෂණයෙන් පරිපූර්ණව යුද්ධ හමුදාවට සේවය කිරීමේ ඒකායන අරමුණ පෙරදැරිව සියලු නිළධාරී සහ සෙසුනිළයින් කටයුතු කරනු ලබයි.

11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ අටවන අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් කේඑම්පීපීආර්ටීබී කැකුලන්දර ශ්‍රීලංසංබ යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2023 සැප්තැම්බර් මස 27 වන දින සිට කටයුතු කරනු ලබන අතර, දෙවන අණදෙන නිළධාරී වශයෙන් මේජර් ජේඑම්ඩීකේ මදුවන්ද්‍ර යූඑස්පී ශ්‍රීලංසංබ යන ජ්‍යෙෂ්ඨ නිළධාරී රාජකාරී කරනු ලබයි. විධායක අධිකාරී ලෙස කපිතන් ඩීඑස්පීටී ලක්ෂිත ශ්‍රීලංසංබ යන නිළධාරී කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකා සංඥා බළකාය වර්තමානයේදී සමස්ත යුද්ධ හමුදාවට සහ නවීන තාක්ෂණයට උචිත පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමට ලක්වූ අතර, මෙම ඒකකය තොරතුරු තාක්ෂණ ඉංජිනේරු සේවාවන් සැපයීම වෙනුවෙන් ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ඉංජිනේරු බළඝණය හා ජාලකරණ ඉංජිනේරු බළඝණය පිහිටුවා ඇති අතර, එමගින් පහත දක්වා ඇති සේවාවන් යුද්ධ හමුදා ආයතනයන් තුළ මෙන්ම රාජ්‍ය/රාජ්‍ය නොවන ආයතනයන් වෙතද ලබාදීම සිදුකරනු ලබයි.

- ශ්‍රව්‍ය හා දෘශ්‍ය සේවාවන් සැපයීම.
- පරිගණක ජාලගත කිරීම හා නඩත්තු සේවාවන් සිදුකිරීම.
- සීසීටීවී ජාලකරණ හා නඩත්තු සේවාවන් සිදුකිරීම.
- වීඩියෝ සංස්කරණ කටයුතු සිදුකරදීම.
- සජීව දර්ශණ සම්ප්‍රේෂණය සහ විකාශණය.
- යුද්ධ හමුදාවට මිලදී ගන්නා පරිගණක ආශ්‍රිත උපකරණ සඳහා තාක්ෂනික වාර්තා ලබා දීම.

2024 පෙබරවාරි මස 18 වන දින ප්‍රධාන සංඥා නිළධාරී හා සංඥා බළකාධිපති තුමන් විසින් සිදුකරන ලද ඒකක සංචාරයේදී යුද්ධ හමුදාව වෙත මෙම ඒකකය වෙතින් සිදුකරනු ලැබූ සේවාවන් ඇගයීමට ලක් කල අතර, මින් ඉදිරියටත් එම සේවාවන් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට සියලු නිළයින් හට උපදෙස් ලබාදෙන ලදී.

සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ මග පෙන්වීම යටතේ ස්ථිර වාසස්ථානයන් නොමැති මෙම ඒකකයට අයත් සංසෙ (කා) ධර්මසිරිවර්ධන එල්එච්එන්ඒ යන සෙබළිය හට ස්ථිර නිවසක් ඉදිකර දීම සඳහා මූලික පියවරක් වශයෙන් ඇයට අයත් ඉඩමක 2024 ජූනි මස 12 වන දින සුභ මොහොතින් මුල්ගල තබා නිවසේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ සඳහා මෙම ඒකක නිළධාරීන්ගේ සහ සියලු නිළයින්ගේ දායකත්වය සහ අනුග්‍රාහක භවතුන්ගේ සහයෝගය ලබාගනිමින් ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නියමිතව ඇත.





ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 පෙබරවාරි මස 18 වන දින ඒකකයේ නිල සංචාරයේ යෙදීම





ජාලකරණ පද්ධති සහ CCTV පද්ධති ඉදිකිරීම

ශ්‍රව්‍ය හා දෘශ්‍ය සේවාවන් සැපයීම





සජීව දර්ශණ සම්ප්‍රේෂණය සහ විකාශණය කිරීම

2024 වාර්ෂික ජීව වෙඩි තැබීමේ පරීක්ෂණය පානළුව වෙඩි පිටියේදී 2024 මැයි මස 17, 18 හා 19 යන දිනයන්හිදී ඒකකයට අයත් නිළධාරීන් සහ සෙසුනිළයින්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත්වීම





සංසෙ (කා) ධර්මසිරිවර්ධන එල්එච්එන්ජ් යන සෙබළිය හට ඒකකයේ දායකත්වය මත ස්ථිර නිවසක් ඉදිකර දීම ආරම්භ කිරීම





14 වන ඒකක සංවත්සර දින සැමරුම

# 12 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය

## (සයිබර් ආරක්ෂණ)

කර්නල්
ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී



## අණදෙන නිලධාරී

වර්ෂ 2017 ජනවාරි මස 25 වන දින නූතන සයිබර් අවකාශයෙහි සයිබර් අභියෝගවලට සාර්ථකව මුහුණදීමේ පරමාර්ථය පෙරදැරි කරගෙන සංඥා බළකා මෑණියන්ගේ කුසින් මෙලොව එළිය දුටු 12 වන සංඥා රෙජිමේන්තුව (සයිබර් ආරක්ෂණ) මේ වන විට සිය හත්වන වර්ෂ පූර්ණය සනිටුහන් කරනු ලබයි.

නිලධාරීන් 13 ක් සහ සෙසු නිලයින් 182 දෙනෙකුගෙන් සමන්විත මෙම ඒකකයෙහි වත්මන් අණදෙන නිලධාරී ලෙස කර්නල් ඩබ්ලිව් ආර්එම්ආර් වික්‍රමසිංහ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ නිසි නායකත්වය හා මඟපෙන්වීම යටතේ ඒකකයට ආවේනික සයිබර් ආරක්ෂණ සහ පාලන රාජකාරීන් ඉතා උසස් අන්දමින් ඉටුකිරීමට හැකියාව ලැබී ඇත. මෙම ඒකකයේ දෙවන අණදෙන නිලධාරී ලෙස මේජර් ඩබ්ලිව්එච්එස් සොයිසා පීඑස්සී ශ්‍රීලංසංබ, මූලස්ථාන බළඝණයෙහි බළඝණාධිපති ලෙස මේජර් ආර්එම්සීපී රණසිංහ ශ්‍රීලංසංබ, විධායක අධිකාරී ලෙස 2/ලුතිනන් එම්ටීඩී මැකෝනල් ශ්‍රීලංසංබ සහ උපකරණ පාලන නිලධාරී ලෙස ලුතිනන් (උපා) ඩීඑම්පීබී තෙන්නකෝන් යන නිලධාරීන් මෙම වර්ෂය තුළ දක්වා ඇති තනතුරු හි නවතමයෙන් රාජකාරි භාරගන්නා ලදී.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා දත්ත ජාලය, පරිගණක පද්ධතීන්ට හා වෙනත් තාක්ෂණික උපකරණ වෙත බාහිරින් එල්ලවිය හැකි සයිබර් තර්ජනයන් මැඩපැවැත්වීම සඳහා සුවිශේෂ දායකත්වයක් මෙම ඒකකය විසින් ලබා දෙනු ලබන අතර, යුද්ධ හමුදාව තුළ සියලුම ව්‍යවහාරාත්මක පර්යේෂණයන් (Forensic Research) සඳහා තාක්ෂණික සහය ලබා දෙනු ලබයි. තවද ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් මත බළසේනාධිපති 2 සංඥා බළසේණාවේ මඟපෙන්වීම යටතේ මෙම ඒකක අණදෙන නිලධාරීගේ මෙහෙය වීමෙන් මෙම වර්ෂයෙහි සමස්ථ යුද්ධ හමුදාව තුළ සයිබර් විගණනයන් සිදු කරගෙන යනු ලබයි. එමෙන්ම සියලුම ආසේමු/රෙජිමේන්තු මධ්‍යස්ථාන/පුහුණු පාසල් ඉලක්ක කොට සමාජ මාධ්‍ය හැසිරවීම සහ සයිබර් ආරක්ෂණය පිළිබඳ පුහුණු දේශණයන් සිදු කර ගෙන යන අතර, එය යුද්ධ හමුදාවේ අනාගත සයිබර් ආරක්ෂණ වැඩ පිළිවෙලට මහත් පිටු-වහලක් වනු ඇත.

මෙම රෙජිමේන්තුවෙහි 7 වන සංවත්සරය 2024 ජනවාරි මස 25 වන දිනට යෙදී තිබු අතර, අණදෙන නිලධාරී වෙත චාරිත්‍රානුකූලව පිරිනමන ලද සම්මාන මුරය සහ පෙළපාළිය හිමිගැන්වු අතර, සංවත්සරය වෙනුවෙන් පවත්වනු ලැබු සෑම අංගයක්ම සාර්ථකව සහ ඉතා උසස් අන්දමින් ඉටු කිරීමට හැකිවිය.

මෙම ඒකකය ආරම්භ කර මේ දක්වා පියසටහන් තැබූ වසර 07ක ගමන් මගෙහි සිදුවු වෙනස්කම්හි සාර්ථකත්වයට දායක වෙමින් දිවිහිමියෙන් රාජකාරි කල සියලුම නිලධාරීන් හා සෙසු නිලයින්ද, දැනට රාජකාරියේ යෙදී සිටින සියලුම නිලධාරීන් හා සෙසු නිලයින්ද ඉතාමත් භක්ති ප්‍රණාම පූර්වකව සිහිපත් කරමින් මෙවන් මෙහෙවරක් ඉටුකල 12 වන සංඥා රෙජිමේන්තුවෙහි නාමය සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල කීර්තිමත් ඒකකයක් ලෙස දිනෙන් දින දියුණුවට පත් වේවායි ඉත සිතින් යුතුව ප්‍රාර්ථනා එක්කරන්නෙමු.





ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීයු පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 මාර්තු මස 19 වන දින ඒකකයේ නිල සංචාරයේ යෙදීම









2024 ජනවාරි 25 වන දින මෙම ඒකකයේ 7 වන සංවත්සරය වෙනුවෙන් අණදෙන නිලධාරි කර්නල් ඩබ්ලිව්ආර්එම්ආර් වික්‍රමසිංහ යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත පිරිනමන ලද සම්මාන මුරයක්, සම්මාන පෙළපාලියක් හා බොධිපූජා පිංකමක් සහ ඒකකයෙහි රාජකාරි නියුතු සිවිල් සේවකයින්ගේ සේවය ඇගයීම





2024 ජනවාරි මස 03 වන දින දෙවන අණදෙන නිලධාරි වශයෙන් මේජර් ඩබ්ලිව් එච්එස් සොයිසා පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි රාජකාරි ආරම්භ කිරීම

2024 ජුනි මස 10 වන දින විධායක අධිකාරී වශයෙන් 2/ලුතිනන් එම්ටීඩී මැකෝනල් යන නිලධාරි රාජකාරි ආරම්භ කිරීම

# 2 වන රෙජිමේන්තුව
## ශ්‍රී ලංකා සංඥා බළකාය (ස්වෙච්ඡා)

මේජර්
එන්පීඑස්එම් සිසිරකුමාර පීඑස්සී



### අණදෙන නිලධාරී

ශ්‍රී ලංකා සංඥා බළකායේ ස්වෙච්ඡා ඒකකයක් වශයෙන් නගාසිටුවන ලද 2 (සේවී) ශ්‍රී ලංකා සංඥා බළකාය දිර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ඒකකයකි. එය දෙවන ලෝක යුධ සමයේ බ්‍රිතාන්‍ය හමුදාව යටතේ ස්වෙච්ඡා ඛණ්ඩයක් ලෙස 1943 ඔක්තෝබර් 19 වන දින ස්ථාපනය කිරීම දක්වා දිවයයි. මෙයට පෙරද රාජකීය ඉංජිනේරු බළකාය යටතේ පිහිටුවා තිබූ විශේෂ සංඥා බළඝණයක් මගින් සංඥා රාජකාරීන් ඉටු කිරීමට කටයුතු කර ඇත. පසු කාලීනව හමුදා වර්තා නියෝග 05/89 අනුව ශ්‍රී ලංකා සංඥා බළකායේ එකම ස්වෙච්ඡා ඒකකය ලෙස නගා සිටුවා ඇත.

1980 අප්‍රේල් මස 25 වන දින ස්ථාපනය කරන ලද මෙම ඒකකය මේ වන විට සිය 44 වන සංවත්සරය සනිටුහන් කර ඇති අතර, ඒකකය ආරම්භයේ සිට මේ දක්වා යුධමය සහ සාමකාමී වාතාවරණයන් තුල ඒකකයට අයත් නිලධාරී සහ සෙසුනිළයින් විසින් තම මව්බිම වෙනුවෙන් ඉටුකරන ලද මහගු සේවය ප්‍රථමයෙන් සිහිපත් කරමි.

ශ්‍රී ලංකා සංඥා බළකාය තුල සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන මෙම ඒකකය 44 වන සංවත්සරය සමරන 2024 අප්‍රේල් මස 25 දින වෙනුවෙන් ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් වැඩසටහන් මාලාවක් සංවිධානය කර ක්‍රියාත්මක කරන ලදී. එහිදී ක්‍රියාන්විත සහ ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය ඒකක සාමාජිකයින් සිහිපත් කර ඔවුන් වෙනුවෙන් පුන්‍යානුමෝදනා පැමිණවීමට කටයුතු කරන ලදී.

යුද්ධ හමුදා ප්‍රතිව්‍යුහගත කිරීමේ යුද්ධ හමුදා මූලස්ථාන සැලැස්ම යටතේ 2023 මැයි මස 29 දින සිට දළුකාන කදවුරේ ස්ථානගතව සිටි මෙම ඒකකය ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) කදවුරු පරිශ්‍රයේ ස්ථානගතව නැගෙනහිර බළප්‍රදේශයේ අණ සහ පාලනයට අවශ්‍ය කරන සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ සේවාවන් සැපයීමේ වගකීම් සාර්ථකව ඉටුකරනු ලබයි.

තවද රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයන් වෙතින් ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බළප්‍රදේශයෙහි ජිවත්වන අඩු ආදායම් ලාභී පවුල්, ඔවුන්ගේ දූ දරුවන් වෙනුවෙන්, ආගමික සහ වෙනත් සුභසාධක කටයුතු වෙනුවෙන් සැලසුම් කරනු ලබන උත්සව අවස්ථාවන් සංවිධානය කිරීමේ වගකීම්ද ඒකකය වෙත පැවරෙන අතර, එම අවස්ථාවන් සාර්ථකව සංවිධානය කිරීමට මෙම ඒකකය විසින් කටයුතු කර ඇත.

ඒ අනුව එවක අණදෙන නිලධාරීගේ සහ වත්මන් අණදෙන නිලධාරීගේ මගපෙන්වීම යටතේ ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බළප්‍රදේශයේ සංඥා සහ තොරතුරු තාක්ෂණ රාජකාරීන් නිසි අයුරින් ඉටු කිරීම, නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත බහුකාර්ය සෙබළුන් නිර්මාණය කිරීම සහ අනෙකුත් ඒකකයන් වෙතද අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදෙමින් කටයුතු කරන මෙම ඒකකය ශ්‍රී ලංකා සංඥා බළකායේ මෙන්ම යුද්ධ හමුදාවේ දීප්තිමත් ඒකකයක් ලෙස දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමු.




මෙම ඒකකයේ 12 වන අණදෙන නිලධාරී වශයෙන් මේජර් එන්පීඑස්එම් සිසිරකුමාර පීඑස්සී ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිලධාරී 2024 සැප්තැම්බර් මස 11 වන දින වැඩ භාරගැනීම





එවකට යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩියු ජ්‍යෙෂ්ඨ නිලධාරී 2023 ඔක්තෝබර් මස 25 වන දින මෙම ඒකක සංචාරය





2024 අප්‍රේල් මස 25 වන දිනට යෙදී තිබූ මෙම ඒකක 44 වන සංවත්සරය එවකට අණදෙන නිලධාරී මේජර් කේවීඑ කොඩිකාර පීඑස්සී ශ්‍රීලංසංබ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ ප්‍රධානත්වයෙන් වැලිකන්ද කදවුරු පරිශ්‍රයේදී සමරන ලදී



2024 ජුනි මස 12 දින සිට 15 දින දක්වා ආසේමු(නැ) බළප්‍රදේශය යටතේ ස්ථාපිත වෙනත් ඒකක සෙනින් වෙත පවත්වනු ලැබූ තොරතුරු සහ සන්නිවේදන සංස්කරණ වැඩමුළුව



ඒකකයේ දායකත්වයෙන් 2024 මාර්තු මස 06 වන දින මධුරංගල විද්‍යාලයේ සිසු සිසුවියන් හට පාසල් පොත් හා උපකරණ බෙදා දීම





2024 ජුලි මස 14 වන දින දීඝවාපි රජ මහා විහාරයේ චෛත්‍ය ධාතු තැන්පත් කිරීමේ පිංබර කටයුත්ත වෙනුවෙන් 2 (සේවී) ශ්‍රීලංසංබ ඒකකය වෙතින් ජන ඇමතුම්, එල්ඊඩී පැනල් සහ ශබ්දවාහිනී යන්ත්‍ර ලබාදීම

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා සංගමය

මේජර් ජෙනරාල්
ඊපී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) යූඑස්පී



## ගරු සභාපති

## 2023 වර්ෂයේ යුද්ධ හමුදා සංඥා සංගමයේ සාමාජිකයින්ගේ පවුල් වල සුහද හමුව

2023 නොවැම්බර් මස 25 වන දින පැවති යුද්ධ හමුදා සංඥා සංගමයේ පවුල් සුහද හමුව පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පවත්වන ලදී. මේ සඳහා සංඥා සංගමයේ ගරු සභාපති මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයු යුඑස්ඒසීජීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ඇතුළු විශ්‍රාමික නිලධාරීන්, විශ්‍රාමික ජ්‍යෙකොනොනීන්, විශ්‍රාමික කොනොනීන් 225 දෙනෙකු පමණ සහභාගී විය. තවද, සංඥා බලකාධිපති, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන්ද, රෙජිමේන්තු මධ්‍යස්ථාන රණසේවා අංශයේ කාර්ය මණ්ඩලයද, රෙජිමේන්තු මධ්‍යස්ථාන සැරයන් මේජර්, ඒකක සැරයන් මේජර් වරුන්, ජ්‍යෙකොකනොනින් ඇතුළු සෙසුනිලයින්ද මෙයට සහයෝගය දක්වමින් මෙම අවස්ථාවට සහභාගි විය.

















2023 නොවැම්බර් මස 25 වන දින යුද්ධ හමුදා සංඥා සංගමයේ පවුල් සමග සුහද හමුව පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීම




ගිනස් ලෝක වාර්තාවක් තැබූ බනි 11 කීර්තිරත්න කේඅයිඑස් ඇවිදීමේ පා ගමනට සුභ පැතීම සඳහා රත්මලාන මංසන්ධියේදී ඔහු සමග සම්බන්ධ වූ මොහොත



සන්නද්ධ සේවා පොපි සැමරුම වෙනුවෙන් යුද්ධ හමුදා සංඥා සංගමය පොපි මලක් පැලඳ උපහාරය දැක්වූ අවස්ථාව

## 2024 වසරේ මාර්තු මස 23 වන දින පැවති සංඥා සංගමයේ 65 වෙනි වාර්ෂික මහාසභා රැස්වීම

2024 වසරේ මාර්තු මස 23 වන දින පැවති සංඥා සංගමයේ 65 වෙනි වාර්ෂික මහාසභා රැස්වීමේදී සංගමයේ 12 වන ගරු සභාපති ලෙස පත්වූ මේජර් ජෙනරාල් ඊපී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) නිලධාරී තුමා, හිටපු ගරු සභාපති වන මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) නිලධාරී තුමා වෙතින් තම සභාපති ධුරයේ රාජකාරී භාර ගත් අතර, මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අනුශාසක සංඥා බළකාධිපති තුමා ඇතුළු සංගමයේ සාමාජික/සාමාජිකාවන් 250 ක් පමණ සහභාගී විය. එදින විධායක කමිටු සාමාජිකයින් 25 දෙනෙකු 2024/2025 වසර සඳහා පත්කර ගන්නා ලදී.







සංගමයේ 12 වන ගරු සභාපති ලෙස පත්වූ මේජර් ජෙනරාල් ඊපී ද ඉසෙඩ් අබේසේකර (විශ්‍රාමික) නිලධාරී තුමා, හිටපු ගරු සභාපති වන මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) නිලධාරී වෙතින් සභාපති ධුරයේ රාජකාරී භාර ගත් මොහොත



2024 වසරේ මාර්තු මස 23 වන දින පැවති සංඥා සංගමයේ 65 වෙනි වාර්ෂික මහාසභා රැස්වීමේ දී ලබාගත් සමූහ ඡායාරූපය



2024 වසරේ මාර්තු මස 23 වන දින පැවති සංඥා සංගමයේ 65 වෙනි වාර්ෂික මහාසභා රැස්වීමට වැඩමවා වදාල ඓතිහාසික නාගල කන්ද ආරණ්‍ය සේනාසනයේ වැඩවසන මහනුවර විමලසිරි ස්වාමීන් වහන්සේගේ අනුශාසනය



සෙ/275259 බනි 1 එම්යු දේවප්‍රිය (විශ්‍රාමික) යන බළලත් නිළධාරීගේ සුවදුක් විමසා බැලීම සඳහා යුද්ධ හමුදා සංඥා සංගමයේ ගරු සභාපති ඇතුලු පිරිස ඔහුගේ නිවසට ගිය මොහොත





2023 නොවැම්බර් මස 18 වන දින යුද්ධ හමුදා සංඥා සංගමයේ හිටපු ගරු සභාපති මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් (විශ්‍රාමික) නිලධාරීගේ ප්‍රධානත්වයෙන් බෝලගල ප්‍රවීණ රණවිරුවන්ගේ නිවස්නයේ දී සුහද දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම

# ශ්‍රී ලංකා සංඥා බළකා
## සේවා වනිතා ශාඛාව

ගංගා හේරත් මහත්මිය



**ගරු සභාපතිනිය**

### සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය වැඩ භාර ගැනීම

සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ 14 වැනි සභාපතිනිය ලෙස ගංගා හේරත් මහත්මිය 2024 ජනවාරි මස 20 වැනි සෙනසුරාදා දින උත්සවාකාරයෙන් වැඩ ආරම්භ කරන ලදී. විචිත්‍රවත් පිළිගැනීමක් සංවිධානය කිරීම පිළිබඳව පැමිණ සිටි සියලුම සාමාජිකාවන්ට සිය හදපිරි කෘතඥතාව පළ කරමින් සභාපතිනිය රැස්ව සිටි පිරිස ඇමතුවාය. එදිනම විධායක කමිටුව පත් කරන ලද අතර, මෙම වසර තුලදී සිදුකල යුතු වැඩසටහන් පිළිබඳව ඵලදායී සාකච්ඡාවක් පැවැත්විණි.





### විවිධ රෝගාබාධ වලින් පෙලෙන විශේෂ අවශ්‍යතා ඇති දරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

සංඥා බළකා සේවා වනිතා ශාඛාව මගින් 2024 වර්ෂයේ ඔවුන්ගේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2024 පෙබරවාරි 03 සෙනසුරාදා දින පවත්වන ලදී. තෝරාගත් ප්‍රතිලාභීන් කණ්ඩායමට ඇවිදීමේ හා කථනයේ ඇති දුර්වලතා හේතුවෙන් නිවෙස්වලට සීමා වී සිටින ළමුන් හය දෙනෙකු ඇතුළත් විය. මෙම පරිත්‍යාග සඳහා ළමා ඩයපර්, කිරිපිටි, ඖෂධ සහ වායු මෙට්ට ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ඇතුළත් විය.









## 2024 පෙබරවාරි මස මාසික රැස්වීම ප්‍රථම වතාවට සංඥා පුහුණු පාසලේ පැවැත්වූ අවස්ථාව

2024 පෙබරවාරි මස මාසික රැස්වීම මෙම ශාඛා ඉතිහාසයේ ප්‍රථම වතාවට සංඥා පුහුණු පාසලේ පැවැත්වූ අතර, මෙම රැස්වීමට නිලධාරී භාර්යාවන් මෙන්ම මහනුවර අවට වෙසෙන සෙසු නිල භාර්තාවන්ද සහභාගී වන ලදී.



## සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් ශිෂ්‍යත්ව වැඩසටහනක් පෙබරවාරි මස මාසික රැස්වීමට සමගාමීව ප්‍රදානය කිරීම

සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උපාධි අපේක්ෂිකාවකගේ අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් පෙබරවාරි මස මාසික රැස්වීමට සමගාමීව සිදු කරන ලදී. අභාවප්‍රාප්ත සැරයන් කුමාරසිංහ එච්.ඩී.එස්.ගේ දියණිය වන සදරේකා කුමාරසිංහ මෙනවිය මෙම ශිෂ්‍යත්වයට හිමිකම් කීවාය. ශිෂ්‍යත්වය ප්‍රථම උපාධි කාල සීමාව අවසන් වනතෙක් මාසික දීමනාවක් ලෙස අඛණ්ඩව ප්‍රදානය කෙරේ.





## සංඥා බළකා සේවා වනිතා ශාඛාව 2024 මාර්තු 25 වන දින එහි සුභසාධන ව්‍යාපෘතිවල සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

සංඥා බළකායෙහි දශක තුනකට ආසන්න කාලයක් කැපවීමෙන් සේවය කරන ලද සිවිල් සේවක නන්දන අමරසිංහ මහතාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් ඔහුට අයත් අර්ධ වශයෙන් ඉදිකරන ලද නිවස 2024 සැප්තැම්බර් මස 26 වන දින අංග සම්පූර්ණකර ඔහු වෙත ප්‍රදානය කරන ලදී.




## සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් මාර්ත 28 වැනි බ්‍රහස්පතින්දා කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේදී විශ්‍රාමික රණවිරුවෙකුගේ බිරිඳට ඇවිදීමේ රාමුවක් පරිත්‍යාග කිරීම

බලලත් නිලධාරී 1 එස්එම් ජයරත්න (විශ්‍රාමික) 1974 සිට 1996 දක්වා සංඥා බළකායේ සේවය කර වසර 22 ක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම ගොස් ඇති රණවිරුවෙකි. ඔහුගේ බිරිඳ වන ශ්‍රියාලතා ගුණරත්න මහත්මිය ගෘහස්ථ අනතුරක් හේතුවෙන් හදිසි අනතුරු සහ විකලාංග වෛද්‍ය අංශයේ ප්‍රතිකාර ලබන අතරතුර ශල්‍යකර්මයකට මුහුණ දී ඇති අතර, ඇවිදීමේ රාමුවක් භාවිතා කිරීමට වෛද්‍ය උපදෙස් ලැබීම හේතුවෙන් මෙම පරිත්‍යාගය සිදු කරන ලදී.




## සේවා වනිතා ශාඛාව විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ අලුත් අවුරුදු පොළ - 2024

සේවා වනිතා ශාඛාව විසින් 2024 අප්‍රේල් 09 වන දින රෙජිමේන්තු මධ්‍යස්ථාන ක්‍රීඩා පිටියේදී අලුත් අවුරුදු උත්සවයට සමගාමීව අවුරුදු පොළක් සංවිධානය කරන ලදී. සංඥා බළකා සමාජිකයින්ට උත්සව සමයේ ඔවුන්ගේ අවශ්‍යතා සාධාරණ මිලකට මිලදී ගැනීමට ඉඩ සලසමින් පුළුල් පරාසයක වෙළඳ ද්‍රව්‍ය සහිතව වෙළඳකුටි සංවිධානය කරන ලදී.








## FOREVER SKIN NATURALS ආයතනයේ අනුග්‍රහයෙන් රූපලාවන්‍ය වැඩමුලුවක් සහ යුද සාහිත්‍ය පිළිබඳ දේශනයක් පැවැත්වීම

මෙම රෙම සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම සේවා වනිතා ශාඛා සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් උත්කර්ෂවත් ලෙස පැවැත්වූ අතර ඊට සමගාමීව Forever Skin Naturals ආයතනයේ අනුග්‍රහයෙන් රූපලාවන්‍ය වැඩමුළුවක් සහ ප්‍රවීන ලේඛක ලුතිතන් කර්නල් සුජිත් එදිරිසිංහ ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ යුද සාහිත්‍ය පිළිබඳ දේශනයක්ද පවත්වන ලදි.







# ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් පොසොන් දිනය වෙනුවෙන් සංවිධානය කරන ලද සව් දන්සල

ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාව විසින් 2024 ජුනි මස 21 වන දින පොසොන් පොහොය දින මහනුවර ශ්‍රී දළදා මාලිගාව අබියස සව් දන්සලක් පවත්වන ලදී. මල්වතු පාර්ශ්වයේ අනුනායක අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සව් දන්සල විවෘත කෙරිණි. ශ්‍රී දළදා වහන්සේ වැඳපුදා ගැනීමට දිවයිනේ නන් දෙසින් පැමිණෙන බැතිමතුන්ගේ පිපාසය සංසිඳුවීමේ අරමුණින් මෙම දන්සල සංවිධානය කරන ලදී.













## යුද්ධ හමුදා සේවාවනිතා ඒකකය මගින් පැවැත්වූ මාසික රැස්වීමේදී එම ඒකකය මගින් මාසිකව ලබා දෙනු ලබන ආධාර ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත ලබාදීම

2024 ජූලි මස 9 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් පැවැත්වූ මාසික රැස්වීමේදී එම ඒකකය මගින් මාසිකව ලබාදෙනු ලබන ආධාර ශ්‍රී ලංකා සංඥා බළකාය වෙත ලබාදෙන ලදි. ඒ යටතේ පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල වියළි සලාක මළු වෛද්‍යාධාර මෙන්ම පූර්ණ නිවාස සහ අර්ධ නිවාස වෙනුවෙන් මුල්‍යාධාරද හිමිගැන්වීම සිදුකෙරුණි. එමෙන්ම බළකාධිපති තුමාගේ උපදෙස් මත එම නිවාස ව්‍යාපෘතින් මෙම වසර තුලදී අවසන් කිරීමට නියමිත බව සතුටින් සටහන් කරනු ලැබේ.













# විශ්‍රාම ගැනීම් - ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

## ශ්‍රී ලංකා සංඥා බළකායේ ප්‍රධාන සංඥා නිලධාරී තනතුරෙන් නික්ම යාම හා යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම යන මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක (විශ්‍රාමික) එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත හමුදා ආචාරය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති වශයෙන් රාජකාරි කරන ලද මේජර් ජෙනරාල් කේඑඩබ්ලිව්එස් රත්නායක (විශ්‍රාමික) එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරී වසර 35 කට වැඩි කීර්තිමත් සේවාවක් ඉටුකිරීමෙන් අනතුරුව 2023 දෙසැම්බර් මස 31 වන ඉරිදා දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී විශ්‍රාම යාම වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනට අනුව යතුරු පැදි ආරක්ෂක මුර සමගින් කඳවුර වෙත පිවිසීමෙන් පසු මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගැනීමෙන් අනතුරුව කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. පසුව රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී මියගිය රණවිරුවන්ට පුෂ්පෝපහාර දැක්වීමෙන් පසු යුද්ධ හමුදා සාම්ප්‍රදායන්ට අනුකූලව මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් අලංකාරවත් සම්මාන පෙළපාලියක් පිරිනමන ලදී. සම්මාන පෙළපාලිය නිමාවෙන් පසු සමූහ ඡායාරූපයක් සඳහා පෙනී සිටීමෙන් අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථාන බනි සැරයන් නිවස්නයේදී පවත්වන ලද තේ පැන් සංග්‍රහය සඳහා සහභාගිවී රැස්ව සිටි පිරිස සමග සුහද කථාබහක නිරත විය. පසුව රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයෙහිදි සියලු නිල දිවා භෝජන සංග්‍රහයට සහභාගී වු අතර, තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී රෙජිමේන්තු මධ්‍යස්ථාන කාර්යාලයේදී බළකාධිපති යෂ්ඨිය නව බළකාධිපති වන මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යුඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත සංකේතාත්මකව භාර දී සමරු සටහනක් තැබීමට කටයුතු කලේය. පසුව තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී බළකාධිපති කාර්යාලයේ සිට කඳවුරු පරිශ්‍රයෙන් නික්ම යාම සඳහා පිටත් වු අතර, වීථි පෙළ සැදීමෙන් අවසන් ආචාරය පුද කිරීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙන් නික්ම යන ලදී. අවසාන වශයෙන් එදින තත් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරී සහ නිලධාරීන් විසින් පවත්වනු ලැබු සාම්ප්‍රදායික රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු වැඩසටහනේ සමාප්තිය සිදුකරන ලදී.








## විශ්‍රාම යන මේජර් ජෙනරාල් ඩීඑම්පීපී ප්‍රියන්ත දසනායක (විශ්‍රාමික) ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත හමුදා ආචාරය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට මෙන්ම සංඥා බළකායට වසර 34 කට වැඩි කීර්තිමත් සේවාවක් ඉටුකල මේජර් ජෙනරාල් ඩීඑම්පීපී දසනායක (විශ්‍රාමික) ජ්‍යෙෂ්ඨ නිලධාරි 2023 දෙසැම්බර් මස 12 වන අඟහරුවාදා දින යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරි විශ්‍රාම යාම වෙනුවෙන් සංවිධානය කරන ලද වැඩසටහනට අනුව මධ්‍යස්ථාන සේනාවිධායක විසින් පිළිගැනීමෙන් පසු කඳවුරු මුරය පවත්වා වැඩසටහන ආරම්භ කරන ලදී. පසුව රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී මියගිය රණවිරුවන්ට පුෂ්පෝපහාර දැක්වූ අතර, ඉන් අනතුරුව යුද්ධ හමුදා සාම්ප්‍රදායන්ට අනුකූලව මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් අලංකාරවත් සම්මාන මුරයක් පිරිනමන ලදී. ඉන් අනතුරුව සමූහ ඡායාරූපයක් සඳහා පෙනී සිටීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී සියලු නිලයින් ඇමතීමෙන් පසු කොනොනි සමාජ ශාලාවේ පවත්වන ලද සියලු නිල තේ පැන් සංග්‍රහයේදී සියලු නිලයින් සමඟ සුහද කථාබහක නිරත විය. පසුව මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි බළකාධිපති බැහැදැකීමෙන් අනතුරුව කඳවුරු පරිශ්‍රයෙන් නික්ම යාම සඳහා පිටත් වූ අතර, එහිදී සියලු නිලයින් විසින් විශ්‍රාම යනු ලබන මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි හට වීථි පෙළ සැදීමෙන් අවසන් ආචාරය පුද කිරීමෙන් පසු රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙන් නික්ම යන ලදී. මෙම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේදී සියලුම නිලධාරීන් විසින් පවත්වනු ලැබූ සාම්ප්‍රදායික රාත්‍රී භෝජන සංග්‍රහයෙන් පසු වැඩසටහනේ සමාප්තිය සිදුකරන ලදී.





## විශ්‍රාම යන මේජර් ජෙනරාල් ඒපී වික්‍රමසේකර (විශ්‍රාමික) යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත හමුදා ආචාරය

ශ්‍රී ලංකා සංඥා බළකායෙහි කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් ඒපී වික්‍රමසේකර (විශ්‍රාමික) යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වසර 34 ක විශිෂ්ට සේවා දිවියේ අවසානය සනිටුහන් කරමින් 2024 පෙබරවාරි 15 වන දින යුද්ධ හමුදාවෙන් සමුගන්නා ලදී. මෙහිදී යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව සංඥා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී තත් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ විශිෂ්ඨ සේවාව අගයකරමින්  සමුගැනීමෙහි උත්සවයක් සංවිධානය කරන ලද අතර, මෙහිදී තත් ජේෂ්ඨ නිලධාරින් විසින් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී ශ්‍රී ලංකා සංඥා බළකායේ මියගිය විරෝධාර රණවිරුවන්ට උපහාර පුදකිරීමෙන් පසු තත් නිලධාරි හට ගෞරව සම්මාන මුරයක් පවත්වන ලදී. පසුව ඔහු විසින් සංඥා රෙජිමේන්තු ශ්‍රවණාගාරයේ දී සංඥා බළකා සෙබල සෙබලියන් අමතමින් තම යුද්ධ හමුදා ජීවිතයෙහි අත්දැකීම් පිලිබඳ සංවේදී ආවර්ජනයක් සිදුකරන ලදී. අවසාන වශයෙන් සංඥා රෙජිමේන්තු සියලුම නිළයන්ගේ සහභාගිත්වයෙන් කොනොනි සාමාජ ශාලවේ පැවති තේ පැන් සංග්‍රහයෙන් පසු  සියලු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ ආචාරයන් මැද මේජර් ජෙනරාල් වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි සංඥා බළකායෙන් සමුගන්නා ලදී.





## විශ්‍රාම යන මේජර් ජෙනරාල් සීපී අරංගල්ල (විශ්‍රාමික) පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී වෙත හමුදා ආචාරය

ශ්‍රී ලංකා සංඥා බළකායෙහි කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන මේජර් ජෙනරාල් සීපී අරංගල්ල (විශ්‍රාමික) පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වසර 34 කට ආසන්න විශිෂ්ඨ සේවා දිවියේ අවසානය සනිටුහන් කරමින් 2024 සැප්තැම්බර් මස 25 වන දින යුද්ධ හමුදාවෙන් සමුගන්නා ලදී. මෙහිදී යුද්ධ හමුදා සම්ප්‍රදායන්ට අනුකූලව සංඥා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී තත් ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ විශිෂ්ඨ සේවාව අගයකරමින්  සමුගැනීමෙහි උත්සවයක් සංවිධානය කරන ලද අතර, මෙහිදී තත් ජේෂ්ඨ නිලධාරීන් විසින් රෙජිමේන්තු රණවිරු ස්මාරකය අභියසදී ශ්‍රී ලංකා සංඥා බළකායේ මියගිය විරෝධාර රණවිරුවන්ට උපහාර පුදකිරීමෙන් පසු තත් නිලධාරී හට ගෞරව සම්මාන මුරයක් පවත්වන ලදී. පසුව ඔහු විසින් සංඥා රෙජිමේන්තු ශ්‍රවණාගාරයේ දී සංඥා බළකා සෙබල සෙබලියන් අමතමින් තම යුද්ධ හමුදා ජීවිතයෙහි අත්දැකීම් පිළිබඳ සංවේදී ආවර්ජනයක් සිදුකරන ලදී. අවසාන වශයෙන් සංඥා රෙජිමේන්තු සියලුම නිලයන්ගේ සහභාගිත්වයෙන් කොනොනි සාමාජ ශාලවේ පැවති තේ පැන් සංග්‍රහයෙන් පසු  සියලු නිලධාරීන් සහ සෙසු නිලයින්ගේ ආචාරයන් මැද මේජර් ජෙනරාල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඥා බළකායෙන් සමුගන්නා ලදී.







මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරී සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග

# සංඥා බළකායේ විශේෂ අවස්ථාවන්

## 2 සංඥා බළසේනා මුලස්ථානය යුද්ධ හමුදාධිපති විසින් විවෘත කිරීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් 2024 ජනවාරි මස 29 වන දින පනාගොඩ යුධ හමුදා ජනපදයෙහි සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී 2 සංඥා බළසේනා මුලස්ථානය නවතමයෙන් ස්ථාපිත කරන ලදී. 2 සංඥා බළසේනා මුලස්ථානයේ පළමු බළසේනාධිපති ලෙස බ්‍රිගේඩියර් ඒකේඩී අධිකාරි යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි එදින සිය ධුරයේ රාජකාරී ආරම්භ කරන ලදි. 2 සංඥා බළසේනා මුලස්ථානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු වනුයේ විද්‍යුත් සංග්‍රාමික (EW) සහ සයිබර් ආරක්‍ෂණ (Cyber Security), යන ක්ෂේත්‍ර වල වර්ධනය තුලින් අනාගත යුද්ධ හමුදාවේ ක්‍රියාන්විත සූදානම් වැඩි දියුණු කිරීම වේ.





## ශ්‍රී ලංකා සංඥ බළකායේ නවතමයෙන් ඉදිකරනු ලැබූ කෞතුකාගාරය විවෘත කිරීම

ශ්‍රී ලංකා සංඥා බළකායේ 80 වන සංවත්සරයට සමගාමීව ශ්‍රී ලංකා සංඥා බළකායේ 16 වන බළකාධිපති වන මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සංකල්පයකට අනුව ශ්‍රී ලංකා සංඥා බළකායෙහි ප්‍රථම කෞතුකාගාරය සහ පුස්ථකාල සංකීර්ණය 2023 ඔක්තෝබර් 15 වන දින 'Lt Col DV Brohier අභිප්‍රේරණ මධ්‍යස්ථානය' නමින් සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨතම විශ්‍රාමික සංඥා නිලධාරි බ්‍රිගේඩියර් එෆ්ජේ ද සිල්වා (විශ්‍රාමික) යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් විවෘත කරන ලදී. මෙම කෞතුකාගාරය ඉදිකිරීම සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදුන් සෙසුනිලයින් මෙන්ම විවිධ අයුරින් උපකාර කල විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සංඥා බළකායේ සේවයේ නියුතු නිළධාරීන් සහ සෙසු නිලයින්, සංඥා සේවා වනිතා ශාඛාවේ පසුගිය සභාපතිනියන් ඇතුළු විශාල පිරිසක් මෙම 'Lt Col DV Brohier අභිප්‍රේරණ මධ්‍යස්ථානය' විවෘත කිරීමට එක්ව සිටියහ.







## ශ්‍රී ලංකා සංඥා බළකායේ බලලත් නිලධාරී සහ සැරයන් නිවස්නයේ නවාතැන් පහසුකම් පුළුල් කිරීම

ශ්‍රී ලංකා යුධ හමුදාවේ ප්‍රධාන සංඥා නිලධාරී සහ සංඥා බළකාධිපති වන මේජර් ජෙනරාල් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්එස්සී එම්ෆිල් ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ මගපෙන්වීම යටතේ බනි සැරයන් නිවස්නයේ නවාතැන් පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් නවතමයෙන් ඉදිකරන ලද පෙරනිමි ගොඩනැගිල්ල 2024 ජුලි මස 23 වන දින විවෘත කරන ලදී.






## නවතමයෙන් ඉදිවන රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්න දෙමහල් ගොඩනැගිල්ල

සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි දැනට ඉදිකර ඇති නිලධාරී නිවස්නයෙහි නේවාසික පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දැනට පවතින ගොඩනැගිල්ල දෙමහල් ගොඩනැගිල්ලක් ලෙස නවීකරණය කිරීම ආරම්භ කර ඇත.






# සංඥා ක්ෂිතිජයෙන් ඔබ්බට

මේජර් ජෙනරාල් ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී ජ්‍යෙෂ්ඨ නිලධාරී අසේමු (බටහිර) ආඥාපති භාකාස අණසක වශයෙන් 2024 අප්‍රේල් මස 27 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් ආරම්භ කරන ලදී




මේජර් ජෙනරාල් සීපී අරංගල්ල පීඑස්සී ජ්‍යෂ්ඨ නිලධාරී හරිත කෘෂිකර්ම සහ කෘෂිකර්ම නව්‍යකරණ ක්‍රියාන්විත මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ලෙස 2024 පෙබරවාරි මස 16 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් ආරම්භ කරන ලදී




මේජර් ජෙන්රාල් බීඅයි අස්සලආරච්චි යුඑස්පී පීඑස්සී පීටීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී ආරක්ෂක පර්යේෂණ සංවර්ධන මධ්‍යාස්ථානයෙහි අධ්‍යක්ෂක ලෙස 2023 නොවැම්බර් මස 23 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් ආරම්භ කරන ලදී




බ්‍රිගේඩියර් බීඩී ප්‍රනාන්දු යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී 561 පාබල බළසේනා මුලස්ථානයේ 11 වන බළසේනාධිපති ලෙස 2024 ජුලි මස 15 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් ආරම්භ කරන ලදී







බ්‍රිගේඩියර් පීපීආර් මාදුගොඩ යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු සම්පත් කේන්ද්‍රයෙහි සේනාවිධායක ලෙස 2023 ජුනි මස 22 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් ආරම්භ කරන ලදී





බ්‍රිගේඩියර් කේවීපී ධම්මික යූඑස්පී පීටීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි ආරක්ෂක සයිබර් විධානය සහ තොරතුරු යුද මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ලෙස 2023 අගෝස්තු මස 03 වන දින එම ධුරයේ රාජකාරීන් සුබ මෙහොතින් අරම්භ කරන ලදී





# උසස්වීම්

## මේජර් ජෙනරාල් නිලයට උසස්වීම



මේජර් ජෙනරාල්
ඒපී වික්‍රමසේකර යූඑස්පී පීඑස්සී



මේජර් ජෙනරාල්
ආර්එම්පීඑස්බී රත්නායක එන්ඩීසී



මේජර් ජෙනරාල්
ටීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී



මේජර් ජෙනරාල්
සීපී අරංගල්ල පීඑස්සී



මේජර් ජෙනරාල්
බීඅයි අස්සලාරච්චි යූඑස්පී පීඑස්සී ටීටීඑස්සී

## බ්‍රිගේඩියර් නිලයට උසස්වීම්



බ්‍රිගේඩියර්
වයිඑස්පී සුමනසිංහ ආර්එස්පී



බ්‍රිගේඩියර්
පීපීආර් මාධුගොඩ යූඑස්පී



බ්‍රිගේඩියර්
කේවීපී දම්මික යූඑස්පී ටීටීඑස්සී



බ්‍රිගේඩියර්
ටීඑස් ලියනගුණවර්ධන



බ්‍රිගේඩියර්
ඊඑන්පී ගුණවර්ධන යූඑස්පී

## කර්නල් නිලයට උසස්වීම



කර්නල්
එච්පීජේවී පෙරේරා ආර්එස්පී



කර්නල්
එම්එස් ඊබ්‍රහීම් යූඑස්පී

## ලුතිතන් කර්නල් නිලයට උසස්වීම



ලුතිතන් කර්නල්
කේඑම්පීපීඑස්බී කැකුලන්දර



ලුතිතන් කර්නල්
ඩීඑස්එල් කුමාරසිරි පීඑස්සී



ලුතිතන් කර්නල්
කේවීඑ් කොඩිකාර පීඑස්සී

# පාඨමාලා

## විදේශීය පාඨමාලා හැදෑරූ (නිලධාරී)



බ්‍රිගේඩියර්
ටීඑස් ලියනගුණවර්ධන



කර්නල්
පීපීසී පෙරේරා පීඑස්සී



කර්නල්
එම්එක් ජයවර්ධන පීඑස්සී

ආරක්‍ෂක කළමනාකරණ පාඨමාලාව (ඉන්දියාව)

අන්තර්ජාතික සංනිවේදන සහයෝගීතා වැඩසටහන පැසිෆික් කලාපය හා පැසිෆික් කලාපීය ජ්‍යෙෂ්ඨ සන්නිවේදකයන්ගේ හමුව (බෲනායි සහ ඔස්ට්‍රේලියාව)



බ්‍රිගේඩියර්
එස්ජේකේඩී ජයවර්ධන යූඑස්පී පීඑස්සී



කර්නල්
පීපීසී පෙරේරා පීඑස්සී



කර්නල්
එම්එක් ජයවර්ධන පීඑස්සී



කර්නල්
එම්ආර්එම්ආර්එල්බී මීගස්තැන්න යූඑස්පී පීටීඑස්සී



කර්නල්
එන්පීඑ මෙන්ඩිස් පීඑස්සී

අන්තර්ජාතික සංනිවේදන සහයෝගීතා වැඩසටහන පැසිෆික් කලාපය හා පැසිෆික් කලාපීය ජ්‍යෙෂ්ඨ සන්නිවේදකයන්ගේ හමුව (ඇමෙරිකා එක්සත් ජනපදය)



ලුතිතන් කර්නල්
ඩීඑස්එල් කුමාරසිරි පීඑස්සී



මේජර්
ආර්එම්කේයුකේ රත්නායක යූඑස්පී



මේජර්
ආර්එම්එස්පී බණ්ඩාර පීඑස්සී



මේජර්
බීඑම්ජේසී සිසිර කුමාර

සන්නිවේදන උපකරණ නඩත්තු සහ කළමනාකරණ වැඩසටහන (චීනය)

කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරී/සංඥා සේවාස්ථ පාඨමාලාව අංක - 135 (ඉන්දියාව)



මේජර්
එච්එම්ඩීඑස් ජයතිලක ශ්‍රීලංසංබ



මේජර්
පීපීපීඑම් පල්ලියගුරු පීඑස්සී ශ්‍රීලංසංබ



මේජර්
එල්එම්ටී ගුණතිලක යූඑස්පී ශ්‍රීලංසංබ



මේජර්
එම්එබීපී සිල්වා එල්එස්සී ශ්‍රීලංසංබ

සංඥා කණ්ඩායම් භාර නිලධාරී පාඨමාලව අංක - 137 (ඉන්දියාව)



මේජර්
බීආර්එස්ජේ දසනායක පීඑස්සී



මේජර්
ආර්එම්පීජී මුත්තෙට්ටුගේ පීඑස්සී

කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරී/සංඥා සේවාස්ථ පාඨමාලාව
(පාකිස්ථානය)



මේජර්
ආර්පීඑම්ටීඩීබී රත්මලවින්න පීඑස්සී
ශ්‍රීලංසංබ



මේජර්
එච්එම්සීජේ මැදවත්ත ශ්‍රීලංසංබ

විද්‍යුත් සංග්‍රාම හා තොරතුරු ආරක්ෂණ පාඨමාලාව අංක - 08
(පාකිස්ථානය)



මේජර්
එස්එම්සීආර් සෙනෙවිරත්න ශ්‍රීලංසංබ

ජපන් - ආසියානු සයිබර් ආරක්ෂණ
පුහුණු වැඩසටහන් නිරීක්ෂක
වැඩසටහන (වියට්නාමය)



කපිතාන්
පීඑආර්බී පෙරේරා



කපිතාන්
එම්පීඩීපීඑස් ගමගේ

සංඥා තරුණ නිලධාරී පාඨමාලාව අංක - 161
(ඉන්දියාව)



කපිතාන්
පීඑම් ගුණසේන

සංඥා තරුණ නිලධාරී පාඨමාලාව
අංක - 70 (පාකිස්ථානය)







ලුතිනන් කර්නල් එම්ජීඑස් මුතුගල යූඑස්පී

ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වූ 16 TH MERIDIAN CONFERENCE ON CRITICAL INFORMATION INFRASTRUCTURE PROTECTION (CIIP) සාකච්ඡාවට සහභාගි වීම



මේජර්
එච්පීඩීඑම්ඩී ගුණසේකර





2023 ඔක්තෝබර් මස 04 දින සිට 2023 දෙසැම්බර් මස 14 දින දක්වා ඇමෙරිකාවේ පැවති MILITARY LAW DEVELOPMENT වැඩමුළුව සඳහා සහභාගීවීම

## දේශීය පාඨමාලා හැදෑරූ (නිලධාරී)



කපිතාන්
කේඑජ්ඩබ් අරුණාරත්න ශ්‍රීලංසංබ

මූලික පැරෂුට් පාඨමාලාව
අංක - 95 (කුඩාඔය)



මේජර්
එජ්කේ පෙරේරා ශ්‍රීලංසංබ

මූලික පැරෂුට් පාඨමාලාව
අංක - 96 (කුඩාඔය)

## විදේශීය පාඨමාලා හැදෑරූ (සෙසුනිල)



මා/සැරයන්
පීරිස් එස්ආර්එම්

උසස් තොරතුරු තාක්‍ෂණ පාඨමාලාව (ඉන්දියාව)

## දේශීය පාඨමාලා හැදෑරූ (සෙසුනිල)



කෝප්‍රල්
බණ්ඩාර පීඑම්ඩීආර්

නායකත්ව ප්‍රවර්ධන උසස් සහතික පත්‍ර පාඨමලාව අංක - 78
ප්‍රථම ස්ථානය



සංසෙ
බණ්ඩාරණායක අයිපීඑම්පේ

සංඥා පුහුණු පාසල වෙතින් පවත්වනු ලැබූ විදුලි සන්දේශ තාක්‍ෂණ පාඨමාලාව
ප්‍රථම ස්ථානය



මා/සැරයන්
බංඩාර ආර්එම්අයිඑස්

ජ්‍යෙෂ්ඨකොනොනි තොරතුරු තාක්‍ෂණ සන්නිවේදන පාඨමාලාව අංක - 01
දෙවන ස්ථානය



මා/සැරයන්
කරුණාරත්න එම්පීඩී

ප්‍රධාන පරිපාලන සහායක සුදුසුතා පාඨමාලාව අංක - 01
තුන්වන ස්ථානය



සංසේ(කා)
ජයවික්‍රම කේපීඑන්

රෙජිමේන්තු ගිණුම් හා වැටුප් පාඨමාලාව (ශ්‍රීලයුපොදුසේබවෘපා - කුට්ටිගල)
තුන්වන ස්ථානය



කෝප්‍රල්
චාමර එස්පීටී




එක්සත් ජාතීන්ගේ ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය සඳහා සෙනින් රපෝර්තු කරවීම - PRE COURSE SHANTI PRAYAS EXERCISE

## සාමසාධක රාජකාරි වල නියුතු සංඥා බළකායට අයත් නිලධාරීන්/සෙසුනිලයන්

| අ:අ | රෙජි අංකය | නිලය | නම | ඒකකය | රට |
|---|---|---|---|---|---|
| 1 | නි/67354 | මේජර් | ජේඑම්ඩී නුවන් ශ්‍රීලංසංබ | 6 ශ්‍රීලංසංබ | ලෙබනන් |
| 2 | සෙ/2සී00512 | බනි 11 | සේනාරත්න එම්එම් | 2 (සෙව්) ශ්‍රිලංසංබ | දකුණු සුඩානය |
| 3 | සෙ/285866 | කෝප්‍රල් | හේරත් එම්එම්කේසීඑස් | 10 ශ්‍රිලංසංබ | |
| 4 | සෙ/282803 | සැරයන් | සම්පත් ඩීඩීඩබ්ලිව්කේ | 10 ශ්‍රිලංසංබ | ලෙබනන් |
| 5 | සෙ/282317 | සැරයන් | ජයලත් ජේබීආර්පී | 11 ශ්‍රිලංසංබ | |

# කෙළිබිම ජයගත්තෝ

## යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු කරාතේ තරගාවලිය - 2024

අන්තර් රෙජිමේන්තු කරාතේ තරගාවලිය 2024 ජුලි මස 19 වන දින සිට 23 වන දින දක්වා යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසලේදී පවත්වන ලද අතර පහත සදහන් පරිදි තරගාවලියේ ස්ථානයන් හිමිකරගන්නා ලදී.

සංසෙ (කා) මධුවන්ති වීඑච්එස් 68 ට වැඩි බර පන්තියේ කුමිතේ ප්‍රථම ස්ථානය සහ කාතා තෙවන ස්ථානය, සංසෙ (කා) ලොකුගමගේ එච්එල්එන්එස් 50 ට අඩු බර පන්තියේ කුමිතේ සහ කාතා ප්‍රථම ස්ථානය සහ කණ්ඩායම් ඉසව්වේ ප්‍රථම ස්ථානය, සංසෙ (කා) රණවීර කේයුපීඑස්කේ 50 ට  අඩු බර පන්තියේ කුමිතේ තෙවන ස්ථානය සහ කණ්ඩායම් තරගාවලියේ ප්‍රථම ස්ථානය, සංසෙ(කා) මුතුහරණී එඑම් 68 ට වැඩි කුමිතේ බර පන්තියේ ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදී.

තවද, මෙම රෙජිමේන්තු කාන්තා කණ්ඩායම අන්තර් රෙජිමේන්තු කාන්තා තරගාවලියෙහි ආධුනික කාන්තා ප්‍රථම ස්ථානය සහ කාන්තා අනුශූරතාවය දිනා ගන්නා ලදී.




අන්තර් රෙජිමේන්තු පිරිමි/කාන්තා කරාතේ සංඥා බළකා කණ්ඩායම 2024



සංසෙ(කා) මධුවන්ති වීඑච්එස් 12 ශ්‍රීලංසංබ



ලා/කෝප්‍රල් සත්සරණී ඩබ්ලිව්එඑන් 12 ශ්‍රීලංසංබ



සංසෙ(කා) මුතුහරණී එච්එම් 12 ශ්‍රීලංසංබ



සංසෙ(කා) අබේසේකර ඩබ්ලිව්එම්පීපීකේ 12 ශ්‍රීලංසංබ



සංසෙ(කා) සිරිවර්ධන එස්එම්කේපී 11 ශ්‍රීලංසංබ



සංසෙ(කා) ලොකුගමගේ එම්එල්එස් 2(සේවි) ශ්‍රීලංසංබ



කෝප්‍රල් විදානපතිරණ වීපීඅයිඩීපී 12 ශ්‍රීලංසංබ



සංසෙ(කා) ප්‍රියශානි එල්බීඑච්ඩී 2(සේවි) ශ්‍රීලංසංබබ



ලා/කෝප්‍රල් කුමාරසිංහ යූඩීඑම් 12 ශ්‍රීලංසංබ



සංසෙ(කා) රණවීර කේකේඑ 1 ශ්‍රීලංසංබ

# 59 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා උළෙල - 2024

59 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා උළෙල - 2024  මාර්තු මස 22 සහ 23 වන දින දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පවත්වන ලද අතර, අවසන් මහා තරගාවලිය 2024 මාර්තු මස 31 වන දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා සංඥා බළකායේ ලා/කෝප්‍රල් විමලසිරි ඩීඒපීජේපී දුර පැනීම (පිරිමි) ප්‍රථම ස්ථානය සහ සංසෙ (කා) අබේරත්න ඒපීඑම්එස්කේ මීටර 400 ප්‍රථම ස්ථානය දිනාගත් අතර, මෙම රෙජිමේන්තු කාන්තා කණ්ඩායම 100x4 කාන්තා ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී. තවද මෙම තරගාවලියෙහි සමස්ථ කාන්තා අංශයේ තෙවන ස්ථානය සංඥා බළකාය විසින් දිනා ගන්නා ලදී. මෙම තරගාවලියෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් පැමිනි යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ගේ ප්‍රධානත්වයෙන් මළල ක්‍රීඩා උළෙල ආරම්භ විය.




කෝප්‍රල් විමලසිරි ඩීඒජේපී 3 ශ්‍රීලංසංබ




සංසෙ(කා) සථියා එම්වයිඑෆ් 2(සෙව්) ශ්‍රීලංසංබ




සංසෙ(කා) සථියා එම්වයිඑෆ් 2(සෙව්) ශ්‍රීලංසංබ




සංසෙ(කා) මුතුකුමාරණ ටීඑ 11 ශ්‍රීලංසංබ




ලා/කෝප්‍රල් නිදර්ශණී ඩබ්ලිව්එම්එන් 11 ශ්‍රීලංසංබ



සංසෙ(කා) සදරේබා එච්එච්ඩී 2(සෙව්) ශ්‍රීලංසංබ





2024 මාර්තු මස 16 වන දින යුහශාආපුපා - පනාගොඩ හිදී පවත්වන ලද අන්තර් සංඥා ඒකක පිහිණුම් තාරගාවලියෙහි ගුරතාවය දිනාගත් 5 ශ්‍රිලංසංඹ ඒකක ක්‍රිඩකයින්

2024 ජුලි මස 08 වන දින රෙමශ්‍රිලංසංබ හිදී පවත්වන ලද අන්තර් සංඥා ඒකක කැරම් තරගාවලියෙහි ශුරතාවය දිනාගත් 5 ශ්‍රිලංසංබ ඒකක ක්‍රිඩකයින්






2024 ජුලි මස 16 වන දින යුහශාආපුපා - පනාගොඩ හිදි පවත්වන ලද අන්තර් සංඥා ඒකක කබඩි තාරගාවලියේ ගුරතාවය දිනාගත් 5 ශ්‍රිලංසංබ ඒකක ක්‍රිඩකයින්

කෝප්‍රල් අමරතුංග එම්පීපීඅයි 5 ශ්‍රිලංසංබ

2023 ඔක්තෝබර් මස කාටාර් රාජ්‍යයේ පවත්වන ලද බිලියඩ් සහ ස්නුකර් ලෝක කුසලාන තරගාවලිය සඳහා සහභාගිවී ඇත





2024 මාර්තු මස දියවන්නා ඔයේ පැවති ජාතික ඔරු පැදීමේ තරගයට 10 ශ්‍රීලංසංබ ඒකකය නියෝජනය කරමින් සහභාගි වු කෝප්‍රල් මදුසර සහභාගි වු කණ්ඩයම විසින් ශුරතාවය දිනා ගන්නා ලදී





කෝප්‍රල් නග්රාන් එම්එන්එම් 11 ශ්‍රීලංසංබ යන කොනොනි 2024 ජාතික තරගාවලියේ තනි හා යුගල ඔරු පැදීමේ තරගාවලියේ පළමු ස්ථානය හිමි කරගෙන ඇත





ලා/කෝප්‍රල් නිදර්ශණී ඩබ්ලිව්එම්එන් 11 ශ්‍රීලංසංබ යන කොනොනි 2024 මහියංගනයේ පැවැති ජාතික මැරතන් ධාවන තරගාවලිය දෙවන ස්ථානය, නුවරඑළියේ පැවැති ජාතික රට හරහා දිවීමේ තරගාවලියේ තුන්වන ස්ථානය හා බංගලාදේශයේ පැවැති ඩකා මැරතන් තරගාවලියේ සිව්වන ස්ථානය හිමි කරගෙන ඇත





2024 ජුනි මස පැවති අන්තර් ඒකක වොලිබෝල් ශුරතාවය 10 ශ්‍රීලංසංබ ඒකක වොලිබෝල් කණ්ඩායම වෙතින් දිනා ගන්නා ලදී






ලා/කෝප්‍රල් මෙන්ඩිස් ටීඑල්පී 11 ශ්‍රීලංසංබ
2024 ජාතික ඔරු පැදීමේ තරගාවලියේ යුගල තරග වටයේ දෙවන ස්ථානය හා සිව් දෙනාගේ තරග වටයේ පළමු ස්ථානය දිනා ගන්නා ලදී

ලා/කෝප්‍රල් මුතුකුමාරණ ටීඑන් 11 ශ්‍රීලංසංබ
102 වන ජාතික මලල ක්‍රීඩා තරගාවලිය 2024 මීටර100 තරගයෙන් ප්‍රථම ස්ථානය හා තායිලන්තයේ පැවැති ආසියානු 100x4 සහාය දිවීමේ තරගයෙන් පස්වන ස්ථානය දිනා ගන්නා ලදී





2024 ජුනි මස 11 දින පැවති අන්තර් ඒකක වෙස් තරගාවලියේ අනු සුරතාවය 10 ශ්‍රීලංසංබ ඒකක කණ්ඩායම විසින් දිනා ගන්නා ලදී

2024 අන්තර් ඒකක කාන්තා අත්පන්දු තරගාවලියේදී 6 ශ්‍රීලංසංබ ඒකකය කාන්තා අත්පන්දු කණ්ඩායම එහි ශූරතාවය දිනාගන්නා ලදී







කෝප්‍රල් තිලකරත්න කේකේර් 3 ශ්‍රීලංසංබ
48 වන ජාතික මහා ක්‍රීඩා උළෙල 2024 කිලෝග්‍රෑම් 60 බරපංතිය රිදී පදක්කම දිනා ගන්නා ලදී

ලා/කෝප්‍රල් වැහිගේනගේ පේඑච්එස් 12 ශ්‍රීලංසංබ
2024 වර්ෂයේ 39 වන ජාතික ඔරු පැදීමේ තරගාවලියෙහි තනි හා යුගල තරග ඉසව්වෙහි ප්‍රථම ස්ථානය දිනා ගන්නා ලදී



සංසෙ(කා) මධුවන්ති වීඑච්එස් 12 ශ්‍රීලංසංබ
2024 ජාතික මහා ක්‍රීඩා උළෙලෙහි කරාතේ කුමිතේ
(බර පංතිය - 68) ලොකඩ පදක්කම දිනා ගැනීම



2024 අන්තර් සංඥා ඒකක ටෙනිස් ශූරතාවය 7 ශ්‍රීලංසංබ
ඒකක කණ්ඩායම දිනා ගන්නා ලදී



2024 අන්තර් සංඥා ඒකක ගොල්ෆ් ශූරතාවය 7 ශ්‍රීලංසංබ
ඒකක කණ්ඩායම දිනා ගන්නා ලදී



2024 ජුනි මස පැවති අන්තර් ඒකක වෙරළ වොලිබෝල් ශූරතාවය
10 ශ්‍රීලංසංබ කණ්ඩායම වෙතින් දිනා ගන්නා ලදී



2024 අන්තර් ඒකක වෙරළ අත්පන්දු තරගාවලියේ
අනුශූරතාවය ලබා ගත් 2 (සේවී) ශ්‍රීලංසංබ කණ්ඩායම



2024 අන්තර් ඒකක අත්පන්දු තරගාවලියේ අනුශූරතාවය ලබා
ගත් 2 (සේවී) ශ්‍රීලංසංබ කණ්ඩායම

## 2024 - යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු බිලියඩ් සහ ස්නූකර් තරගාවලිය





මේජර් ඊඑම්එන්ටී එදිරිසිංහ ශ්‍රීලංසංබ
2024 අන්තර් රෙජිමේන්තු නිලධාරී බිලියඩ් හා ස්නූකර් කේවල තරගාවලියේ දක්ෂතම ස්නූකර් නිලධාරී හා ස්නූකර් තරගාවලියේ ප්‍රථම ස්ථානය



කෝප්‍රල් අමරතුංග එම්පීපීඅයි
2024 අන්තර් රෙජිමේන්තු ආධුනික කේවල බිලියඩ් තරගාවලියේ දෙවන ස්ථානය සහ විවෘත කේවල බිලියඩ් තරගාවලියේ අටවන ස්ථානය



සංසෙ හලල්ඩීන් එම්එස්
2024 අන්තර් රෙජිමේන්තු අධුනික කේවල ස්නූකර් තරගාවලිය ප්‍රථම ස්ථානය සහ විවෘත කේවල ස්නූකර් තරගාවලියේ තෙවන ස්ථානය

## 2024 - යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු මේස පන්දු තරගාවලිය



කර්නල් ආර්සී විජේකෝන් යූඑස්පී පීඑස්සී
පිරිමි කණ්ඩායම් තරගාවලිය සහ අවු: 40ට වැඩි යුගල තරගාවලිය ප්‍රථම ස්ථානය



කපිතාන් ජේඑව්යිඑස් ජයකොඩි
පිරිමි කණ්ඩායම් තරගාවලිය,
අවු: 40ට වැඩි යුගල සහ
කේවල තරගාවලිය ප්‍රථම ස්ථානය
පිරිමි යුගල තරගාවලිය දෙවන ස්ථානය සහ
කේවල තරගාවලිය තෙවන ස්ථානය



සංසෙ පුෂ්පකුමාර එම්ජ්එස්
පිරිමි කණ්ඩායම් තරගාවලිය ප්‍රථම ස්ථානය,
පිරිමි යුගල තරගාවලිය සහ
කේවල තරගාවලිය දෙවන ස්ථානය



සංසෙ උදංජය කේඩබ්අයි
පිරිමි කණ්ඩායම් තරගාවලිය
ප්‍රථම ස්ථානය



සංසෙ (කා) පිටිගල කේඑච්
කාන්තා කණ්ඩායම්, යුගල, කේවල තරගාවලියේ
ප්‍රථම ස්ථානය සහ දක්ෂතම ක්‍රීඩිකාව



සංසෙ(කා) රෝද්‍රිගු ටී
කාන්තා කණ්ඩායම් සහ යුගල තරගාවලිය ප්‍රථම ස්ථානය සහ කේවල තරගාවලිය දෙවන ස්ථානය

# උපන්දින සුබපැතුම්



2024.01.22 දිනට 7 වන වියට පා තැබූ
මිහිලිය තිලකරත්න දියණිය



2024.03.12 දිනට 12 වන වියට පා තැබූ
තේෂානී තිලකරත්න දියණිය



2024.06.04 දිනට 14 වන වියට පා තැබූ
උෂානි තිලකරත්න දියණිය



2023.12.11 දිනට 11 වන වියට පා තැබූ
හිරුනි සංගලා දියණිය



2024.06.15 දිනට 1 වන වියට පා තැබූ
එම් ලෙවෝන් ආකර්ෂ පුතණුවන්



2024.06.23 දිනට 05 වන වියට පා තැබූ
සිනුර යස්විදු සෙනෙවිරත්න පුතණුවන්



2024.03.29 දිනට 09 වන වියට පා තැබූ
මනුද හිරුනිම සෙනෙවිරත්න පුතණුවන්



2024.06.20 වන දිනට පළමු වියට පා තැබූ
ඒඑම් හිරුජ මෙත්සිත අදාසූරිය පුතණුවන්



2023.11.13 දිනට 03 වන වියට පා තැබූ
පන්සිළු නෙත්සර ජයවීර පුතණුවන්



2024.09.11 දිනට 08 වන වියට පා තැබූ
දහම්සා සත්සරණි ජයවීර දියණිය



2024.03.08 දිනට 02 වන වියට පා තැබූ
සයෝන් පිතුසර ගමගේ පුතණුවන්



2023.06.03 දිනට 08 වන වියට පා තැබූ
ඩීඑම් ඕහාසි ජනිෂ්ටා චතුරනි දියණිය



2024.02.26 දිනට 04 වන වියට පා තැබූ
එච්කේ තෙනුල් තෙව්සිත පුතණුවන්



2024.06.21 දිනට 06 වන වියට පා තැබූ
ඩීඑම් පිතුලි දෙව්හාරි දිසානායක දියණිය



2023.12.14 දිනට 06 වන වියට පා තැබූ
ඩීපී සඳලු ගසකැලුම් පුතණුවන්



2023.11.08 දිනට 07 වන වියට පා තැබූ
අර්එම් චතුරිකා හාශා මුණසිංහ දියණිය



2023.11.08 දිනට 04 වන වියට පා තැබූ
ආර්එම් උදාරි හාශනා මුණසිංහ දියණිය



2024.05.17 දිනට 12 වන වියට පා තැබූ
එම්පී සිතුලි ගසාරා දියණිය



2024.03.14 දිනට 01 වන වියට පා තැබූ
ඩීපී දිනිති ඔගීත්මා දියණිය



2024.03.08 දිනට 05 වන වියට පා තැබූ
එම්එම්ඩූපී සනුකි ඉගන්සා උයන්වත්ත දියණිය



2024.01.11 දිනට 07 වන වියට පා තැබූ
එම්පී ඔව්දු තිසර පුතණුවන්



2024.06.12 දිනට 04 වන වියට පා තැබූ
පී විජේන් දිල්නෙත් පතිරණ පුතණුවන්



2024.04.16 දිනට 04 වන වියට පා තැබූ
එම්එම්ඩූජීවී මිහිදු බණ්ඩාර උයන්වත්ත පුතණුවන්



2024.05.30 දිනට 07 වන වියට පා තැබූ
ඩීඩබ්ජී ගගනි කවින්ද්‍යා වීරසිංහ දියණිය



2024.04.23 දිනට 04 වන වියට පා තැබූ
සිහින දෙනුවන් ආකාශ් පුතණුවන්



2024.01.22 දිනට 01 වන වියට පා තැබූ
ජනුමි එනාරා වන්සදි දියණිය



2023.12.29 දිනට 05 වන වියට පා තැබූ
ඔවිනි සනුල්නා දියණිය



2024.07.28 දිනට 04 වන වියට පා තැබූ
තිසේන් ගිහන්ස පුතණුවන්



2024.10.09 දිනට 02 වන වියට පා තැබූ
ඉනුදි දහමිකා කුලසූරිය දියණිය



2024.09.06 දිනට 02 වන වියට පා තැබූ
ඩීපී කිහන්සා එනෝලි බංඩාර දියණිය



2024.04.05 දිනට 06 වන වියට පා තැබූ
ඩීපී යුහන්සා කිනෝලි බංඩාර දියණිය



2024.04.05 දිනට 06 වන වියට පා තැබූ
මන්දිල් ප්‍රභාෂ්වර ආකාශ් වීරසිංහ පුතණුවන

# මංගල සීනු



2023.10.12 වන දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 9 ශ්‍රීලංසංබ ඒකකයේ කපිතන් පීජ්ආර්ඩී පෙරේරා හා ජුලානි ප්‍රනාන්දු මෙනවිය



2024.05.24 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 12 ශ්‍රීලංසංබ ඒකකයේ ලුතිනන් එස්ජ්එන් තිසරි හා 11 ශ්‍රීලංසංබ ඒකකයේ කපිතන් එච්එම්කේපී හේරත්



2024.01.22 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 1 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් බණ්ඩාර කේඑම්එච්පී හා ආර්එම්ඩී සමාධි මෙනවිය



2024.01.28 දින සුබ මොහොතින් යුගදිවිය ඇරඹූ 6 ශ්‍රීලංසංබ ඒකකයේ සැරයන් අරුණ කුමාර ඩීඑම්සීපී හා ලා/කෝප්‍රල් නෙත්මිණී කේඑජේ



2024.03.08 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 5 ශ්‍රීලංසංබ ඒකකයේ ලා/කෝප්‍රල් විජේවික්‍රම එම්ජ්සිඑන් හා අනෝජා නිල්මිණී කුමාරි මෙනවිය



2024.03.01 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 5 ශ්‍රීලංසංබ ඒකකයට අයත් ලා/කෝප්‍රල් මධුෂංක එස්ඩබ්එච් හා ශමිනි ඉමල්ෂා ජයරත්න මෙනවිය



2024.06.13 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 2(සේවි) ශ්‍රීලංසංබ ඒකකයට අයත් ලා/කෝ වික්‍රමසිංහ එඑම්එපී හා සංසෙ(කා) ධර්මකීර්ති බීඩීසීඩීඑම්



2024.05.16 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 9 ශ්‍රීලංසංබ ඒකකයට අයත් කෝප්‍රල් මධුලාල් ඩිඩීඑස්සී හා මල්ෂා ශාවිනි මෙනවිය



2024.01.17 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 9 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් කිර්තිරත්න එස්විසී හා වරුණී ශානිකා මෙනවිය



2023.05.03 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 1 ශ්‍රීලංසංබ ඒකකයේ සංසෙ නන්දදේව පීජීඑස්සී හා ඩබ්ලිව්එම් කාවින්ද්‍යා මදුභාෂිණී මෙනවිය



2024.06.16 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 10 ශ්‍රීලංසංබ ඒකකයට අයත් කෝප්‍රල් සඳරුවන් කේඑල්පීඑච්බීපී හා ජේටී සඳමිණී මෙනවිය



2024.03.21 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 10 ශ්‍රීලංසංබ ඒකකයට අයත් කෝප්‍රල් ලහිරු මදුසංඛ පීඑම් හා එච්එම් පැතුම් සමන්ගිකා මෙනවිය



2024.05.11 වන දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 10 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් පෙරේරා ඒඑස්පීකේ හා පීඩීඑස් අයෝධ්‍යා රසාංජල මෙනවිය



2023.11.24 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 11 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් ගුණතිලක ඩබ්ඩීඩීඑඩී හා බීඩීඑ මධුහාමිණී මෙනවිය



2024.03.01 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 11 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් පෙරේරා ඩබ්එස්එම් හා 6 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් ජයවීර පීආර්ආර්සී



2024.06.20 දින සුබ මොහොතින් යුගදිවිය ඇරඹූ 11 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් රත්නතිලක එල්එම්එස්ටීබී හා කෝප්‍රල් කෝෂලී



2023.08.23 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 12 ශ්‍රීලංසංබ කෝප්‍රල් විදාණපතිරන වීපීඅයිඩීපී හා 3 ශ්‍රීලංසංබ ලා/කෝ තෙන්නකෝන් ආර්එම්අයිපී



2024.01.01 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 3 ශ්‍රීලංසංබ ඒකකයට අයත් කෝප්‍රල් නාවලගේ එන්එල් හා දර්ශණී උදයංගනී ධර්මදාස මෙනවිය



2024.05.20 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 3 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් ආරියදාස එඑන්එම් හා රුචිනි භාග්‍යා මෙනවිය



2024.06.12 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 5 ශ්‍රීලංසංබ ඒකකයට අයත් ලා/කෝප්‍රල් රුබේරු පීටීඑන්වී හා තරංගා මදුෂානි මෙනවිය



2024.05.10 දින සුබ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 7 ශ්‍රීලංසංබ ඒකකයේ මධුසංක එච්පීඑ හා එස්එච්එම් ශානිකා මෙනවිය



2024.01.22 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 4 ශ්‍රීලංසංබ ඒකකයේ සැරයන් ජයසිංහ ජේඑම්එබී හා හේෂානි වත්සලා රණසිංහ මෙනවිය



2024.05.16 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 4 ශ්‍රීලංසංබ ඒකකයට අයත් කෝප්‍රල් ප්‍රනාන්දු එම්පීඑම් හා කාසෙ කල්පනා ඒආර්



2023.12.28 දින සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 6 ශ්‍රීලංසංබ ඒකකයට අයත් සැරයන් හේරත් එච්එම්සීකේ හා එච්එම් චමිලානි ලසන්තා හේරත් මෙනවිය

# AUGMENTED REALITY IN MILITARY: TRANSFORMING WARFARE AND ENHANCING BATTLEFIELD CAPABILITIES IN TRAINING AND SIMULATION

Military training and simulation are being rapidly revolutionized by Augmented Reality (AR), which gives soldiers immersive and lifelike learning experiences. This section explains in detail how AR is altering the training environment and allowing soldiers to learn crucial skills, adapts to challenging situations, and boost their combat readiness without putting them in danger.

## Immersive Training Scenarios

The capacity of AR to generate extremely immersive settings is one of its main advantages in military training. AR technology increases the realism of training activities by superimposing digital elements on the actual world. Soldiers use AR-capable gear, such as smart glasses or headsets, to experience mixed reality, which combines virtual and real aspects.

## Realistic Combat Simulations

Realistic combat simulations that simulate the conditions of an actual battlefield are made possible through AR. Soldiers can take part in a variety of situations, such as hostage rescue missions, convoy missions, and urban combat. The real and virtual components blend together fluidly to provide a more dynamic and engaging learning environment.

## Tactical Decision-Making

Soldiers' ability to make tactical decisions is tested using AR training scenarios. To achieve mission goals, they must assess threats, understand difficult circumstances, and develop workable plans. The ability of soldiers to practice making decisions in safe, realistic settings improves their capacity to respond swiftly and decisively in combat.

## Team Coordination and Communication

Soldiers can practice teamwork and communication in a simulated setting with AR-based training. Teams may cooperate, obey orders, and carry out tasks much like they would in a real operation. Effective teamwork and improved communication are fostered as a result, both of which are essential in battle circumstances.

## Adaptive Learning

Soldiers can practice teamwork and communication in a simulated setting with AR-based training. Teams may cooperate, obey orders, and carry out tasks much like they would in a real operation. Effective teamwork and improved communication are fostered as a result, both of which are essential in battle circumstances.

## Immediate Feedback and Performance Analysis

Platforms for augmented reality training give soldiers quick feedback. Soldiers receive performance numbers and analysis following each training scenario, enabling them to pinpoint areas for growth. This feedback loop encourages lifelong learning and skill development, improving the efficacy of training sessions.

## Cost-Effectiveness and Resource Efficiency

AR-based training has the potential to lower the price of conventional military training. There is no requirement for elaborate logistics, live ammunition, or pricey equipment with AR simulations. AR also makes it possible to run numerous training situations concurrently, making the best use of available training area.

## Simulating Hazardous Environments

Soldiers can practice in perilous conditions that would be difficult or dangerous to duplicate through AR training. Extreme weather to Chemical, Biological, Radiological, and Nuclear (CBRN) training, AR may recreate a variety of risky situations without endangering users' safety.

## Continuous Skill Enhancement

The benefits of AR training extend beyond new recruits to more seasoned warriors. The constant improvement of skills is necessary for military readiness. With the use of AR, soldiers can update their knowledge, practice cutting-edge procedures, and adjust to changing threats, guaranteeing they are always highly capable and ready for any circumstance.

## Conclusion

A revolutionary technology that is reshaping combat is AR, which is used in military training and simulation. Its capacity to produce engaging, safe, and realistic training scenarios gives soldiers the ability to hone tactical decision-making, improve teamwork, and acquire necessary skills. Armed services may increase their combat preparedness, cut expenses, and maintain an advantage in a security environment that is becoming more complicated and dynamic by embracing AR as a training tool.

O/70239 Maj APL Madushanka
6 SLSC(AHQ)
Dte of IT

# හයිටෙරා රිපිටර් යන්ත්‍රය සඳහා කේබලයක් නිර්මාණය කිරීම





ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුල භාවිතා කරනු ලබන VHF හයිටෙරා රිපීටර් යන්ත්‍රය IP තාක්‍ෂණයෙන් ජාල ගත කිරීමේ හැකියාව පමනක් ඇති අතර, එම IP තාක්‍ෂණය භාවිතා කිරීමේදී අයහපත් කාලගුණ තත්වයන්හිදි සංඥා සබඳතාවයන් පවත්වාගෙන යාම අසිරු කටයුත්තක් බවට පත්ව ඇති හෙයින් ඊට පිළියමක් ලෙස මෙම ඒකක ගුවන් විදුලි බලක්‍ෂණ කාර්මික ශිල්පින් විසින් IP තාක්‍ෂණයෙන් තොරව RF තාක්‍ෂණය භාවිතයෙන් රිපීටර් යන්ත්‍ර එකිනෙක ජාල ගත කිරීමේ ක්‍රමවේදයක් සකසා ඇත.

සෙ/284515 සැරයන් ගුණසිංහ පීජේආර්
10 ශ්‍රීලංසංබ (CT)

## රොබෝ තාක්ෂණය හා කෘත්‍රීම බුද්ධිය නිසා රැකියා අහිමි වෙයිද?

කෘත්‍රිම බුද්ධිය හා රොබෝ තාක්ෂණයේ වේගවත් වර්ධනය නිසා නුදුරු අනාගතයේදී මිනිස් සේවකයින්ට රැකියාව විශාල ලෙස අහිමිවී යනු ඇතැයි බොහෝ වාර්තා පලවෙනවා. මිනිසෙකු වෙනුවට, ඒ හා සමාන හැකියාවන් ඇති රොබෝවන් හෝ කෘත්‍රිම බුද්ධි මෘදුකාංග සේවයේ යෙදවීම කර්මාන්ත ශාලා හිමියන්ට ඉතාමත් වාසිදායකවේ. වැටුප් ගෙවීමට සිදු නොවීම, විඩාවට පත් නොවීම, වැරදීම් සිදු නොකිරීම, මානසික ගැටලු හේතුන් මත අකාර්යක්ෂමතාවයට පත් නොවීම ආදිය නිසා රොබෝ හා කෘත්‍රිම බුද්ධි සේවකයින්, මිනිස් සේවක සේවිකාවන්ට වඩා අතිශයෙන්ම වාසි සහගත වී ඇත.



කෙසේවෙතත් ලෝකයේ විශාලතම ශ්‍රම සැපයුම් (Manpower) සමාගමක් විසින් සිදුකරන ලද සමීක්ෂණයකදී හෙලිවී ඇති තොරතුරු වලට අනුව වැඩියෙන්ම කෘත්‍රිම බුද්ධි හා රොබෝ තාක්ෂණයන් සඳහා ආයෝජනය කරන සමාගම් සිය මිනිස් බඳවා ගැනීම්ද ඒ හා සමගම වැඩි කිරීමට සැලසුම් කර තිබෙනවා. මෙයට හේතු ලෙස සැලකෙන්නේ වඩාත් වාසි දායක ලෙස රොබෝ හා කෘත්‍රිම බුද්ධි තාක්ෂණයන් ප්‍රතිඵල ලබාගැනීමට එම රොබෝවන් හා සමග එක්ව වැඩ කිරීමට මිනිස් සේවකයින් යෙදවීම සිදුකල යුතු බවට ඇති පිලිගැනීමයි.

කොතරම් දියුණු වුවත් නූතන රොබෝ තාක්ෂණයේ සීමා තිබෙනවා. එහෙයින් රොබෝවන්ට හොඳින්ම කලහැකි කටයුතු ඔවුන්ට පවරා ඔවුන්ට කල නොහැකි කටයුතු සඳහා මිනිසුන් යොදවමින් මිනිස්-රොබෝ-කෘත්‍රිම බුද්ධි සුසංයෝගය අනාගත වැඩබිම්වලදී වඩාත් ඉහල ප්‍රතිඵල ලඟාකරදෙන බවයි නූතන කළමණාකරන විශේෂඥයින් පෙන්වා දෙනවා.

රොබෝ හා කෘත්‍රිම බුද්ධි යන්ත්‍ර හා සුසංයෝගයෙන් වැඩකිරීමට සේවක සේවිකාවන් පුහුණු කිරීම සඳහා දැනටමත් බටහිර සමාගම් විශාල ලෙස පුහුණු වැඩසටහන් නිර්මාණය කරමින් සිටිනවා. මානව සම්පත් පර්යේෂකයින්ට අනුව, රොබෝ තාක්ෂණය හා වැඩ කිරීමට අදාල නව දැනුම ඉගෙන ගැනීමට අපොහොසත්වන සේවකයින්ට රැකියා අහිමිවීමේ අවදානම ඉහල යන අතර, ඉක්මනින් එම තාක්ෂණයන් ඉගෙන ගත හැකි සේවක සේවකාවන් සඳහා දැඩි ඉල්ලුමක් ඇතිවෙමින් තිබෙනවා.

සෙ/283895 බනි 11 චමිල කුමාර එච්පීඑස් යූඑස්පී
තොරතුරු තාක්ෂණ බළඝණය
6 ශ්‍රීලංසංබ (යුහමු)

## DOPPLER RADAR යනු කුමක්ද?

ඩොප්ලර් රේඩාර් යනු දුරස්ථ වස්තූන් පිළිබඳ ප්‍රවේග දත්ත නිපදවීමට ඩොප්ලර් ආචරණය භාවිතා කරන විශේෂිත රේඩාර් වේ. එය සිදු කරනුයේ මයික්‍රෝවේව් සංඥාවක් අපේක්ෂිත ඉලක්කයෙන් ඉවතට පැනීම සහ වස්තුවේ චලිතය ආපසු පැමිණි සංඥාවේ සංඛ්‍යාතය වෙනස් කර ඇති ආකාරය විශ්ලේෂණය කිරීමෙනි. මෙම විචලනය රේඩාර් වලට සාපේක්ෂව ඉලක්කයක ප්‍රවේගයේ රේඩියල් සංරචකයේ සෘජු හා ඉතා නිවැරදි මිනුම් ලබා දෙයි. මෙය පාදක කර ගුවන් සේවා, පොලිස් රේඩාර් අනාවරක, සංචාලනය, කාලගුණ විද්‍යාව වැනි බොහෝ අංශයන් හි රේඩාර් පද්ධති සඳහා අදාළ වේ.






## STARLINK යනු කුමක්ද?



Starlink යනු ඇමරිකානු අභ්‍යවකාශ සමාගමක් වන SpaceX [3] හි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන Starlink Services" LLC විසින් මෙහෙයවනු ලබන චන්ද්‍රිකා අන්තර්ජාල තාරකා මණ්ඩලයක් වන අතර, එය රටවල් 75කට අධික සංඛ්‍යාවකට ආවරණය සපයයි. ගෝලීය ජංගම සහ බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සැපයීම එහි අරමුණයි.

SpaceX විසින් Starlink චන්ද්‍රිකා දියත් කිරීම 2019 දී ආරම්භ කරන ලදී. 2024 මාර්තු මස මුල වන විට, එය නම් කරන ලද භූමි සම්ප්‍රේෂක සමග සන්නිවේදනය කරන පහත් පෘථිවි කක්ෂයේ (LEO)[5] මහා පරිමාණයෙන් නිපදවන ලද කුඩා චන්ද්‍රිකා 6,000 කින් සමන්විත වේ. චන්ද්‍රිකා 12,000කට ආසන්න ප්‍රමාණයක් යෙදවීමට සැලසුම් කර ඇති අතර, පසුව එය 34,400 දක්වා දීර්ඝ කළ හැකිය. SpaceX විසින් 2022 දෙසැම්බර් මාසයේදී ග්‍රාහකයින් මිලියන 1කට වැඩි ප්‍රමාණයක්, 2023 සැප්තැම්බර් මාසයේදී ග්‍රාහකයින් මිලියන 2ක්, සහ 2024 මැයි මාසයේදී ග්‍රාහකයින් මිලියන 3ක් වෙත ළඟා වන බව නිවේදනය කළේය. ස්ටාර්ලින්ක් රුසියානු-යුක්රේන යුද්ධයේදී බහුලව භාවිතා කරනු ලබයි.

## SMALLSATS යනු කුමක්ද?

අභ්‍යවකාශ යානාවල ප්‍රමාණය සහ නිපදවීම සඳහා වැයවන අධික පිරිවැය වැඩි හෙයින් කුඩා අභ්‍යවකාශ යානා සහ කුඩා සැටලයිට් චන්ද්‍රිකා නිපදවීම කෙරෙහි විද්‍යාඥයන් අවධානය යොමුකරනු ලබයි ඒවායන් ප්‍රමාණය අනුව පහත සදහන් පරිදි වර්ගිකරණය කල හැක.



මිනිසැටලයිට්, කිලෝග්‍රෑම් 100-180

මයික්‍රොසැටලයිට්, කිලෝග්‍රෑම් 10-100

නැනෝ චන්ද්‍රිකා, කිලෝග්‍රෑම් 1-10

## CUBESATS යනු කුමක්ද?




CubeSats යනු සම්මත ප්‍රමාණය සහ ආකෘති සාධකය භාවිතා කරන නැනෝ චන්ද්‍රිකා පන්තියකි. සම්මත CubeSat ප්‍රමාණය සෙන්ටිමීටර 10x10x10 මනින 'එක ඒකකයක්' හෝ '1U' භාවිතා කරන අතර විශාල ප්‍රමාණවලට දිගු කළ හැකි 1.5, 2, 3, 6, සහ 12U පවා. අධ්‍යාපනය සහ අභ්‍යවකාශ ගවේෂණය සඳහා වේදිකාවක් සැපයීම සඳහා සැන් ලුයිස් ඔබිස්පෝ (කැල් පොලි) සහ ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ කැලිෆෝනියා පොලිටෙක්නික් රාජ්‍ය විශ්ව විද්‍යාලය විසින් 1999 දී මුලින් සංවර්ධනය කරන ලදී. CubeSats හි දියුණුව රජය, කර්මාන්ත සහ ශාස්ත්‍රාලිකයින් සදාකාලිකව වැඩිවන හැකියාවන් සඳහා සහයෝගීතාවයෙන් යුතුව තමන්ගේම කර්මාන්තයක් දක්වා ඉදිරියට ගොස් ඇත. CubeSats වර්ථමානයෙහි විද්‍යා විමර්ශන, නව තාක්‍ෂණ සංදර්ශන සහ තාරකා මණ්ඩල, රංචු විසංයෝජන පද්ධති භාවිතා කරමින් උසස් මෙහෙවර සංකල්ප සඳහා ලාභදායී වේදිකාවක් සපයයි.

සෙ/280371 මා/සැ පුෂ්ප කුමාර එච්පිඑම්
7 ශ්‍රීලංසංබ

# කෘත්‍රීම බුද්ධි මෙවලම් - Artificial Intelligence (AI) Tools

මිනිසා තාක්‍ෂණිකව දියුණු කළ AI (Artificial Intelligenc), එසේත් නැත්නම් කෘත්‍රිම බුද්ධිය යනු අද ලෝකයේ කතාබහට ලක්වන ප්‍රබල මාතෘකාවකි. මිනිසාගේ වැඩ කටයුතු පහසුවෙන් සහ කාර්යක්‍ෂමව කරගැනීම උදෙසා කෘත්‍රිම බුද්ධිය නිර්මාණය කළ ද, මේ වනවිට එහි වේගවත් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ධනාත්මක මෙන්ම ඍණාත්මක තත්වයන්ද ලොවට බලපා ඇත.

